වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சு

Ministry of Plantation and Community Infrastructure

ප්‍රගති වාර්තාව
முன்னேற்ற அறிக்கை
Progress Report
2025

ප්‍රගති වාර්තාව 2025

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

වැවිලි අංශය

11 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල
දුරකථනය : 011-2186160
ෆැක්ස් : 011-2186076
වෙබ් අඩවිය - http://www.plantationindustries.gov.lk

සැලසුම් අංශය
දුරකථනය : 011- 2187070 (අධ්‍යක්ෂ ජනරාල්)
ෆැක්ස් : 011 - 2187075
විද්‍යුත් තැපැල් ලිපිනය : mpiplanningdiv@gmail.com

ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා
ගරු වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා
ගරු වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා
ලේකම්
ගරු වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

පටුන	පිටු අංකය

- ❖ දැක්ම, මෙහෙවර සහ අරමුණු...VII
- ❖ හැඳින්වීම...1
- ❖ අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන.......................2
- ❖ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයපථයට අයත් වැවිලි භෝග 2
- ❖ තේ ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය ....3 - 4
- ❖ රබර් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය ....5 - 6
- ❖ පොල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය ....6 - 7
- ❖ තල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය ....8 - 9
- ❖ කිතුල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය..9
- ❖ කුරුඳු ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය 10
- ❖ පැළ නිෂ්පාදන තොරතුරු ....11 - 12
- ❖ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්වල ප්‍රගතිය ....13 - 22
- ❖ 2025 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ....23 - 33
- ❖ වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම .... 34 - 36
- ❖ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ප්‍රගතිය
  - ▪ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය .... 37 - 38
  - ▪ ශ්‍රී ලංකා තේ මණ්ඩලය ....39 - 41
  - ▪ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය ....42 - 45
  - ▪ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ....46 - 48
  - ▪ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ....49 - 50
  - ▪ රබර් පර්යේෂණ ආයතනය ....51 - 52
  - ▪ කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව..53- 54
  - ▪ ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 55
  - ▪ පොල් වගාකිරීමේ මණ්ඩලය .... 56 - 59
  - ▪ පොල් සංවර්ධන අධිකාරිය .... 60 - 63
  - ▪ පොල් පර්යේෂණ ආයතනය ....64 - 66
  - ▪ තල් සංවර්ධන මණ්ඩලය ....67 - 68
  - ▪ කිතුල් සංවර්ධන මණ්ඩලය ....69 - 71
  - ▪ ශ්‍රී ලංකා කජු සංස්ථාව ....72 - 75
  - ▪ කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය ....76 - 71
  - ▪ ජනතා වතු සංවර්ධන මණ්ඩලය .... 78 - 79
  - ▪ සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ....80 - 81
  - ▪ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව .... 82 -83
  - ▪ සී/ස ඇල්කඩුව වැවිලි සමාගම ....84 -85
  - ▪ සී/ස කුරුණෑගල වැවිලි සමාගම ....86 -88
  - ▪ සී/ස හලාවත වැවිලි සමාගම ....89 - 91
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශය
- ❖ 2025 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ....95 -101
- ❖ ප්‍රජා යටිතල පහසුකම් අංශයට අනුබද්ධ ආයතනවල ප්‍රගතිය
  - ▪ වැවිලි මානව සංවර්ධන භාරය 102
  - ▪ සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම ....103 -104
  - ▪ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය 105- 106
  - ▪ ඉන්දියානු ණය ආධාර නිවාස ව්‍යාපෘතිය 107

දැක්ම

" තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක් "

මෙහෙවර

" වැවිලි කර්මාන්තයේ තිරසරභාවය, ප්‍රවර්ධනය හා නව්‍යකරණය තුළින් අපනයන ආර්ථිකය ඉහළ නැංවීම හා වැවිලි ප්‍රජාවගේ සමාජයීය හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම "

විෂය පථය

පර්යේෂණාත්මක විධි ක්‍රමයන්, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමි උපයෝජනය හරහා ගුණාත්මක නිෂ්පාදන, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළඳපොළ ආකර්ෂණය කරගැනීම, වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඉලක්ක කරගනිමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනය උදෙසා අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් ඊට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගැනීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පසු විපරම් කිරීම.

අරමුණු

- වැවිලි ක්ෂේත්‍රයේ සමස්ත ඵලදායීතාව ඉහළ නැංවීම
- වැවිලි නිෂ්පාදන පාදක කරගත් අපනයන ආදායම ඉහළ නැංවීම
- වැවිලි ප්‍රජාව ඇතුළු අගයදාමයේ සියලු පාර්ශ්වකරුවන්ගේ සමාජ - ආර්ථික තත්වය ඉහළ නැංවීම

හැඳින්වීම

තිරසර වැවිලි ආර්ථිකයක් - පොහොසත් රටක් යන වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ දැක්ම පෙරදැරි කරගෙන වැවිලි ක්ෂේත්‍රයේ සමස්ථ ඵලදායීතාවය ඉහළ නැංවීම, වැවිලි නිෂ්පාදන පාදක කරගත් අපනයන ආදායම ඉහළ නැංවීම සහ වැවිලි ප්‍රජාව ඇතුළු අගයදාමයේ සියළු පාර්ශ්වකරුවන්ගේ සමාජ- ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම යන අරමුණු ලඟාකර ගැනීම සඳහා වැවිලි ක්ෂේත්‍රය නවමානයක් වෙත යොමුකරමින් වැවිලි ක්ෂේත්‍රයෙන් ආර්ථිකයට ලබාදෙන දායකත්වය තවදුරටත් ඉහළ නැංවීම වෙනුවෙන් 2025 වර්ෂයේදීත් අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් අමාත්‍යාංශයේ විෂය පථය හා කාර්යභාරයන් විද්‍යාත්මකව හඳුනාගෙන වර්ෂ 2024 නොවැම්බර් 25 දිනැති හා අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක වූ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, වෙනම අමාත්‍යාංශයක්ව තිබූ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයත් ඒකාබද්ධ කර වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ස්ථාපිත කර කාර්යයන් පවරනු ලැබීය.

එසේම එම අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අමාත්‍යාංශය යටතේ පැවති අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරුණි. එතෙක් සුළු අපනයන බෝගවල කාර්යසාධනය වෙනුවෙන් මෙම අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ එම ආයතනය විසින් කටයුතු කරන ලදී. එසේම පෙර පැවති රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කැබිනට් නොවන අමාත්‍යාංශයට පැවරී තිබූ රාජ්‍ය වැවිලි සමාගම් ද අමාත්‍යාංශය වෙත පැවරිණි.

ඒ අනුව අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රමුඛතා මත පදනම්ව විශේෂයෙන්ම වෙළඳපල අවශ්‍යතා හා ආර්ථික ප්‍රතිපත්ති සලකා බලා වැවිලි කර්මාන්තයේ ස්ථායිත්වය, ආදායම් ඉහළ නැංවීම හා ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීම උදෙසා සීමිත ප්‍රතිපාදන සහ සීමාකාරී සාධක මත අදාළ ප්‍රතිපත්තීන්ට අනුගතව අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතන මඟින් තේ, පොල්, රබර්, තල්, කිතුල්, කජු හා කුරුඳු යන බෝගවල කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා මෙන්ම වැවිලි ප්‍රජාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල ප්‍රතිපත්තිමය තීරණයන් ලබාදෙමින් විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

පෙර වර්ෂවල මෙන්ම 2025 වර්ෂයේදීත් රාජ්‍ය වියදම් කළමනාකරණය කරගනිමින් සියළු බෝගයන්හි කාර්යසාධනය ඉහළ නැංවීම අඛණ්ඩව පවත්වා ගැනීමට අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහිදී පර්යේෂණ කටයුතු තව දුරටත් පුළුල් කරමින් වැවිලි බෝගවල ඵලදාව වැඩිකර ගැනීමේ ක්‍රමවේද හඳුන්වාදීම, සියළු වැවිලි බෝග සම්ප්‍රදායික ප්‍රදේශවලින් බැහැරව ව්‍යාප්ත කිරීම, ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුන්වාදීම තුළින් නිෂ්පාදන වල ගුණාත්මක බව ඉහළ නැංවීම, නව තාක්ෂණික මෙවලම් හා ප්‍රශස්ත භූමි උපයෝජනය හරහා නිෂ්පාදනය වැඩිකිරීමට පියවර ගැනීම, අගය එකතු කිරීම හා විවිධාංගීකරණය තුළින් දේශීය හා විදේශීය වෙළඳපොළ ආකර්ෂණය කර ගැනීම, වැවිලි ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඔවුන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට දායකවීම හා වැවිලි ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනයට අවශ්‍ය වන ප්‍රතිපත්ති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම මෙහිලා විශේෂ කොට සැලකිය හැකිය.

මේ ආකාරයට සම්බන්ධීකරණය කරමින් වාර්ෂිකව ජාතික ආදායමට වැවිලි ක්ෂේත්‍රය තුළින් ඩොලර් මිලියන 3500-3800 ත් අතර විදේශ විනිමය ප්‍රමාණයක් ලබාදෙයි.

ඒ අනුව, 2025 වර්ෂයේදීත් භාණ්ඩාගාර ප්‍රතිපාදන, අනුබද්ධ ආයතනයන්හි අභ්‍යන්තර ඉපයීම් හා වෙනත් ප්‍රතිපාදන මූලාශ්‍ර තුළින් ලබාගත් වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය, ඒ සඳහා ඉටුකරමින් පවතින කාර්යභාරයේ ප්‍රගතිය, ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ, අනුබද්ධ ආයතනයන්හි කාර්යසාධනය හා ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ක්‍රියාකාරකම් මෙම ප්‍රගති වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

වර්ෂ 2024 නොවැම්බර් මස 25 දිනැති අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

1. ශ්‍රී ලංකා තේ මණ්ඩලය
2. තේ පර්යේෂණ ආයතනය
3. තේ රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය
4. ජනතා වතු සංවර්ධන මණ්ඩලය
5. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
6. තේ ශක්ති අරමුදල
7. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
8. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
9. සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව
10. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම
11. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
12. රබර් පර්යේෂණ ආයතනය
13. ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
14. තුරුසවිය අරමුදල
15. ශ්‍රී ලංකා කජු සංස්ථාව
16. කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය
17. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම
18. සීමාසහිත හලාවත වැවිලි සමාගම
19. පොල් වගාකිරීමේ මණ්ඩලය
20. පොල් සංවර්ධන අධිකාරිය
21. පොල් පර්යේෂණ ආයතනය
22. තල් සංවර්ධන මණ්ඩලය
23. කිතුල් සංවර්ධන මණ්ඩලය
24. කප්රුක අරමුදල
25. කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව
26. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය
27. වැවිලි මානව සංවර්ධන භාරය
28. සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
29. වතු අංශයේ ස්වයං රැකියා චක්‍රීය අරමුදල

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වැවිලි බෝග

තේ, පොල්, රබර්, තල්, කිතුල්, කජු හා කුරුඳු යන ප්‍රධාන වැවිලි බෝග සහ සුළු බෝග මෙම අමාත්‍යාංශයීය විෂය පථයට අයත් වන අතර, 2024.11.25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශයීය විෂය පථයට අයත්ව තිබූ කරාබු, කෝපි, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් ආදී සුළු අපනයන බෝග 15 ක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයීය විෂය පථයට අයත් වේ.

තේ ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය	ඉලක්ක 2025	ප්‍රගතිය 2024.08.31 දිනට	ප්‍රගතිය 2025.08.31 දිනට	ඉලක්ක 2026
තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.)	267	172	177	273
අපනයන ආදායම (රු.බිලි.)	439	288	307	444
අපනයන ආදායම (ඇ.ඩො. බිලි)	1.48	0.9	1.02	1.5
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.)	250	163	174	253
කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු./ කි.ග්‍රෑ)	-	1,250	1,156	-

තේ නිෂ්පාදනය

❖ උන්නතාංශ අනුව තේ නිෂ්පාදනය

උන්නතාංශය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා (කි.ග්‍රෑ.මිලි)		වෙනස (%)
	2024	2025	
උඩරට තේ	37	38	3
මැදරට තේ	32	33	4
පහතරට තේ	104	106	2
මුළු නිෂ්පාදනය	**172**	**177**	**3**

❖ ප්‍රධාන තේ නිෂ්පාදන ක්‍රමවේදයන් අනුව තේ නිෂ්පාදනය

විස්තරය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා (කි.ග්‍රෑ. මිලි)		වෙනස (%)
	2024	2025	
පාරම්පරික තේ	156	159	2
සී.ටී.සී තේ	15	16	3
හරිත තේ	1	2	5
එකතුව	**172**	**177**	**3**
ක්ෂණික තේ *	2.0	2.3	11

* මුළු තේ නිෂ්පාදනය තුළ ක්ෂණික තේ ඇතුලත් නැත.

❖ කොළඹ තේ වෙන්දේසි දත්ත (2025 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා)

වර්ෂය	උඩරට තේ		මැදරට තේ		පහතරට තේ		වෙනත්		සියලු උන්නතාංශ	
	ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	මිල (රු./ කි.ග්‍රෑ)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	මිල (රු./ කි.ග්‍රෑ)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	මිල (රු./ කි.ග්‍රෑ)	ප්‍රමාණය (කි.ග්‍රෑ.ම)	මිල (රු./ කි.ග්‍රෑ)	ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	මිල (රු./ කි.ග්‍රෑ)
2024	39.01	1,152	31.64	1,085	103.61	1,338	0.04	695	174.29	1,250
2025	38.96	1,074	33.75	1,022	107.86	1,228	0.02	692	180.59	1,156

❖ තේ වෙළඳපොළ දත්ත

විස්තරය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා		වෙනස	
	2024	2025	ප්‍රමාණය	(%)
අලෙවි කරන ලද මුළු තේ ප්‍රමාණය (කි.ග්‍රෑ.මි)	174.29	180.59	6.3	4
තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු.)	1,250	1,156	(94)	(7)

❖ ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල සඳහා 2024 අගෝස්තු 31 හා 2025 අගෝස්තු 31 දක්වා වර්ෂවල අපනයන ප්‍රමාණය

ප්‍රධාන රටවල්	ජනවාරි සිට ජුනි 30				වෙනස	
	2024		2025			
	ප්‍රමාණය (මෙ.ටො)	මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%)	ප්‍රමාණය (මෙ.ටො)	මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%)	ප්‍රමාණයවෙනස (මෙ.ටො)	ප්‍රතිශත වෙනස %
ඉරාකය	21,199	13.04	26,010	14.92	4,811	22.69
රුසියාව	16,518	10.16	14,750	8.46	(1,769)	(10.71)
ලිබියාව	4,836	2.97	14,398	8.26	9,562	197.73
එ.අරාබි එමීර් රාජ්‍යය	15,811	9.73	12,722	7.30	(3,089)	(19.54)
තුර්කිය	12,206	7.51	12,495	7.17	289	2.37
ඉරානය	7,877	4.85	8,314	4.77	437	5.55
චිලී	5,620	3.46	7,712	4.42	2,092	37.22
චීනය	8,112	4.99	6,831	3.92	(1,280)	(15.79)
අසර් බයිජානය	6,821	4.20	5,964	3.42	(857)	(12.57)
සෞදි අරාබිය	5,989	3.68	5,849	3.36	(140)	(2.33)
සිරියාව	5,161	3.17	5,496	3.15	334	6.48
ජර්මනිය	4,687	2.88	4,741	2.72	54	1.15
ඇමරිකා එක්සත් ජනපදය	4,257	2.62	4,319	2.48	62	1.45
ජපානය	3,082	1.90	3,750	2.15	668	21.67
ජොර්දානය	3,224	1.98	3,742	2.15	518	16.07
තායිවානය	2,924	1.80	2,626	1.51	(298)	(10.20)
පෝලන්තය	2,654	1.63	2,465	1.41	(189)	(7.13)
හොංකොං	2,271	1.40	2,046	1.17	(225)	(9.90)
බෙල්ජියම	1,792	1.10	2,044	1.17	253	14.10
අයර් ලන්තය	1,416	0.87	1,750	1.00	334	23.57
ප්‍රධාන 20 හි එකතුව	**136,455**	**83.94**	**148,022**	**84.93**	**11,567**	**8.48**
අනෙකුත් එකතුව	**26,106**	**16.06**	**26,269**	**15.07**	**164**	**0.63**
මුළු එකතුව	**162,561**	**100.00**	**174,292**	**100.00**	**11,730**	**7.22**

රබර් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය	ප්‍රගතිය		ඉලක්ක	
	2024 ජනවාරි සිට අගෝස්තු **31** දක්වා	**2025** ජනවාරි සිට අගෝස්තු **31** දක්වා	**2025**	**2026**
නිෂ්පාදන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.)	49.2	46.2***	71	73
ඵලදායිතාවය (හෙක්./කි.ග්‍රෑ)	1,214*	1,267**	1,267	1,321
අපනයන ආදායම (රු.බිලි.)	207.8	190.95	306	310
නැවත වගාව (හෙක්.)	98.25	148.59	230	300
නව වගාව (හෙක්.)	22.91	58.01	390	700

* වර්ෂය සඳහා ගණනය කළ අගයන් දක්වා ඇත

** 2025 සඳහා ඇස්තමේන්තුගත අගයක් භාවිතා කරයි.

*** මෙම අගය යාවත්කාලීන වේ

❖ **රබර් නිෂ්පාදනයේ වර්ගීකරණය**

විස්තරය	**2024** ජනවාරි සිට අගෝස්තු **31** දක්වා	**2025** ජනවාරි සිට අගෝස්තු **31** දක්වා
ෂීට් රබර්	23,150	22,689
සෝල් ක්‍රේප්	415	468
ස්ක්‍රැප්	2,956	2,772
ලේටෙක්ස් ක්‍රේප්	3,734	4,099
TSR	8,891	7,182
ලේටෙක්ස් සහ වෙනත්	10,127	8,993

❖ **කොළඹ රබර් වෙන්දේසි මිල**

රබර් වර්ගය	ආර්.එස්.එස් (දුම් ගැසූ) රබර් සඳහා වාර්තා වූ මිල		
	2024 ජනවාරි සිට අගෝස්තු **31** දක්වා (කි.ග්‍රෑ./රු.)	**2025** ජනවාරි සිට අගෝස්තු **31** දක්වා (කි.ග්‍රෑ./රු.)	වෙනස (%)
ආර්.එස්.එස් 1	681.05	714.17	5%
ආර්.එස්.එස් 2	653.50	680.50	4%
ආර්.එස්.එස් 3	650.67	670.00	3%
ආර්.එස්.එස් 4	629.83	ඉදිරිපත්වී නැත	-
ආර්.එස්.එස් 5	625.63	ඉදිරිපත්වී නැත	-

❖ ස්වාභාවික රබර් අපනයනය

වර්ගය	ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා (මෙ.ටො.)	
	2024 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා	**2025** ජනවාරි සිට අගෝස්තු 31 දක්වා
ෂීට් රබර්	1,658	1,536
සෝල් ක්‍රේප්	395	446
ලේටෙක්ස් ක්‍රේප්	3,112	3,416
TSR	331	477
ලේටෙක්ස් සහ වෙනත්	270	139
එකතුව	**5,766**	**6,014**

පොල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය	වර්ෂ 2025 ඉලක්ක	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා ප්‍රගතිය	2026 වර්ෂයේ ඉලක්ක
පොල් අස්වැන්න (ගෙඩි මිලි.)	2,851	1,923	3,000
අපනයන ආදායම (රු.බිලි.)	330	232	360
පොල් පැළ නිෂ්පාදනය (පැළ මිලි.)	2.5	2.54	2.5
නව වගාව (හෙක්.)	7,495	3,359	7,495
නැවත වගාව (හෙක්.)	285	112	285
යටි වගාව (හෙක්.)	1,580	1,365	1,580
ගෙවතු වගාව (පැළ)	1,043,600	489,688	1,045,000

❖ අස්වැන්න

විස්තරය	වර්ෂය				
	2021	**2022**	**2023**	**2024**	**2025.08.31**
පොල් අස්වැන්න (ගෙඩි මි.)	3,120	3,391	3,169	2,792	1,923

❖ අපනයන ආදායම

නිෂ්පාදන වර්ගය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා (රු.මි./ඇ.ඩො.මි.)					
	2024		2025		වර්ධනය %	
	රු.මි.	ඇ.ඩො.මි.	රු.මි.	ඇ.ඩො.මි.	රු.	ඇ.ඩො.
පොල් මද ආශ්‍රිත	90,443.96	296.25	136,457.72	456.28	51	54
කෙඳි	3,864.07	12.62	3,058.22	10.24	-21	-19
කෙඳි නිමි නිෂ්පාදන	44,491.80	145.78	53,636.95	179.54	21	23
කටු ආශ්‍රිත නිෂ්පාදන	31,976.01	104.57	38,426.44	128.58	20	23
වෙනත්	865.14	2.84	912.15	3.05	5	8
එකතුව	**171,640.98**	**562.06**	**232,491.48**	**777.69**	**35**	**38**

❖ ප්‍රධාන නිෂ්පාදන කිහිපයක අපනයනය උච්ඡාවචනය වීම

නිෂ්පාදන වර්ගය	ප්‍රමාණය (මෙ.ටො.)		ආදායම			
	2024 ජනවාරි- අගෝස්තු 31	2025 ජනවාරි- අගෝස්තු 31	2024 ජනවාරි- අගෝස්තු 31		2025 ජනවාරි- අගෝස්තු 31	
			රු.මි.	ඇ.ඩො.මි	රු.මි.	ඇ.ඩො.මි
පොල් තෙල් (මෙ.ටො.)	4,777	5,853	3,347.49	10.93	7,592.73	25.38
පිරිසිදු පොල් තෙල් (මෙ.ටො.)	11,252	10,614	12,792.03	41.93	20,269.71	67.79
පොල් වතුර (මෙ.ටො.)	22,742	31,948	5,879.12	19.24	8,092.59	27.08
තැඹිලි (ගෙඩි) ‘000	5,357	6,078	1,388.27	4.53	1,594.16	5.33
අමු පොල් (ගෙඩි) ‘000	11,285	9,157	1,512.78	4.94	1,430.39	4.78
බ්‍රිස්ටල් කෙඳි (මෙ.ටො.)	1,237	875	428.89	1.40	276.10	0.92

❖ පොල් මිල

වර්ගය	ඒකකය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා		වෙනස %
		2024	**2025**	
වෙන්දේසි (කොළඹ)	ගෙඩි 1000ක සාමාන්‍ය මිල රුපියල්	75,446	144,306	91
තොග - විශාල ප්‍රමාණයේ		103,861	187,125	80
- කුඩා ප්‍රමාණයේ		88,128	163,032	85
සිල්ලර - විශාල ප්‍රමාණයේ	ගෙඩියක සාමාන්‍ය මිල රුපියල්	118	209	78
- කුඩා ප්‍රමාණයේ		98	183	86

තල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

නිෂ්පාදන වර්ගය	2024 වාර්ෂික	2024-2025 ජනවාරි සිට සැප්තැම්බර් 31 දක්වා		ඉලක්ක
		2024	2025	2026
හකුරු (මෙ.ටො.)	58	48.05	56.63	60
තල් රා (ලීටර්)	10,592,000	9,358,762	7,490,081.66	8,000,000
පල්ප (මෙ.ටො.)	46,834	34,261	52,736	60,000
තල් අල (මෙ.ටො.)	336	330	358.2	360
තල්කෙඳි (මෙ.ටො.)	45	31.9	45.42	50
අත්කම් (රු.මි.)	49.5	41.90	53.33	60
පනාටු (මෙ.ටො.)	6.8	3.4	4.37	5.0
තල් අරක්කු(බෝතල්)	26,000	21,605	21,527	25,000
දැව (නො)	5,748	3,480	2,400	3000

❖ තල් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලුණු සංඛ්‍යාව

විස්තර			වාර්ෂික ප්‍රගතිය	
			2024	2025.09.30
තල් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ප්‍රතිලාභීන් සංඛ්‍යාව	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන	මදින්නන්	2920	2900
		කාර්මිකයන්	23	23
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)	නිෂ්පාදකයන්	2208	2500
		කණ්ඩායම්	50	52
	අල ආශ්‍රිත නිෂ්පාදන	නිෂ්පාදකයන්	2435	2500
		කණ්ඩායම්	-	-
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන	නිෂ්පාදකයන්	475	500
		කණ්ඩායම්	27	29
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන		18	18
	ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි)		40	45

- තල් ක්ෂේත්‍රයේ අපනයන ආදායම

විස්තර		වාර්ෂික ප්‍රගතිය (රු.මි.)	
		2024	2025.09.30
දේශීය ආදායම්	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන	62.9	59.8
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)		
	අල ආශ්‍රිත නිෂ්පාදන		
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන		
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන		
	දැව ආශ්‍රිත නිෂ්පාදන		
	ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි)		
අපනයන ආදායම්	රා/ මී රා ආශ්‍රිත නිෂ්පාදන	71.15	92.4
	කොළ ආශ්‍රිත නිෂ්පාදන (අත්කම්)	-	-
	අල ආශ්‍රිත නිෂ්පාදන	17.23	0.46
	යුෂ ආශ්‍රිත නිෂ්පාදන	1.90	3.56
	කෙඳි ආශ්‍රිත නිෂ්පාදන	123.02	350.15
	ආහාරමය නිෂ්පාදන (බීම වර්ග හා රස කැවිලි)	8.86	24.84

කිතුල් ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය		වර්ෂ 2024		ඉලක්ක	
		ඉලක්ක	සත්‍ය	2025	2026
අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.)	කිතුල් පැණි	105,000	85,745	97,717	106,428
	කිතුල් හකුරු	227,000	249,324	274,902	304,272
අපනයන ආදායම (රු.මිලි.)		425	380	413	459
අපනයන ආදායම (ඇ.ඩො.මිලි.)		1.31	1.30	1.40	1.56

**2025 හා 2026 වර්ෂ සඳහා අපනයන ආදායම් ඉලක්ක ඇ.ඩො.මිලි. බවට පත් කිරීමේ දී 2025.03.04 දිනට ශ්‍රී ලංකා මහා බැංකුව විසින් ප්‍රකාශිත විනිමය අනුපාතයන් භාවිත කර ඇත.

කුරුඳු ක්ෂේත්‍රයේ සමස්ත ප්‍රගතිය

විස්තරය	ඉලක්ක 2025	ප්‍රගතිය 2024.08.31 දිනට	ප්‍රගතිය 2025.08.31 දිනට	ඉලක්ක 2026
කුරුඳු නිෂ්පාදනය (කි .ගෑ.මිලි.)	26	15.52	15.08	28
අපනයන ආදායම (රු.මිලි.)	75,000	37,553	45,150	80,000
අපනයන ආදායම(ඇ.ඩො.මිලි)	260	124	150	300
අපනයන ප්‍රමාණය (කි.ගෑ.රු.මිලි.)	22	11.34	11.51	23
කුරුඳුවල සාමාන්‍ය අලෙවි මිල(රු./කි.ග්‍රෑ)	4,000	3,000	3,500	4,500

- **කුරුඳු නිෂ්පාදනයේ වර්ගීකරණය**

නිෂ්පාදන වර්ගය	ජනවාරි සිට අගෝස්තු 31 දක්වා (මෙ.ටො.)	
	2024	**2025**
කුරුඳු පොතු ආශ්‍රිත නිෂ්පාදන	11,347	11,364
කුරුඳු කොළ තෙල්	162.32	141.7
කුරුඳු පොතු තෙල්	16.18	13.5
එකතුව	**11,525**	**11,520**

- **කුරුඳු අපනයනය කරනු ලබන රටවල් හා ඊට අදාල තොරතුරු**

රට	ජනවාරි සිට ජුනි 30 දක්වා				වෙනස	
	2024		**2025**			
	ප්‍රමාණය (මෙ.ට)	මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%)	ප්‍රමාණය (මෙ.ට)	මුළු අපනයනයෙන් ප්‍රතිශතය (%)	ප්‍රමාණය (මෙ.ටො.)	කි.ග්‍රෑ. මිල (ඇ.ඩො)
මෙක්සිකෝ	2,415.6	33.2	1,860	24.7	-555.6	14.27
කොලොම්බියාව	452	6.2	388	5.1	-64.0	13.13
ඇමරිකා එක්සත් ජනපදය	793.4	10.9	1395	18.5	601.6	13.43
ගෝතමාලාව	262.4	3.6	252	3.3	-10.4	15.30
ඉන්දියාව	357	4.9	545	7.2	188.0	8.51
ඉක්වදෝරය	293.7	4.0	306	4.1	12.3	12.72
බොල්වියාව	224.8	3.1	306	4.1	81.2	12.30
පේරු	811.7	11.2	568	7.5	-243.7	12.29

පැළ නිෂ්පාදන තොරතුරු

- **ශ්‍රී ලංකා තේ මණ්ඩලය**

ප්‍රදේශය	2025 ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය (පැළ)	2026 ඉලක්කය (පැළ)
ගම්පොළ	1,400,000		1,400,000
නුවරඑළිය	1,350,000		1,350,000
රත්නපුර	3,100,000		3,100,000
බණ්ඩාරවෙල	650,000		650,000
මාතර	3,050,000		3,050,000
බදුරලිය	1,850,000		1,850,000
ගාල්ල	2,250,000		2,250,000
එකතුව	**13,650,000**		**13,650,000**

- **කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

තවාන් වර්ගය	2025 පැළ ඉලක්කය (මි.ලි.)	2025.09.30 දිනට පැළ ප්‍රගතිය (මි.ලි.)	2026 ඉලක්කය පැළ (මි.ලි.)
ආයතනික තවාන්	1	0.9	0
ලියාපදිංචි වාණිජ තවාන්	45	45	45
එකතුව	**46**	**45.9**	**46**

- **රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**

පැළ තවාන (ස්ථානය)	2025 ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය (පැළ)	2026 ඉලක්කය (පැළ)
වැලිකඩමුල්ල	30,000	36,064	39,000
මීරිගම	45,000	25,351	75,900
ඇහල්ඔය	32,400	21,982	48,750
ගුරුගොඩ	22,600	23,551	38,500
කරපිංච	27,000	20,606	50,000
කුඹුක්කන	81,700	43,133	162,800
පදියතලාව	80,300	12,410	95,700
මිද්දෙණිය	21,600	20,559	86,850
එකතුව	**340,600**	**203,656**	**597,500**

- **පොල් පර්යේෂණ ආයතනය**

පැළ තවාන (ස්ථානය)	2025 ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය (පැළ)	2026 ඉලක්කය (පැළ)
බණ්ඩිරිප්පුව ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය	24,000	25,757	30,000
රත්මලාගාර පර්යේෂණ මධ්‍යස්ථානය	28,000	16,250	25,000
පොත්තුකුලම පර්යේෂණ මධ්‍යස්ථානය	15,000	6,500	10,000
මාකඳුර පර්යේෂණ මධ්‍යස්ථානය	15,000	12,046	20,000
වල්පිට පර්යේෂණ මධ්‍යස්ථානය	25,000	13,550	25,000
තබ්බෝව පර්යේෂණ මධ්‍යස්ථානය	22,000	14,920	20,000
මිද්දෙණිය පර්යේෂණ මධ්‍යස්ථානය	25,000	25,868	30,000
අඹකැලේ ජාන සම්පත් මධ්‍යස්ථානය	30,000	21,578	25,000
පල්ලම ජාන සම්පත් මධ්‍යස්ථානය	50,000	25,026	40,000
මාදුරුඔය ජාන සම්පත් මධ්‍යස්ථානය	6,000	4,361	5,000
එකතුව	**240,000**	**165,856**	**230,000**

- **පොල් වගාකිරීමේ මණ්ඩලය**

දිස්ත්‍රික්කය	2025 ඉලක්කය	2025.09.30 දිනට නිෂ්පාදනය කර ඇති පැළ ප්‍රමාණය	2026 ඉලක්කය (පැළ)
මොණරාගල			
බදුල්ල	118,380	118,491	80,000
මාතර	20,830	-	8,000
කුරුණෑගල	353,735	447,862	305,000
කෑගල්ල	61,765	134,059	99,000
ගම්පහ	117,300	115,132	120,000
කළුතර			
කොළඹ	65,960	56,783	73,000
පුත්තලම	153,044	185,638	258,000
රත්නපුරය	74,840	54,040	75,000
හම්බන්තොට	68,260	76,017	115,000
අනුරාධපුරය	106,970	106,671	110,000
ත්‍රිකුණාමලය	46,866	117,792	25,000
පොළොන්නරුව	46,330	146,292	35,000
අම්පාර	66,540	123,573	46,000
මාතලේ	58,680	73,583	35,000
ගාල්ල	52,580	53,419	55,000
මඩකලපුව	48,650	153,326	28,500
යාපනය			
කිලිනොච්චිය	680,000	404,714	600,000
මුලතිව්			
වව්නියාව	320,000	100,692	400,000
මන්නාරම			
මහනුවර	39,270	74,459	32,500
නුවරඑළිය			
එකතුව	**2,500,000**	**2,542,543**	**2,500,000**

- **ශ්‍රී ලංකා කජු සංස්ථාව**

පැළ තවාන	2025 ඉලක්කය(පැළ)		2025.09.30 දිනට ප්‍රගතිය		2026 ඉලක්කය(පැළ)	
	බද්ධ පැළ	බීජ පැළ	බද්ධ පැළ	බීජ පැළ	බද්ධ පැළ	බීජ පැළ
කමන්දළුව තවාන	25,000	-	6,000	-		-
මිහින්තලාව තවාන	25,000	-	-	-		-
මංගලගම තවාන	-	-	-	-		-
මහියංගණය තවාන	-	-	-	-	2,750,00	-
චන්ද්‍රිකාවැව තවාන	-	-	-	-		-
දඹුල්ල තවාන	-	-	-	-		-
කුඹුක්කන තවාන	-	-	-	-		-
හාඩි තවාන	-	-	-	-		-
එකතුව	**50,000**		**6,000**		**2,750,00**	

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය (වැවිලි අංශය) මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘතිවල 2025.09.30 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය : වැවිලි අංශයේ කැඩැස්තර මිනුම් කටයුතු ලකුණු කිරීම	
ක්‍රියාත්මක අංශය : වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය	**වැය ශීර්ෂය : 135-2-17-002-2507** **අනුමත ප්‍රතිපාදන (රු.මි.) : 110.00**
මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	**භෞතික ප්‍රගතිය**
24.16	මේ වන විට මැනීම් කටයුතු ආරම්භකර ඇත. වතු හතරක මැනීම් කටයුතු අවසන් කර ඇත.

ව්‍යාපෘතියේ නම : රබර් මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම		
ක්‍රියාත්මක අංශය : රබර් සහ කුරුඳු සංවර්ධන අංශය		**වැය ශීර්ෂය : 135-2-17-005-2509** **අනුමත ප්‍රතිපාදන (රු.මි.) : 5.00**
ව්‍යාපෘතියේ නම	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**	**භෞතික ප්‍රගතිය**
රබර් අස්වනු නෙලීමේ සහයකයින්ගේ රබර් වගා පිළිවෙත් නිර්දේශ පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම.	0.31	▪ වැසි ආවරණ සම්බන්ධව ප්‍රායෝගික වැඩමුළුව අවසන් කර ඇත.රබර් වගාව ආශ්‍රිත රෝග පිළිබඳව වැඩමුළුව අවසන් කර ඇත.ගුණාත්මක කිරි කැපීම පිළිබඳ ප්‍රායෝගික වැඩමුළුව ආරම්භ කර ඇත.
වැසි ආවරණ සවි කිරීම සඳහා රබර් පර්යේෂණායතනයේ සහතිකලත් කාර්මික ශිල්පීන් හඳුන්වාදීම		▪ වැසි ආවරණ සවි කිරීම පිළිබඳ තාක්ෂණික නිලධාරීන්ගේ දත්ත පද්ධතිය සැකසීම අවසන්කර ඇත. වැසි ආවරණ සම්බන්ධව ප්‍රායෝගික වැඩමුළුව අවසන් කර ඇත.
සම්ප්‍රදායික නොවන රබර් වගා කරන ප්‍රදේශ වලින් උප ප්‍රශස්ත දේශගුණික තත්වයන්ට ඔරොත්තු දිය හැකි තිරසාර රබර් ක්ලෝන හඳුනා ගැනීම.	1.00	▪ රු.මි. 2.31ක ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ සඳහා මිලදී ගැනීමේ අයදුම්පත් යවා ඇත. ක්ලෝන 15ක ශාක වර්ධන සාධක ලබා ගැනීම සහ රෝග හඳුනා ගැනීම සිදුකර ඇත. ක්ලෝන තුනක දළ රබර් විශ්ලේෂන සිදුකරන ලදී.

ව්‍යාපෘතියේ නම : පොල් වගාවේ රෝග පාලනය හා මර්ධන වැඩසටහන.		
ක්‍රියාත්මක අංශය : පොල් වගා කිරීමේ මණ්ඩලය **පොල් පර්යේෂණ ආයතනය** **මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**		**වැය ශීර්ෂය : 135-2-17-003-2507** **අනුමත ප්‍රතිපාදන (රු.මි.): 84.00**
ව්‍යාපෘතියේ නම	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**	**භෞතික ප්‍රගතිය**
වැලිගම පොල් කොළ මැලවීමේ රෝග මර්ධන වැඩසටහන	32.24	▪ රෝගී ගස් හඳුනා ගැනීම හා සළකුණු කිරීම - 10,008 ▪ රෝගී ගස් එන්නත් කිරීම - 760 ▪ වන්දි ගෙවූ ගස් ගණන- 2,707

බ්‍රොන්ටිස්පා කෘමි හානිය පාලනය	1.24	▪ රෝගී ගස් 1921 හඳුනාගෙන සළකුණු කර ඇති අතර මොනොක්‍රොටපස් යෙදීම සිදුකරමින් පවතී. පුහුණු වැඩසටහන් 9ක් පවත්වා ඇත.
පොල් වගාවේ සුදු මැස්සා හානිය පාලනය කිරීම	1.17	▪ රෝගී ගස් 59,341 හඳුනාගෙන කොහොඹ තෙල් යෙදීම සිදුකරනු ලැබේ.
ව්‍යාපෘතියේ නම : කප්රුක අරමුදල		
ක්‍රියාත්මක ආයතනය : **කප්රුක අරමුදල කළමනාකරණ මණ්ඩලය**		**වැය ශීර්ෂය :** 135-2-17-004-2202 **අනුමත ප්‍රතිපාදන (රු.මි.) : 20.00**
ව්‍යාපෘතියේ නම	**මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**	**භෞතික ප්‍රගතිය**
පොල් ආශ්‍රිත අව්ධිමත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාන කර්මාන්තවල ව්‍යවසායකයින්ට ආයෝජන ප්‍රාග්ධනය ලබා දීම වැඩසටහන යටතේ ණය ප්‍රාග්ධනය ලබාදීම හා ව්‍යාපෘති මූලික පරීක්ෂණ, පසුවිපරම් කිරීම, නියාමනය.	2.25	▪ පොල් ආශ්‍රිත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 10 කට ණය ප්‍රාග්ධන ලබා දීම. ▪ ව්‍යාපෘති මූලික පරීක්ෂණ, පසුවිපරම් 345 ක් සිදු කිරීම
කුඩා හා ක්ෂුද්‍ර ව්‍යවසායක නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම	1.63	▪ ප්‍රදර්ශන 2ක් සඳහා දායකත්වය ලබා දීම. ▪ පොල් කර්මාන්ත 2500 ක් සමීක්ෂණය කර ඇත.
පොල් ආශ්‍රිත කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත පිළිබඳ තාක්ෂණික දැනුම හා නිපුනතාවන් ඉහළ නැංවීම හා යාවත්කාලීන කිරීම.	0.40	▪ පුහුණු වැඩසටහන් හා පරීක්ෂාවන් 20 ක් සිදුකිරීම. ▪ සේවා මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම.
කුඩා පොල් ඉඩම් ඒකකවල ඵලදායිතා වැඩිදියුණු කිරීම සහ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ණය ප්‍රාග්ධනය ලබාදීම හා ව්‍යාපෘති මූලික පරීක්ෂණ සහ පසුවිපරම් කිරීම.	1.92	▪ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති 9ක් සිදු කිරීම. ▪ ව්‍යාපෘති අධීක්ෂණ 365
කුඩා පරිමාණ පොල් ඉඩම් හිමියන්ගේ ඉඩම් කළමණාකරණය හා තාක්ෂණික භාවිතයන් පිළිබඳ දැනුම ඉහළ නැංවීම හා යාවත්කාලීන කිරීම	0.20	▪ පුහුණු වැඩසටහන් 10ක් සිදුකිරීම.
කප්රුක සමිති බලගැන්වීම මඟින් ඒවායේ කාර්ය සාධනය හා ප්‍රජා සහභාගීත්වය ඉහළ නැංවීම, ශක්තිමත් කිරීම, විධිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම.	1.98	▪ කප්රුක සමිති පරීක්ෂණ හා ඇගයීම් පරීක්ෂණ, 1,300 ක් පුහුණු සහ ධාරිතා වැඩසටහන් 7ක්, නව සමිති 18 ක් ඇති කිරීම.
කප්රුක සමිති බලගැන්වීම වැඩසටහන යටතේ කප්රුක උදාන ග්‍රාමීය වැඩසටහන	1.20	▪ කප්රුක උදාන වැඩසටහන් 6ක් පැවැත්වීම.
කප්රුක අරමුදලේ නිලධාරීන්ගේ දැනුම ආකල්ප කුසලතා ඉහළනැංවීම හා ධාරිතා සංවර්ධනය තුලින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම.	0.00	▪ මූලික කටයුතු සිදු කරමින් පවතී.

නිලධාරීන්ගේ කාර්යය සාධන ඇගයීම් හා අභිප්‍රේරණ වැඩසටහන් පැවැත්වීම.	0.00	▪ මූලික කටයුතු සිදු කරමින් පවතී.
කළමනාකරණ තොරතුරු පද්ධති සංවර්ධනය හා සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන	0.00	▪ මූලික කටයුතු සිදු කරමින් පවතී.
සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය, අධීක්ෂණය සහ ඇගයීම, මෙහෙයුම් වියදම්	1.92	▪ ප්‍රගති සමාලෝචන 43 ක් පැවැත්වීම.

ව්‍යාපෘතිය	**අනුමත ප්‍රතිපාදන (රු.මි)**	**මූල්‍ය ප්‍රගතිය (රු. මි.)**	**භෞතික ප්‍රගතිය**
වැවිලි අංශයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති (රු.මි. – 469.4)			
තේ ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - තේ පර්යේෂණ ආයතනය			
දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කල බීජ නිපදවීමට බීජ උද්‍යාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය (2021 - 2025)	0.95	0.62	• වල් නෙළීම සහ උද්‍යානය ප්‍රශස්ත තත්වයෙන් පවත්වා ගැනීමට අවශ්‍ය වන නඩත්තු කටයුතු -60% ▪ නියමිත කාල පරාස වලදී පොහොර යෙදීම හා අවශ්‍ය අවස්ථාවන්හිදී කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීම - 65% ▪ නියඟ තත්වයන් / වියලි කාලගුණික තත්වයන් තුළ දී ජල සම්පාදන කටයුතු සිදුකිරීම - 75%
නව තේ ප්‍රභේදවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් අතර බෙදා හැරීමට වගාවන් හි වපසරිය (Mother Bush Area) වැඩි කිරීම (2022-2027)	18.5	11.11	▪ ස්ථාපනය කර ඇති නව මව් වගා භූමි ප්‍රමාණය හෙක්ටයාර 6 ක් වේ. ▪ හෙක්ටයාර 11.5 ක පමණ භූමි ප්‍රමාණයක පුනරුත්තාපන තෘණ වගා කර නව හෙක්ටයාර 2.5 ක වගා කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ▪ ස්ථාපනය කරන ලද හෙක්ටයාර 4 ක පමණ මව් වගා භූමිවල නඩත්තු කටයුතු සිදුකිරීම.
තේ පැළවල කෙටි කාලීන නියඟ ආතතියට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ශාක-පාදක ද්‍රව්‍ය නිෂ්පාදනයකර සංවර්ධනය කිරීම (2025-2027)	4.95	0.168	▪ නවීන වූ නිස්සාරණ ක්‍රියාපටිපාටිය දැනට සිදුවෙමින් පවතී. එයට අමතරව පාලිත පාරිසරික ආශ්‍රිත තත්වයන් යටතේ පරීක්ෂණයන් අවසන් කර ඇත. දත්ත විශ්ලේෂණය දැනට සිදුවෙමින් පවතී.

ශාක පෝෂ්‍ය මූල ද්‍රව්‍යවල නැනෝ අංශු වලින් පොහොසත් ජෛව අඟුරු සංකීර්ණ පිළිබඳ විමර්ශනය සහ ඒවා මඟින් තේ පැළ වර්ධනයට සහ පසෙහි ගුණාත්මක භාවයට වන බලපෑම් පිළිබඳ විමර්ශන සිදු කිරීමේ ව්‍යාපෘතිය (2025 - 2029)	26.40	0.00	▪ සෙවණ ශාක කප්පාදු අතු, භාවිතයෙන් ඉවත්කළ තේ සහ තේ කප්පාදු අතු අමුද්‍රව්‍ය ලෙස යොදා ජෛව අඟුරු නිපදවීමේ ක්‍රමවේදය අත් හදා බැලීම් 3 ක් සිදුකොට ඇත. ▪ ඉදිරි සංවර්ධන කටයුතු සිදුකරගෙන යාම සඳහා අවශ්‍ය විද්‍යාගාර භාණ්ඩ මිල ගණන් කැඳවා ඇත. ▪ ජෛව අඟුරු නිපදවීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම් සහ නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණයන් සිදුකරන ලදී.
තේ වතුවල ඵලදායිතාව ඉහළ නැංවීමට ස්වභාවධර්මය මත පදනම් වූ විසඳුමක් සහ දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා උපාය මාර්ගයක් ලෙසත් පාංශු සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පාංශු සංශෝධනයක් ලෙස ජීව අඟුරු (Bio char) භාවිතය (2025 – 2027)	10.20	0.65	▪ සෙවන ශාක කප්පාදු අතු, භාවිතයෙන් ඉවත්කළ තේ සහ තේ කප්පාදු අතු අමුද්‍රව්‍ය ලෙස යොදා ජෛව අඟුරු නිපදවීමේ ක්‍රමවේදය අත් හදා බැලීම් 3 ක් සිදුකොට ඇත. ▪ ජෛව අඟුරු නිපදවීම පිළිබඳ වැඩිදුර සොයාබැලීම් සහ නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණයන් සිදුකරන ලදී.
රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සිදු කරන ප්‍රදේශයන්හි නෙමටෝඩා පලිබෝධ (වට පණුවන්) පැතිරීමේ ප්‍රවණතාවය හඳුනා ගැනීම සඳහා වන සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම.	3.98	0.00	▪ අන්වීක්ෂය මිලදී ගැනීමට මිල ගණන් කැඳවා ලංසු ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත.
ඕතඩොක්ස් රෝලරය සඳහා රෝලිං පරාමිතීන් නිරීක්ෂණය කිරීමේ සහ පාලනය කිරීමේ ක්‍රමය සංවර්ධනය කිරීම. (2025)	3.98	0.00	▪ කාර්යය ඉංජිනේරු සමාගමකට ප්‍රදානය කර ඇත. කෙටුම්පත් ගිවිසුමට අනුව මුළු පිරිවැයෙන් 70% ක් 2025 නොවැම්බර් මාසයේදී ඉංජිනේරු සමාගමට ගෙවනු ලබන අතර ඉතිරි ගෙවීම 2025 දෙසැම්බර් මාසයේදී සිදු කෙරේ.
ක්‍රියාත්මක ආයතනය - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය			
පාංශු තත්ව පරීක්ෂාවට අවශ්‍ය පී.එච්.මීටර් මිලදී ගැනීම	5.10	0.00	▪ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සකස් කිරීම අවසන් කරන ලංසු කැඳවීම සඳහා එම වාර්තාව ලබාදීම සිදුකර ඇත.
"Silver Tip Tea Cultivation" ව්‍යාපෘතිය	9.85	0.00	▪ ප්‍රාදේශීය කාර්යාල මඟින් ගොවීන් හඳුනා ගැනීම ආරම්භ කර ඇත. ▪ එම ගොවීන් සඳහා අවසර පත්‍ර නිකුත් කර, බිම් සැකසීමේ කටයුතු ආරම්භ කර ඇත.
වැවිලි අංශය සඳහා දිරිදීමනා යෝජනා සංවර්ධනය.	5.00	0.00	▪ උපදේශකයෙකු තෝරා ගෙන ඇත.

තවාන් කළමණාකරණ ඩිජිටල්කරණය කිරීම.	3.95	0.00	▪ තේ පැල තවාන්කරුවන් ලියාපදිංචි කිරීම සහ තේ පැල තවාන් දත්ත කළමනාකරණ පද්ධතිය සකස් කිරීමට සුදුසු ආයතනයක් තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට පුවත්පත් දැන්වීමක් පළ කර ඇත.
රබර් ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - රබර් පර්යේෂණ ආයතනය			
නව පත්‍ර පතන රෝගයට අදාළ වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම.(2021-2025)	6.98	3.75	▪ දිලීර 12ක් හඳුනාගෙන (Isolated) තිබේ. එම දිලීර 12, අතරින් වඩාත් කාර්යක්ෂම දිලීර 5ක් තෝරා ගෙන අධ්‍යනය කරමින් පවතී. ▪ තවදුරටත් ව්‍යාධි ජනක නිපදවනු ලබන මූලක පිළිබඳව වැඩිදුර පර්යේෂණ සිදු කරමින් පවතින අතර, එම දත්ත රෝග පාලනය සඳහා යෙදා ගැනීම තවදුරටත් සිදුකරයි. ▪ රෝග මර්ධන අත්හදාබැලීම් ක්ෂේත්‍ර 34ක් අවසන් කර, රෝග තීව්‍රතාවය තවදුරටත් මාසිකව නිරීක්ෂණය කරනු ලැබේ, තවදුරටත් ක්ලෝන 50ක පරීක්ෂාව අවසන්කර ඇත. ක්ෂේත්‍ර 05ක (IDM) සයමෝධායන රෝග පාලන කටයුතු සිදු කරන ලදි. ▪ පුහුණු කිරීම්-04 (රබර් සංවර්ධන නිලධාරීන් සහ මධ්‍ය පරිමාණ රබර් ගොවීන්) කමිටු රැස්වීම් 01ක් සිදු කරන ලදි. එමෙන්ම පර්යේෂණ පත්‍රිකා - 05 ක් , සකස් කරමින් පවතින පත්‍රිකා - 01 කි.
ජාත්‍යන්තර වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා රබර් ඉඩම් සිතියම්ගත කිරීමේ/ ඩිජිටල් පද්ධතිය ඵලදායී ලෙස යොදා ගනිමින් රබර් කර්මාන්ත අංශය නවීකරණය කිරීම.	75.00	0.00	▪ රබර් වගා බලපත්‍ර 1433(10/08 වන විට) කට අයත් භූමි කොටස් වල භූ ඛණ්ඩාංක ලබාගෙන lis.survey.gov.lk යන සබැඳිය හරහා ප්‍රදර්ශනය කර ඇත. QR කේතය ලබා දෙන ආකාරය දැක්වීමට එක QR කේතයක් උදාහරණයක් ලෙස ඉදිරිපත් කර ඇත.
රබර් අංශයේ තිරසාර සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ ලබා දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම.	1.60	0.00	▪ මාර්ග සිතියම සඳහා අවශ්‍ය සියලුම යෙදවුම් (inputs) ක්ෂේත්‍රයේ පරීක්ෂා කිරීම් සිදුකර ඇත. ▪ මාර්ග සිතියම සකස් කිරීමට සම්පත් දායකයකු තෝරා ගෙන ඇත. ▪ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් පැවැත්වීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.

රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය උපයෝගී කර ගනිමින් රබර් පර්යේෂණායතනයේ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම.	4.90	0.00	▪ පුස්තකාලයේ ස්වයංක්‍රීයකරණය (Library Automation) කිරීමට සේවාදායකයින් තෝරා ගැනීම සඳහා මිළ ගණන් කැඳවා ඇති අතර, පුස්තකාලයට අවශ්‍ය පුටු, වායු සමීකරණ, තිර රෙදි දැමීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර, අළුත් වැඩියාවන් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.
රබර් පර්යේෂණායතනයේ ශිෂ්‍ය/පර්යේෂක නේවාසිගාර දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම.	9.70	0.00	▪ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවා අවසන් අතර ඉදිරි ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කර ඇත.
ශ්‍රී ලංකාවේ රබර් දැව කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා වැඩිදියුණු කළ රසායනාගාර පහසුකම්.	4.00	0.00	▪ 2025.08.14 දින ව්‍යාපෘති ආරම්භය සඳහා අනුමැතිය ලැබුණි. එමෙන්ම පර්යේෂණ උපකරණ මිළදී ගැනීම සඳහා ඉන්ඩෙන්ට් කළ අතර ඒ සඳහා අවශ්‍ය පිරිවිතර මිලදී ගැනීමේ අංශය වෙත ලබා දෙන ලදී.
පොල්, කිතුල් හා තල් ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - පොල් පර්යේෂණාතනය			
පොල් ජාන සම්පත් මධ්‍යස්ථානය වටා අලි වැට ඉදිකිරීම.	20.00	0.20	▪ වනජීවී දෙපාර්තමේන්තුවෙන් අලි වැට සඳහා ප්‍රමාණ පත්‍ර සෑදීමට උපදේශයකු ඉල්ලා සිටි අතර වනජීවී දෙපාර්තමේන්තුව සමඟ ප්‍රමාණ පත්‍ර සැකසීම සිදු කරමින් පවතී. අඹකැලේ රක්ෂිතය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතීන් අනුව කටයුතු කිරීමට අවසර දී ඇත. මාදුරු ඔය සහ පොත්තුකුලම වතු සඳහා ප්‍රමාණ පත්‍ර සෑදීමට වන ජීවි කාර්යාලයෙන් තාක්ෂණ නිලධාරියකු වෙන් කර ඇතත් ප්‍රමාණ පත්‍ර සෑදීම සිදු කර ගැනීම අවසන් කිරීමට නොහැකි වී ඇත.
අපනයනය ඉලක්ක කරගත් පානීය කර්මාන්තයක් ලෙස තැඹිලි වතුර ප්‍රවර්ධනය සඳහා තැඹිලි වල ජෛව රසායනික අධ්‍යයනයන් සිදුකිරීම (2025)	2.00	0.83	▪ සාම්පල 45ක් එකතු කර විශ්ලේෂණ කටයුතු කිරීම. sugar profile විශ්ලේශණ සඳහා සාම්පල භාර දී ඇති අතර, Phenolic සහ flavonoides සඳහා තාක්ෂණ ඇගයීම් අවසන් කර ඇත. අවශ්‍ය රසායන ද්‍රව්‍ය කිහිපයක් මිලදී ගෙන ඇති අතර, ඉතිරි ඒවාට ලංසු කැඳවීමට කටයුතු කර ඇත.
පොල් කිරි වල අස්වැන්න සහ ගුණාත්මකභාවය කෙරෙහි පොල් ප්‍රභේදයේ, පොල් ගෙඩිවල පරිණත භාවයේ හා වගාකරනු ලබන ප්‍රදේශවල දේශගුණික තත්ත්වයන්හි බලපෑම අධ්‍යයනය කිරීම (2025-2027)	5.20	0.40	▪ සාම්පල 80ක් සඳහා සමීක්ෂණ කටයුතු අවසන් කිරීම සහ මිලදී ගැනුම් සිදු කරමින් පවතී.
මධ්‍යම විශ්ලේෂණ රසායනාගාරයේ විශ්ලේෂණාත්මක ධාරිතාවයන්	3.1402	3.1402	▪ අවශ්‍ය උපකරණ මිලදී ගෙන අවසන්.

සහ රසායනාගාර ආරක්ෂාව වැඩි දියුණු කිරීම			
පොල් පර්යේෂණ ආයතනයෙහි පටක රෝපණ රසායනාගාරයේ පටක රෝපණ ශාක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම	3.1913	3.1913	▪ ලැමිනා ෆ්ලොව් කැබිනෙට්ටුව, කවුන්ටර් පුටු 2 ක්, බර මැනීමේ උපකරණයක් ,රසායනික තුලාව, විද්‍යාගාර ට්‍රොලි 2ක් හා ශීතකරණයක් මිලදී ගැනීම අවසන් කර ඇත
පොල් පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන රසායනාගාරය සඳහා රසායනාගාර උඳුනක් මිලදී ගැනීම	1.2257	1.2257	▪ ශාක අභිජනන රසායනාගාරය සඳහා රසායනාගාර උඳුනක් මිලදී ගැනීම අවසන් කර ඇත
පොල් ඉඩම්වල තිරසාර කෘෂි විද්‍යාත්මක පිළිවෙත් සහ කෘෂි පරිසර පද්ධති පර්යේෂණ සඳහා රසායනාගාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	1.6812	1.6812	▪ පොල් ඉඩම්වල තිරසාර කෘෂි විද්‍යාත්මක පිළිවෙත් සහ කෘෂි පරිසර පද්ධති පර්යේෂණ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා උපකරණ තුනක් මිලදී ගැනීම අවසන් කර ඇත.
පොල් පර්යේෂණ ආයතනයේ වගා සංරක්ෂණ අංශ රසායනාගාරයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ ප්‍රචාරණය වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය	5.396	5.396	▪ වගා සංරක්ෂණ අංශ රසායනාගාරයේ පළිබෝධ සහ රෝග කළමනාකරණය පිළිබඳ ප්‍රචාරණය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම අවසන් කර ඇත.
ඩ්‍රෝන යානා (UAVs) භාවිතා කරමින් පොල් වගාව සඳහා දේශගුණික මැදිහත්වීම් සිදු කිරීම	5.79	5.79	▪ අවශ්‍ය උපකරණ මිලදී ගැනීම අවසන් කර ඇත.
සමාජ-ආර්ථික අධ්‍යයනයන් සඳහා අත් පරිගණක මිලදී ගැනීම	0.71	0.71	▪ සමාජ-ආර්ථික අධ්‍යයනයන් සඳහා අත් පරිගණක මිලදී ගැනීම අවසන් කර ඇත
දේශගුණික විපර්යාස සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනීම	1.80	0.00	▪ මිල දී ගැනීම සඳහා ලංසු ඇගයීම සිදුවෙමින් පවතී.
දේශගුණික විපර්යාස, කෘෂි විද්‍යාත්මක පිළිවෙත්/සත්ව පාලනයට අනුවර්තනය වීම තුළින් පොල් නිෂ්පාදනය සහ භූමි ඵලදායිතාව වැඩි කිරීම	1.50	0.00	▪ යහපත් කෘෂි පිළිවෙත් සඳහා කමිටුවක් පත් කිරීම, ප්‍රමිතිය සැකසීමට ඉල්ලීමක් ප්‍රමිති ආයතනයෙන් සිදු කිරීම හා ප්‍රමිති සම්පාදන කටයුතු ආරම්භ කිරීම සිදු කර ඇත.
අගය එකතු කිරීම තුළින් පොල් ආශ්‍රිත කර්මාන්තවල ආදායම වැඩි කිරීම	1.70	0.00	▪ මිල දී ගැනීම සඳහා ලංසු ඇගයීම් අවසන් කර ඇත.ගැනුම් ඇණවුම් නිකුත් කර ඇත. රසායනාගාර උඳුනක් (Laboratory Oven) මිල දී ගෙන ඇත.

අණුක ජීව විද්‍යාගාරය සඳහා පී.සී.ආර්. යන්ත්‍රයක් මිල දී ගැනීම	1.50	0.00	▪ අවශ්‍යතාවයට ගැලපෙන අන්දමේ PCR යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ලංසු ප්‍රතික්ෂේප වූ අතර ප්‍රතිපාදන වෙනස් කර නැවත ලංසු කැඳවීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
ක්‍රියාත්මක ආයතනය - තල් සංවර්ධන මණ්ඩලය			
තල් පර්යේෂණ ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් පර්යේෂණ සහ පරීක්ෂණ හැකියාවන් ශක්තිමත් කිරීම	9.80	2.24	▪ වායු සමීකරණ පද්ධති 06ක් ස්ථාපනය කර ඇත. ගිණි නිවන උපකරණ 2 ක්,රසායනාගාර සඳහා කබඩ් ස්ථාපනය , ජල නල පද්ධතිය ප්‍රතිසංස්කරණය හා පින්තාරු කිරීමට මිල ගණන් කැඳවා ඇත. විද්‍යාගාර සඳහා දොර 03ක් ස්ථාපනයට අදාළව ලංසු කැඳවීම සිදු කර ඇත. පරිසනක, රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ මිල දී ගැනීමට ඇණවුම ලබා දී ඇත.
යටිතල පහසුකම් සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය තුළින් ආයතනික කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම	9.95	5.77	▪ වායු සමීකරණ පද්ධති 05ක් ස්ථාපනය කර ඇත. ▪ පරිගණක යන්ත්‍ර 19 ක් මිල දී ගෙන ඇත. ▪ කාර්යාලීය උපකරණ මිලදි ගැනීමට තාක්ෂණික ඇගයීම කරමින් පවතී. ▪ එක් වාහන අළුත්වැඩියාව අවසන් කර, අනෙත් වාහනයේ අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. ▪ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ▪ පුහුණු වැඩසටහන් 1ක් අවසන් කර ඇත.
ක්‍රියාත්මක ආයතනය - පොල් සංවර්ධන අංශය			
තල්, කිතුල්, පොල් හා කුඩා වැවිලි බෝග ආශ්‍රිතව පර්යේෂණ සහ ව්‍යාපෘති සංවාද පැවැත්වීම	0.20	0.00	▪ තල් සංවර්ධන මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය මඟින් නව පර්යේෂණ සොයාගැනීම් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. නොවැම්බර් 4 වන දින මෙම සංවාදය පැවැත්වීමට කටයුතු යොදා ඇත.
කජු ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - කජු සංස්ථාව			
ගොවි ප්‍රජාවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා උතුරු සහ නැගෙනහිර පළාත්වල කජු පොකුරු ගම්මාන පිහිටුවීම.	7.84	1.39	▪ ගොවීන් 207ක් සඳහා අයදුම්පත් නිකුත් කිරීම සිදුකර ඇති අතර, ගොවීන් 201 ක් සඳහා ගොවි පුහුණු වැඩසටහන් පවත්වා ඇත.
ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ඉඩම් මැනීම	8.755	0.225	▪ වතු 03 ක් මැනීම සඳහා මැනුම් නියෝග නිකුත් කර ඇත.

වැවිලි පොදු			
ක්‍රියාත්මක ආයතනය - වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, වැවිලි අංශය			
වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ඇති කොට්ඨාශ අතර පරිගණක ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම	8.50	0.00	▪ මේ වනවිට පර්යන්ත 9න් 8ක පරිගණක ජාල කරනයේ ස්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර ඇත.
වැවිලි අංශයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රචාරණ වැඩසටහන	3.84	0.00	▪ රූපවාහිනී වැඩසටහන් දෙකෙන් එක් වැඩසටහනක් විකාශය කර ඇත. ▪ ගුවන් විදුලි වැඩසටහන් 12ක් ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත. ▪ අත් පොත මුද්‍රණයට ලබා දී ඇත.
නවීකරණය, විවිධාංගීකරණය සහ නවෝත්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	5.90	0.00	▪ සම්පත් දායකයන්ගේ දත්ත ඇතුළත් ලේඛනක් සකස් කර ඇත.
කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය			
යහපත් නිෂ්පාදන පිළිවෙත් GMP අනුකූලතා සහාය හරහා ගුණාත්මක කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සපුරාලීම සහ ශක්තිමත් කිරීම.	9.50	0.00	▪ මූලික කටයුතු ආරම්භ කර ඇත.

අයවැය කතාව මඟින් ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතිවල 2025.09.30 දිනට මූල්‍ය හා භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු. මි.)	භෞතික ප්‍රගතිය
පොල් ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - පොල් වගා කිරීමේ මණ්ඩලය			
උතුරු පොල් ත්‍රිකෝණ ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම.	500.00	299.26	▪ බීජ පොල් 1,462,855 ක් මිල දී ගැනීමේ ඉලක්කයෙන් 1,322008ක් මිලදී ගෙන ඇත. ▪ පොල් පැළ 1,024,000 නිෂ්පාදනය කිරීමේ ඉලක්කයෙන් පැළ 2,15078 ක් සිටුවා ඇත. ▪ අක්කර 5,798 කට ජල සම්පාදනය සිදු කිරීමේ ඉලක්කයෙන් මේ වන විට අක්කර 966 ක් සඳහා ඉල්ලුම්පත්‍ර ලැබී ඇති අතර, එයින් අක්කර 639 ක ඉඩම් පරීක්ෂාව සිදු කර ඇත. අක්කර 110 කට ජල සම්පාදනය සපයා ඇත. ▪ අපේක්ෂිත ව්‍යාප්ති වැඩසටහන් 250 න් වැඩසටහන් 185 ක් පවත්වා ඇත

පොදු			
ක්‍රියාත්මක ආයතනය - ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ඇල්කඩුව වැවිලි සමාගම			
ඌන උපයෝජිත ඉඩම් / දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයන් වෙත ලබාදීම.	183.7	5.2	▪ ඌන උපයෝජිත ඉඩම් වශයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හෙක්ටයාර 669.11 , ඇල්කඩුව වැවිලි සමාගම් හෙක්ටයාර 125 හා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි හෙක්ටයාර 719.41 ක් හඳුනාගෙන ඇති අතර, මේවායේ ඌන උපයෝජිත ඉඩම්හි මිණුම් කටයුතු තවදුරටත් සිදු කරගෙන යන අතර ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු අරඹා ඇත.
කුරුඳු ක්ෂේත්‍රය			
ක්‍රියාත්මක ආයතනය - කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව			
ලංකා කුරුඳු නිෂ්පාදනය ගුණාත්මකභාවය සහ ගෝලීය ප්‍රවේශය වැඩිදියුණු කිරීම.	150.00	12.49	▪ වගාව සඳහා පැළ 16,875 ක් නිකුත් කර ඇත. හෙක්ටයාර 150 ඉලක්කයෙන් හෙක්ටයාර 1.9 වගා කර ඇත. ▪ වාර පැළ 187,835 වගා කර ඇත. හෙක්ටයාර 150ක ඉලක්කයෙන් හෙක්ටයාර 180.6 ක් වගා කර ඇත.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

තේ ක්ෂේත්‍රය

01. 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වාර්ෂික ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

❖ **ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රයේ අනාගත අභිවෘද්ධිය සහ තිරසර සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කොට ගනිමින් - තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් (2025 – 2029) සකස් කිරීම.**

මෙහිදී තේ ක්ෂේත්‍රයෙහි තේමාවන් 08ක් සඳහා ක්‍රියාකාරකම් කෙටුම්පත් කිරීම තේ ක්ෂේත්‍රයට අදාළ ආයතනවල සහ තේ අගයදාමයට සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන්ගේ ද සහභාගීත්වයෙන් ලබා ගන්නා ලද අදහස් හා යෝජනා ඇතුළත් කරමින් සකස් කර සාකච්ඡාවට යොදා ගත් අතර, එසේ කෙටුම්පත් කරන ලද උපාය මාර්ගික සැලැස්ම පිළිබඳ ක්ෂේත්‍රයේ විද්වතුන් ,තේ සංගම් හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සමඟ සමාලෝචනයක් සිදු කර, සියලු අදහස් යෝජනාවන් සහිතව සකස් කරන ලදී. කෙටුම්පත් කළ තේ ක්ෂේත්‍රයේ උපාය මාර්ගික සැලැස්ම අමාත්‍යාංශ නිලධාරීන් හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වය ඇතුව ගරු වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා හා අමාත්‍යාංශ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන ලද අතර, එම සාකච්ඡාවේදී සිදු කරන ලද යෝජනා අදහස් පරිදි ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර, ඉන්පසු සියලුම පාර්ශවකරුවන්ගේ එකඟත්වයෙන් උපාය මාර්ගික සැලැස්ම අත්සන් කිරීමට අපේක්ෂිතය.

❖ **" දේශගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දෙන වැඩිදියුණු කළ බීජ උද්‍යාන ස්ථාපිත කිරීම" ව්‍යාපෘතිය**

2021 සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත ප්‍රතිපාදන ලබා දෙන අතර, මෙම ව්‍යාපෘතියට අදාළ කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමන කටයුතු තේ සංවර්ධන අංශය මඟින් සිදු කරනු ලබයි. දැනට බීජ උද්‍යාන 12ක් සහ නැවත ප්‍රතිස්ථාපනය කර ඇති බීජ උද්‍යාන 03 නඩත්තු කටයුතු මේ වන විට සිදු කරමින් පවතියි.

❖ **" නව තේ ප්‍රභේදවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් අතර බෙදා හැරීමට මව් වගාවන්හි වපසරිය වැඩි කිරීම " ව්‍යාපෘතිය**

2022 සිට 2027 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙත රු.මිලියන 18.5ක ප්‍රතිපාදන ලබා දෙන අතර, එම ව්‍යාපෘතියට අදාළ කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා නියාමන කටයුතු ද මෙම අංශය සිදු කරනු ලබයි.

තවද, මෙම ව්‍යාපෘතිය මඟින් නව මව් වගා බිම් හෙක්ටයාර 4.5 ක් පමණ ස්ථාපනය කර ඇති අතර, 2025 වර්ෂයට නියමිත ශාන්ත ජෝකීම් වත්තෙහි සහ තේ පර්යේෂණ ආයතනය කොට්ටව මධ්‍යස්ථානයේ නව මව් වගාවන් ස්ථාපන කටයුතු සිදුකරමින් පවතියි. ව්‍යාපෘතියේ පවතින විවිධ ක්‍රියාකාරකම් යටතේ පුනරුත්ථාපන තෘණ වගාව හා නව මව් වගාවන් සිදු කරමින් පවතියි.

❖ **තේ අංශය සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සඳහා වන ප්‍රමිතීන් සකස් කිරීම සඳහා වන වැඩසටහන**

ශ්‍රී ලංකාවේ තේ ක්ෂේත්‍රය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ යහපත් කෘෂිකාර්මික වත් පිළිවෙත් සම්බන්ධයෙන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සම්මතයන් (SL GAP Standard) සකසා අවසන් කර ඇත. එහි ප්‍රතීතනයෙහි තිරසරභාවය ශක්තිමත් කිරීම සඳහා වන ISEAL සන්ධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති බැවින් ඊට අදාළ කටයුතු ක්‍රියාත්මක කරමින් පවතියි. තව ද ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL GAP) සඳහා පොදු ලාංඡනයක් හඳුන්වාදීම සහ "පොදු බලයලත් ඒකකයක්" පිහිටුවීම සඳහා ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය

ලබා ගැනීම සම්බන්ධයෙන් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය සමඟ කෙටුම්පත් කරමින් පවතී.

02. 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

❖ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා 2025 – 2029 වර්ෂයන්ට අදාළව තේ ක්ෂේත්‍රයෙහි උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම.

❖ තේ කර්මාන්තය සඳහා " ජාතික තිරසාර ජෛව ස්කන්ධ වර්ධනය සහ මූලාශ්‍ර වැඩසටහන" ක්‍රියාත්මක කිරීම.

- මෙම වැඩසටහන කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නිව් හෝප් වේල් තේ කර්මාන්තශාලා සමාගම , බලංගොඩ , නිල්වලා තේ කර්මාන්තශාලාව, අරුණ තේ කර්මාන්තශාලාව, එවර්ග්‍රීන් තේ කර්මාන්තශාලාව, හරංගල තේ කර්මාන්තශාලාව , අවිස්සාවේල්ල තේ කර්මාන්තශාලාව, ගල්තර තේ කර්මාන්තශාලා සමාගම යන කර්මාන්තශාලා අටෙහි නියමු ව්‍යාපෘතින් සිදුකිරීමට ඉදිරිපත්ව ඇත.
- මෙම නියමු ව්‍යාපාතීන් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත තේ කර්මාන්ත ශාලා අටෙහි ක්ෂේත්‍ර නිළධාරීන්ගේ සහභාගීත්වයෙන්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිළධාරීන්ට පුහුණු වැඩසටහන් මෙන්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ ද ජාතික වැවිලි කළමනාකරණ ආයනතයේදී පැවැත්විය.

ඒ අනුව,

- බලංගොඩ නිව් හෝප් වේල් තේ කර්මාන්තශාලාව විසින් දැව කැබලි කිරීම් (Wood Chip) යන්ත්‍රයක් නිර්මාණය කර ඇති අතර, එහි යෝග්‍යතාවය පරීක්ෂා කර බලා වැඩි දියුණු කර ගැනීමට අවශ්‍යවන සහය ගැනීම සඳහා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.
- අරුණ තේ කර්මාන්තශාලාව හා ගල්තර තේ කර්මාන්තශාලාව නිරීක්ෂණ කටයුතු සිදු කළ අතර, එහිදී සිදු කළ සාකච්ඡා පරිදි ගල්තර තේ කර්මාන්තශාලාව සම්බන්ධ කර, පරෙයිගම ග්‍රාම නිළධාරී වසම සම්බන්ධ කරමින් නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- තවද, තේ කර්මාන්තයේ තිරසාර ජෛව ස්කන්ධ වගාව සහ භාවිතය පිළිබඳ හොඳම පිළිවෙත් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය එතිකා තේ හවුල්කාරිත්ව ආයතනය සමඟ එක්ව තේ ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා සකස් කිරීමට කටයුතු කරන ලදී.

❖ යුනිලීවර් ශ්‍රී ලංකා ආයතනය සමඟ එක්ව පුනර්ජනීය කෘෂිකර්මය සඳහා වන වැඩසටහන

- වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ යුනිලීවර් ශ්‍රී ලංකා (ලිමිටඩ්) ආයතනය සමඟ එක්ව වැවිලි ක්ෂේත්‍රයේ පුනර්ජනනීය කෘෂිකර්මාන්තය සහ ජාතික තිරසාර ප්‍රමිති හඳුන්වා දීම සඳහා ගිවිසුම්ගත විය. මෙහිදි ,
- පුනර්ජනනීය කෘෂිකර්මාන්තයට අදාළව රාජ්‍ය - පෞද්ගලික හා මහජන හවුල්කාරීත්ව (PPPP) ව්‍යාපෘතිය සඳහා සහය දක්වන පෙප්සි ලිප්ටන් ඉන්ටර්නැෂනල් කණ්ඩායම සමඟ 2025.05.16 වන දින ගරු වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා සමඟ සාකච්ඡාවක් පැවැත් වූ අතර, සිදු කළ සාකච්ඡාවට අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි.
- ගෝලීය වශයෙන් පිළිගත් දේශීය තිරසාර ප්‍රමිතීන් හඳුන්වාදීම යටතේ ක්ෂේත්‍රය සඳහා වන ප්‍රමිතීන් සකස් කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හා මහජන හවුල්කාරීත්ව (PPPP) ප්‍රවේශයට අනුකූල වන වැඩසටහන මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කිරීම.

❖ ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යෝජනා ක්‍රමය සහ ජපාන දිළිඳුකම අවම කිරීමේ අරමුදල (JFPR) ප්‍රදානය යටතේ වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC) ව්‍යාපෘතිය

- ශ්‍රී ලංකාව තේ නිෂ්පාදනයෙන් 75%ක දායකත්වයක් ලබා දෙන්නා වූ කුඩා හා මධ්‍ය පරිමාණ තේ වතු හිමියන් ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම තුළින් තේ කර්මාන්තය දියුණු කිරීම සඳහා මෙම

ණය වැඩසටහන ක්‍රියාත්මක වේ. පාළු සිටුවීම, නැවත තේ වගාව, නව වගාව, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධන සහ යාන්ත්‍රීකරණය යන සංරචකයන් සඳහා වන කෙටිකාලීන හා දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් අමාත්‍යාංශය , වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ සුදුසුකම්ලත් මූල්‍ය ආයතන 13ක සහයෝගීතාවයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

- එක්සත් ජනපද ඩොලර් මිලියන විස්සක ක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමය සඳහා මුදල් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව ගිවිසුම් ගතව ඇති අතර, තේ වගාව දිරිමත් කිරීම සහ තාක්ෂණික සහය ලබාදීමේ ප්‍රදානයක් ලෙස ජපාන දිළිඳුකම අවම කිරීමේ අරමුදලෙන් (JFPR) ඩොලර් මිලියන 1.25ක් සහ ඩොලර් මිලියන 1.75ක් ද මෙම ණය යෝජනා ක්‍රමයට ඇතුළත් වේ.
- මෙම ව්‍යාපෘතිය 2020 වසරේ ආරම්භ වී 2024 වසරේ ජූනි මස අවසන් වීමට නියමිතව තිබුණු ද විවිධ බාහිර සාධක හේතුවෙන් අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබෙන බව නිරීක්ෂණය වීම හේතුවෙන්, 2024 ජූනි මස සිට මාස 06කින් දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. මේ වන වන විට ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතී.

-ආසියානු සංවර්ධන බැංකුව මඟින් ජපන් රජයෙන් ලැබුනු ප්‍රදානයක් (Grant-1.75US$ මිලියන) උපයෝගී කරගෙන තේ අගය දාමය ශක්තිමත් කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් පහත ජංගම යෙදවුම් දෙක හඳුන්වාදීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර මෙහි මෙහෙයවීම හා අධීක්ෂණය අමාත්‍යාංශය මඟින් සිදු කරමින් පවතී.

- ❖ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (FAO) තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමෙහි (IGG) 26 වන ආහාර හා කෘෂිකර්ම සැසිය සහ ආසියානු තේ සන්ධානයේ (ATA) 4 වන වාර්ෂික රැස්වීම සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ 100 වන සංවත්සර සැමරුම සම්පූර්ණ වීම නිමිත්තෙන් පවත්වනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (FAO) තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමෙහි (IGG) 26 වන ආහාර හා කෘෂිකර්ම සැසිය සහ ආසියානු තේ සන්ධානයේ (ATA) 4 වන වාර්ෂික රැස්වීම සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ 100 වන සංවත්සර සැමරුම 2025 වර්ෂයේ නොවැම්බර් මස 10 සිට 14 දක්වා පැවැත්වීමට අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය හා ආසියානු තේ සන්ධානය (Asian Tea Alliance) සමඟ එක්ව සිදු කෙරෙන අතර, ඊට අදාළ "එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ (IGG) 26 වන සැසිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදල් යොදා ගනිමින් සංවිධාන කටයුතු සිදුකරමින් පවතින අතර, සැසිය සංවිධානය කොළඹ තේ වෙළඳුන්ගේ සංවිධානය මඟින් සිදු කරනු ලබයි.
- ❖ තේ පර්යේෂණ ආයතනයේ සියවන සංවත්සරයට සමගාමීව පවත්වන අන්තර්ජාතික විද්‍යා සම්මන්ත්‍රණය සැමරීම සඳහා දේශීය අනුග්‍රාහකයන්ගෙන් 50% අරමුදල් හා 50%ක අරමුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පැවැත්වීමට සැලසුම් කර ඇත.
- ❖ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි නෙමටෝඩා පලිබෝධ (වට පණුවන්) පැතිරීමේ ප්‍රවණතාවය හඳුනාගැනීම සඳහා වන සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය මෙම අංශයෙන් සිදු කරන අතර, මේ සම්බන්ධයෙන් නියඳි 300ක් ලබා ගෙන විශ්ලේෂණය සිදු කර ඇත. සිතියම් පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කර ඇත. එම ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම මෙහෙයවීම හා අධීක්ෂණ කටයුතු නිරන්තරයෙන් සිදු කරයි.
- ❖ සමස්ත වැවිලි ක්ෂේත්‍රය සඳහා එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) සමඟ එක්ව දස අවුරුදු මාර්ග සිතියමක් සකස් කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.
- ❖ හරිත දේශගුණික අරමුදල මඟින් ක්‍රියාත්මක නකල්ස් ව්‍යාපෘති (GCF Knuckles), කෘෂි වන විද්‍යා පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළව අධීක්ෂණ කටයුතු සිදු කිරීම හා 2025.05.21 වන දින පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වන ලදී.

❖ වැවිලි අංශය සඳහා දිරි දීමනා යෝජනා සංවර්ධනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. (Development of Incentive Scheme for Plantation Sector)

තේ නිෂ්පාදනයෙහි අඛණ්ඩ ගුණාත්මකභාවය සහ යහපත් පිළිවෙත් ආරක්ෂා කරගනිමින් ක්ෂේත්‍රයෙහි නියැළී සිටින වගාකරුවන් , නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් ඇතුළු පාර්ශ්වකරුවන්හට දිරිදීමනා ලබා දීම සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමේ වැඩසටහනට අදාළ මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙකු තෝරා ගැනීමට කටයුතු කරමින් පවතී.

❖ තවාන් කළමණාකරණ ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. (Digitalization of Nursery Management)

රෝපණ ද්‍රව්‍යවල (තේ පැළවල) ගුණාත්මය තහවුරු කිරීම සඳහා බීජ සහතිකකරණය සිදු කිරීමට අදාළව, කෘෂිකර්ම අංශය සමඟ ඒකාබද්ධව කටයුතු සිදු කරමින් පවතින අතර, මේ වන විට කොන්දේසි (ToR) සකස් කිරීම හා තේ පැළ තවාන් ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට කටයුතු කර ඇත.

03. 2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය

I. 2025 වර්ෂයේත් තේ වගාකරුවන්ට සහන මිලකට පොහොර ලබාදීම සඳහා සහනාධාර ලෙස රු.මි. 2000.00ක් වෙන් කර ඇත. රජයේ පොහොර සමාගම වන ස්ටේට් ෆර්ටිලයිසර් සමාගම මඟින් පමණක් සිදු කරනු ලැබූ පොහොර බෙදාදීමේ වැඩසටහන ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සියළුම පොහොර සමාගම් හරහා කූපන් පත් ක්‍රමවේදයක් හරහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් QR කේතයක් සකස් කරමින් පවතියි.

II. වැවිලි අංශයේ අවසන් කරන ලද වැවිලි ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර යොමු කර ඇත.

III. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO), අන්තර් රාජ්‍ය කණ්ඩායම් (IGG) සැසිය සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය මඟින් යොමු කරන ලද වගකීම සම්බන්ධ අවබෝධතා ගිවිසුමට (MOR) අදහස් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ නිතී නිලධාරී වෙත යොමු කර ඇත. එම නිරීක්ෂණ සලකා බැලීමෙන් අනතුරුව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අත්සනට යොමු කිරීමට අපේක්ෂිතයි.

04. 2026 වර්ෂයේ දී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති / ක්‍රියාකාරකම් පිළිබඳ යෝජනා

I. තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීමට ඉදිරි තෙවසර සඳහා සකස් කරන උපායමාර්ගික සැලැස්මට අනුව කටයුතු කිරීම.

II. කුඩා තේ වතු සහ මධ්‍ය පරිමාණ වතු පිහිටීම අනුව සංවිධානය කර, තේ ඉඩම් හිමියන්ගේ සාමාජිකත්වය සහිත පොදු ව්‍යුහයක් ස්ථාපනය කිරීම හා ඒ යටතේ එක් එක් කර්මාන්තශාලාවට අදාළව දළු සපයන තේ වගාකරුවන් ඒකරාශී කොටගෙන සමාගම් පද්ධතියක් පිහිටුවීමට අදාළව ඉදිරි කටයුතු සිදු කිරීම.

III. නිෂ්පාදනයෙහි අඛණ්ඩ ගුණාත්මකභාවය සහ යහපත් පිළිවෙත් ආරක්ෂා කරගනිමින් ක්ෂේත්‍රයෙහි නියැළී සිටින වගාකරුවන්, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් ඇතුළු පාර්ශවකරුවන් හට දිරි දීමනා ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

රබර් ක්ෂේත්‍රය

- **ජාත්‍යන්තර වෙළඳපොල ඉල්ලුම සපුරාලීම සඳහා රබර් ඉඩම් සිතියම්ගත කිරීම / ලියාපදිංචි කිරීමේ ඩිජිටල් පද්ධතියක් ඇතිකිරීම**

  වනාන්තර විනාශයෙන් තොර තිරසාර නිෂ්පාදන පිළිබඳ යුරෝපා සංගමේ වන රෙගුලාසි (The European Union Deforestation Regulations) සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවය නිසා ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම කඩිනමින් ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමත කිරීමෙන් පසුව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

- **ශ්‍රී ලංකාවේ රබර් වගාව සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම**

  මේ අනුව, ශ්‍රී ලංකා ප්‍රමිතිකරණ ආයතනය සමඟ සම්බන්ධ වී ශ්‍රී ලංකාවේ රබර් වගාව සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- **රබර් අංශයේ තිරසාර සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ ලබා දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම**

  රබර් මහ සැලැස්ම 2025 අවසානයේ අවසන් වීමට නියමිතය. වර්තමාන භෞතික හා ආර්ථික පරිසරය සැලකිල්ලට ගෙන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" දැක්මට අනුකූලව 2025-2029 සඳහා නව මාර්ග සිතියමක් සකස් කරමින් පවතී.

- **1956 අංක 11 දරන රබර් පාලන පනතේ සංශෝධන කෙටුම්පත සකස් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පෙර පාර්ලිමේන්තු විවාදයට ඉදිරිපත් කර ඇත.**

- **1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර පනත සංශෝධනය කිරීම.**

  රබර් නැවත හා නව වගා සඳහා ලබාදෙන සහනාධාරවල වාරික ගණන සංශෝධනය කිරීමට අදාල සංශෝධන ඇතුළත් කළ කෙටුම්පත රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ සංශෝධන ඇතුළත් කර, අඩුපාඩු නිවැරදි කර නැවත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

- ශ්‍රී ලංකාවේ තාක්ෂණික පිරිවිතර රබර් කර්මාන්තශාලා සඳහා අපනයන යෝජනා ක්‍රමය (TIEP) යටතේ මුදවන ලද රබර් කිරි (CUPLUMPS) ආනයනය කිරීම සඳහා අවසර ලබාදීමට ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, කර්මාන්තශාලා හිමියන්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය එක්ව සකස් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී.

- **නව කුරුඳු සංවර්ධන පනත සකස් කිරීම**

  නීති කෙටුම්පත් සම්පාදකගේ ඉල්ලීම අනුව, නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා සකස් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- **සිනමන් ගේට් ව්‍යාපෘතිය(Cinnamon Gate)**

  'ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය' ව්‍යාපෘතියේ අදියර 1 සඳහා 2025 වර්ෂය සඳහා අයවැය මඟින් රු. මිලියන 275ක් වෙන් වී ඇති අතර, අදාල ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි මුදල කුරුඳු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා යෙදවීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

- ❖ **ස්වභාවික රබර් නිපදවන රටවල සංගමය (ANRPC) විසින් සංවිධානය කරන වැඩසටහන් සඳහා සහභාගී වීමට අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කිරීම.**
- ❖ **ප්‍රංශ රජයේ මූල්‍ය ආධාරය යටතේ කුඩා වතු හිමියන් සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.**

  අදියර දෙකක් යටතේ, කුඩා රබර් වතු හිමියන් 6,000කගේ තාක්ෂණික හා කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම සහ අතුරු බෝග වගාව/ගෙවතු වගාව යොමු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර සහ මැදගම වගා ප්‍රදේශවල ක්‍රියාත්මක වේ.

2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා ගත් ප්‍රතිපත්තිමය තීරණ

- ❖ **තාක්ෂණික පිරිවිතර සහිත රබර් කර්මාන්තශාලා සඳහා අපනයන සැකසුම්**

  අදාළ කර්මාන්තශාලාවල මුළු නිෂ්පාදනයෙන් 50%ක් සඳහා අවශ්‍ය මුදවන ලද රබර් කිරි (CUP LUMP) සහ (LOW DIRT CUP LUMP) ආනයනය කිරීමට අවසර ලබා දීම සඳහා අමාත්‍යාංශය සහ කර්මාන්තශාලාව අතර ගිවිසුම සකස් කර අවසන් කර ඇත.

- ❖ **2026 වර්ෂයේ වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා යෝජිත විශේෂ ව්‍යාප්ත ක්‍රියාකාරකම් පිළිබඳ යෝජනා**

- ශ්‍රී ලංකාවේ ස්වභාවික ක්‍රේප් රබර් නිෂ්පාදන සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීමට කටයුතු කිරීම.
- 2026 වර්ෂයේ වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් සඳහා තිරසාරභාවය සහතික කිරීමේ පද්ධතියක් (SCSNR) සංවර්ධනය කිරීමට ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීම.

පොල් හා තල් ක්ෂේත්‍රය

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ප්‍රගතිය

- ❖ 2030 වන විට රටෙහි පොල් අවශ්‍යතාවය වන ගෙඩි මිලියන 4,200ක් සැපයීම සහ අපනයන ආදායම ඇ.ඩො.මි. 1,500ක් දක්වා ඉහළ නැංවීම අරමුණු කර, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) සමඟ ක්ෂේත්‍රයේ සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් පොල් ක්ෂේත්‍රය සඳහා දස අවුරුදු මාර්ග සැලැස්මක් හා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කරමින් පවතී.
- ❖ වැලිගම පොල් කොල මැලවීමේ රෝගය පාලනය කිරීමට අදාළව පොල් පර්යේෂණායතයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ කාර්යභාරය නියාමනය කිරීම හා එක් රෝගී ගසකට ගෙවන වන්දි මුදල 2025 මැයි 31 දින සිට රු.10,000 දක්වා ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- ❖ පොල් වගාවෙහි ඵලදාව වැඩිකරගැනීමේ අරමුණු ඇතිව යුරල්කලී ආයතනයේ (රුසියාව) දායකත්වයෙන් සපයනු ලැබූ MOP පොහොර මෙට්‍රික් ටොන් 27,500 සමඟ ERP හා යූරියා සමඟ මිශ්‍ර කර සකස් කරන ලද APM(W) පොහොර මෙට්‍රික් ටොන් 56,700ක්, අක්කර 1/4 සිට අක්කර 5 දක්වා ඵලදරන ගසක් සඳහා ග්‍රෑම් 3,300ක් වන සේ APM(W) පොහොර කිලෝ ග්‍රෑම් 50 ක මිටියක් රු.4,000.00ක සහනදායී මිලකට පොල් වගාකරුවන් වෙත 2025 මාර්තු මස අග සිට ලබා දීමට අදාළ කටයුතු සිදු කිරීම.
- ❖ උක්ත වැඩසටහනෙහි දෙවන අදියර යටතේ අක්කර 5ට වැඩි පොල් වතු සඳහා අක්කර 5 දක්වා ද රජය සතු වැවිලි සමාගම් සඳහා ද පොහොර සහන මිලට ලබා දීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබූ අතර, ඒ සම්බන්ධව මේ වන විට කටයුතු කරමින් පවතී.
- ❖ දේශීය පොල් ඵලදාව අඩුවීම හා ඉල්ලුම ඉහල යාමත් සමඟ පොල් මිල ඉහළයාම මඟින් දේශීය පාරිභෝගිකයාට සහ පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා සිදුවන බලපෑම අවම කිරීම සඳහා, පොල් මද

ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තායතන වෙත සෘජුවම ශීත කළ පොල් මද, පොල් කිරි/පිටි කළ පොල් කිරි, දිසිඳි පොල් ප්‍රතිඅපනයනය සඳහා බදු විරාම පදනම මත, පොල් ගෙඩි මිලියන 200කට සමාන ධාරිතාවයකින් යුත් ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර ලබාදීම. (පොල් කිරි මෙ.ටො. 20ක පමණ ප්‍රමාණයක් මේ වන විට ආනයනය කර ඇත)

- ❖ දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීමට පොල් සංවර්ධන අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව, කැබලි කර වියලන ලද කුරුට්ට සහිත පොල්(කොප්පරා නොවන) ආනයනකරුවන්ට කිලෝ ග්‍රෑමයට රුපියල් 10.00ක් වූ සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ බදු අගයන් ක්‍රියාත්මක කිරීමට රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කිරීම සඳහා අදාළ බදු සංශෝධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය තීරු බදු අනු කමිටුව හරහා ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
- ❖ දේශීය පොල්තෙල් නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය නියාමනයට පොල් සංවර්ධන අධිකාරිය මඟින් කර්මාන්ත පරීක්ෂාවට ලක් කිරීම, එම පොල්තෙල් කර්මාන්ත සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිර්දේශ කරන තත්ත්ව සහතික ලබාගත් පසු පොල් සංවර්ධන අධිකාරියේ සහතිකලත් දේශීය පොල්තෙල් ලෙස ලාංඡනයක් සහිතව වෙළඳපලට හඳුන්වා දීමට කටයුතු කිරීම.
- ❖ පොල් සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, කුරුණෑගල වැවිලි සමාගම, හලාවත වැවිලි සමාගම හා කප්රුක අරමුදල යන ආයතන වලින් සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම.
- ❖ ***"පොල් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය විධිමත් කිරීම"*** යන මැයෙන් පොල් සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද රෙගුලාසි කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. එහි සිදුවිය යුතු සංශෝධනයන් සම්බන්ධයෙන් ඉදිරියේදී නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතය.
- ❖ පහත සඳහන් රෙගුලාසි කෙටුම්පත් හතර ද නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.
  - පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන: නව නිෂ්පාදකයන් සහ නව මෝල්කරුවන් ලියාපදිංචි කිරීම.
  - පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන: නිෂ්පාදකයන් හා මෝල්කරුවන් වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සහ ලියාපදිංචි සහතිකය අහෝසි කිරීම.
  - පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන්ට බලපත්‍ර ලබාදීම හා බලපත්‍රය අවලංගු කිරීම හා අත්හිටුවීම.
  - පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මක ප්‍රමිතීන් නිර්ණය.
- ❖ 2025 ලෝක පොල් දින වැඩසටහන හා උතුරු පොල් ත්‍රිකෝණය සක්‍රීය කිරීම 2025.09.02 දින ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පුහි ශ්‍රී මුරුගන් කෝවිල් පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි. මෙම ජාතික උත්සවය, තිරසර කලාපීය සංවර්ධනය, ග්‍රාමීය බලගැන්වීම සහ ශ්‍රී ලංකාවේ පොල් ක්ෂේත්‍රයේ සමස්ථ දියුණුව සඳහා සියලුම පාර්ශවකරුවන්ගේ දැඩි කැපවීම පිළිබිඹු කරමින් කැපී පෙනෙන සාර්ථකත්වයක් අත්කර ගත් අතර, රාජ්‍ය ආයතන, වැවිලි සංවිධාන සහ ගොවි ප්‍රජාවන් සමීප සහයෝගීතාවයකින් යුතුව එක් කරන ලදී. ඊට සමගාමීව උතුරේ ප්‍රථම බීජ පොල් උයන පලෙයි හි දී ආරම්භ කරන ලදී.
- ❖ පොල් දින වැඩසටහනට සමගාමීව උතුරු පළාත පොල් වගාව, සැකසීම සහ අගය එකතු කිරීම සඳහා සක්‍රීය මධ්‍යස්ථානයක් බවට පත්කිරීම අරමුණු කරගනිමින් උතුරු පොල් ත්‍රිකෝණය වැඩසටහන ජනගත කිරීමට ද කටයුතු කරන ලදී. මෙම උතුරු පොල් ත්‍රිකෝණය තුළ 2027 වසර වන විට මුළු අක්කර 50,000ක් වගා කිරීමට අපේක්ෂිත අතර ඉන් අක්කර 10,000ක් මේ වන විටත් වගා කර ඇති අතර, 2025 වර්ෂය තුළ අක්කර 16,000ක් ද 2026 වර්ෂය තුළ අක්කර 16,000 ක්ද 2027 වර්ෂය තුළදී අක්කර 8000ක් ද බැගින් වගා කිරීමට අපේක්ෂිතය.

වැවිලි කර්මාන්ත නවීකරණ හා විවිධාංගීකරණ අංශය

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාති ප්‍රගතිය

- ❖ වැවිලි අංශයේ සංවර්ධන කටයුතු පිළිබඳ ප්‍රචාරණ වැඩසටහන් යටතේ 2025.08.29 දින පොල් දිනය හා උතුරු පොල් ත්‍රිකෝණය පිළිබඳ රූපවාහිනී වැඩසටහනක් ප්‍රචාරය කිරීම.
- ❖ ආයතනික බුද්ධිමය දේපළ ප්‍රතිපත්තිය සකස් කිරීමේ කාර්යයයෙන් පොල් පර්යේෂණ ආයතනය සහ තල් සංවර්ධන මණ්ඩලය සඳහා ආයතනික බුද්ධිමය දේපල කෙටුම්පත් මේ වන විටත් සකස් කර ජාතික නව්‍යකරණ නියෝජිතායතනය වෙත යොමු කර ඇත.
- ❖ නවීකරණය, විවිධාංගීකරණ හා නව්‍යකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන මඟින් මේ වන විට දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් පවත්වා ඇත එහි නවීකරණය, විවිධාංගීකරණය හා නවෝත්පාදනය යන තේමාව යටතේ 2025.05.21 දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී පළමු වැඩමුළුව පවත්වන ලදී.
- ❖ "Climate Resilience in Tea Plantation Management" යන තේමාව යටතේ 2025.07.23 දින ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී දෙවන වැඩමුළුව පවත්වන ලදී.
- ❖ නව තීරු බදු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුව 2025.08.27 දින පවත්වන ලදී.
- ❖ 2025 අයවැය කතාව යටතේ ක්‍රියාත්මක ඌන උපයෝජිත ඉඩම් සුදුසු වගාවන් සඳහා යොදා ගැනීම යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම යන මහා පරිමාණ වැවිලි ඉඩම් තුළ පවත්නා ඉඩම් ප්‍රශස්ත උපයෝජනය සඳහා ආයෝජකයින් වෙත ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා අභිලාෂ කැඳවීමේ ආකෘති පත්‍රයට අනුව (EOI) පුවත්පත් දැන්වීම් අනුව කැඳවා ඒවා ඇගයීම් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- ❖ කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ කටයුතු 2025.06.30 දිනෙන් අවසන් කරන ලද අතර එහි සමස්ත භෞතික ප්‍රගතිය -93%, මූල්‍ය ප්‍රගතිය -94% ක් ද වේ.
- ❖ කටු පොල් වගාව සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන කමිටුව විසින් කමිටු වාර්තාව සකස්කර අවසන් කිරීම

සැලසුම් අංශය

- ❖ අමාත්‍යාංශයීය සැලසුම් සකස් කිරීම
  - 2025 – 2029 අමාත්‍යාංශයීය උපාය මාර්ගික සැලැස්ම අමාත්‍යාංශයට අදාළ ආයතනය සමඟ එක්ව සකස් කරමින් පවතී.
- ❖ අමාත්‍යාංශයීය ප්‍රකාශන සැකසීම
  - අමාත්‍යාංශයීය කාර්යසාධන වාර්තාව - 2024 සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.
  - වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ දත්ත ඇතුළත් සංඛ්‍යාලේඛන අත්පොත - 2023 නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.
- ❖ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
  - වැවිලි ක්ෂේත්‍රයට ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘතීන් හි ප්‍රගතිය ඇතුළත් මාසික වාර්තා හා කාර්තුමය වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, වෙනත් අමාත්‍යාංශ හා ඉල්ලුම් කරනු ලබන ආයතන වෙත ඉදිරිපත් කිරීම.
  - ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය සහ වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ පිළිබඳ අර්ධ වාර්ෂිකව තොරතුරු හා දත්ත වාර්තා කිරීම.
  - රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ක්‍රියාත්මක ව්‍යාපෘතිවල මාසික හා කාර්තුමය ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලය හා ඉල්ලුම් කරනු ලබන වෙනත් ආයතන වෙත ඉදිරිපත් කිරීම.

❖ ක්‍රියාත්මක සැලසුම් සැකසීම

- අමාත්‍යාංශයීය ක්‍රියාත්මක සැලැස්ම 2025 හා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.
- අමාත්‍යාංශය සඳහා සෘජුව ප්‍රතිපාදන ලැබෙන සංවර්ධන ව්‍යාපෘතීන්හි 2025 ක්‍රියාත්මක සැලසුම් හා සංශෝධිත ක්‍රියාත්මක සැලසුම් සැකසීම.
- අනුබද්ධ ආයතනයන්හි 2025 ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය හා ප්‍රගතිය පිළිබඳ මෙහෙයුම් කටයුතු සිදුකිරීම.
- රජයේ ප්‍රතිපත්ති රාමුවෙහි මෙම අමාත්‍යාංශයට අදාළ 2025 කැපවීම් ක්ෂේත්‍ර ක්‍රියාත්මක සැලැස්ම සකස්කර ජනාධිපති ලේකම් කාර්යාලයේ ඒ පිළිබඳ යෙදුමට (App) ඇතුළත් කර අනුමත කිරීමෙන් පසු කාර්තුමය ප්‍රගතිය ඇතුළත් කිරිම.

පාලන අංශය

❖ වියදම් අවම කිරීමේ අරමුණ මත බදු කුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිලිවල මෙතෙක් පවත්වාගෙන යන ලද රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, අමාත්‍යාංශ පරිශ්‍රය වෙත ගෙන ඒම සහ ඒ සම්බන්ධයෙන් ඉඩ පහසුකම් ලබාදීම හා අංශ නැවත ස්ථාපිත කිරීමේ කටයුතු සිදු කිරීම.

❖ කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP) අවසන් කිරීමට අදාළ සියළුම ආයතන කටයුතු සිදු කිරීම.

❖ මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අංක 05/2024 හා 2025.01.22 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. එම අපහරණය කළ යුතු වාහන හඳුනාගෙන අපහරණය කිරීමට කටයුතු කිරීම.

❖ අමාත්‍යාංශයේ නිල නිවාස අළුත්වැඩියා කිරීමට කටයුතු කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

❖ අමාත්‍යාංශ සියලු නිලධාරීන් සඳහා පුද්ගල හා රැකියා ජීවිතයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා මනෝඋපදේශන වැඩසටහනක් හා කාර්යාල කාර්ය සහයකයන් සඳහා වගකීම් හා ආචාරධර්ම වලින් පිරිපුන් කාර්යාල කාර්ය සහයකයන් කණ්ඩායමක් ගොඩනැංවීම සඳහා ආකල්ප හා වෘත්තීය දැනුම ලබාදීම සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

❖ "තිරසර වැවිලි ආර්ථිකයක් සඳහා රාජ්‍ය ව්‍යවසායන් මෙහෙයවීම" පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

❖ රාජ්‍ය අංශය තුළ විනිවිදභාවය, වගවීම සහ සුපළිපන්නභාවය ඇති කර රජයේ සේවාවන් සියලුම පුරවැසියන්ට ඵලදායී ලෙස සේවා සැපයීම සඳහා සෙත්සිරිපාය II අදියරේ 11C පර්යන්තයේ පාලන අංශය තුල නව අභ්‍යන්තර කටයුතු ඒකකයක් පිහිටුවීම හා ඒකකයේ ප්‍රධානී, සුපිළිපන්න නිලධාරීන්, අමාත්‍යාංශ අංශ නියෝජනය කරමින් සාමාජිකයින් හා සහාය කාර්යය මණ්ඩලය පත් කර ඇත. මහජන පැමිණිලි, යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට පැමිණිලි පෙට්ටියක්, විද්‍යුත් ලිපිනයක් හා වට්ස් ඇප් අංකයක් ලබාදීමට කටයුතු කිරීම.

2026 වර්ෂයේදී සිදු කිරීමට යෝජිත ක්‍රියාකාරකම්

- ❖ අමාත්‍යාංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඵලදායිතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම හා 2026 වසරේ ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා සහභාගිවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ❖ අමාත්‍යාංශයේ නිල නිවාස අළුත්වැඩියා අවසන් කිරීම. මේ සඳහා වැය වෙතැයි ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන නවයකි.

වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය

- ❖ වැවිලි සමාගම්හි බදු කුලී අයකිරිමේ ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය	(රු.මි.)
2025 වර්ෂයට ඇස්තමේන්තු කරන ලද බදු කුලිය	2,682.59
2025.09.30 දිනට වර්ෂයේ එකතු කරන ලද පසුගිය වර්ෂයට අදාළ හිඟ බදු කුලිය	200.43
2025.09.30 දිනට එකතු කරන ලද 2025 වර්ෂයට අදාළ බදු කුලිය	1,205.33
2025.09.30 දිනට එකතු කරන ලද මුළු බදු කුලිය	1,405.77

විගණන අංශය

- ❖ 2025.09.30 දිනට කළමනාකරණ විගණන කමිටු කාර්තුමය රැස්වීම් 3ක් පිළිවෙලින් 2025.01.07 හා 08, 2025.04.08, 09 හා 15 සහ 2025.07.17 හා 18 යන දිනයන්හීදි පවත්වා ඇත.
- ❖ අමාත්‍යාංශය මඟින් 2025.09.30 දිනට සිදු කරන ලද අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනයන් සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන/ විශේෂ පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව පහත පරිදි වේ.

ආයතනයේ නම	වාර්තා සංඛ්‍යාව
අමාත්‍යාංශය	11
වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය	01
තේරබර් හා පොල් වතු කැබලි කිරීම (පාලන) මණ්ඩලය	01
තේ ශක්ති අරමුදල	04
ශ්‍රී ලංකා කජු සංස්ථාව	02
තේ පර්යේෂණායතනය	01
තල් සංවර්ධන මණ්ඩලය	02
පොල් පර්යේෂණායතනය	01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය	02
කුළුබඩු හා ඒ ආශ්‍රිත නිශ්පාදන අලෙවි මණ්ඩලය	03

මූල්‍ය අංශය

මූල්‍ය ප්‍රගතිය 2025.09.30 දිනට

විස්තරය	කාණ්ඩය	අනුමත ප්‍රතිපාදන (රු.මිලි)	වියදම (රු.මිලි.)	අතැති බිල් (රු.මිලි.)
අමාත්‍ය කාර්යාලය	පුනරාවර්තන	78.00	29.08	
	ප්‍රාග්ධන	8.00	0.61	-
අමාත්‍යාංශය (පරිපාලන)	පුනරාවර්තන	1603.68	1066.36	
	ප්‍රාග්ධන	61.00	18.97	-

විස්තරය	කාණ්ඩය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
විශේෂ ව්‍යාපෘති (විදේශ ආධාර ලබන ව්‍යාපෘති ඇතුළත්ව)	ප්‍රාග්ධන	9,255.25	2,833.94	2,833.94	-
	පුනරාවර්තන	12.00	4.79	4.79	-
අනුබද්ධ ආයතන (දෙපාර්තමේන්තු ද, ඇතුළත්ව)	ප්‍රාග්ධන	2,005	978.82	-	-
	පුනරාවර්තන	3,245.13	2333.06	-	-

වැවිලි ක්ෂේත්‍රයේ කාර්යසාධනය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරිම 2025.09.30 දිනට ප්‍රගතිය

අංකය	අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නම	තීරණය	ප්‍රගතිය
02/2025	වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට පාත්‍ර වූ ගස් කපා හෙලීම වෙනුවෙන් ලබාදෙන වන්දි මුදල ඉහළ නැංවීම.	කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සහ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සමාන වැඩසටහන් යටතේ සංදේශයේ 3.0 අනුඡේදයෙහි නිර්දේශිත වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට සහ සංදේශයේ 3.0 ඡේදයේ 3.3 සහ 3.4 අනුඡේදයන්හි නිර්දේශිත පරිදි දීමනා ගෙවීම සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම පිළිබඳව ප්‍රථම කොට ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කොට එහිදී එකඟ වනු ලබන කරුණු මත පදනම්ව ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට එකඟතාව ලබා දී ඇත.	අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, රෝගයට ගොදුරු වූ එක් ගසක් කපා හෙලීම වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල රු.3000 සිට 10,000 දක්වා වැඩි කරන ලදී. එසේම එම රෝගයට ගොදුරු වූ පොල් ගසක් එන්නත් කරණය සඳහාද රු. 10,000.00 බැගින් ලබා දේ. ඊට අමතරව මෙම රෝග පාලන වැඩසටහන පාලනය කිරීම සඳහා තාවකාලිකව බඳවාගත් නිලධාරීන්ට ලබා දෙන දෛනික දීමනාව රු. 1700 සිට රු.3500 දක්වා වැඩි කරනු ලැබීය.
13/2025	තුරුසවිය අරමුදල වසා දමා එහි කාර්යය මණ්ඩලය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි පවතින පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීම.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සහ සංවර්ධන ඇමතිතුමාගේ 2025.03.05 දිනැති නිරීක්ෂණ , රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාගේ 2025.03.08 දින නිරීන්ෂණ සහ අමප/24/0103/612/009 පිළිබඳ වූ 2024.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ (i) ඡේදයේ පරිදි පත් කරන ලද නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති, සංදේශයට ඇමුණුම 1 ලෙස යාකොට තිබූ 2024.09.13 දිනැති වාර්තාව යනාදිය පිළිබඳ සාකච්ඡා කර බලා තුරුසවිය අරමුදල වසා දමා එහි කාර්ය මණ්ඩලය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන ව්‍යවස්ථාපිත ආයතනයන්හි අනුමත කාර්යමණ්ඩලය තුළ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිණිස පත් කිරීම සඳහා සහ එම තීරණය ක්‍රියාත්මක කිරීමේදී ඉහත නිලධාරී කමිටු වාර්තාවේ 3 ඡේදයේ සඳහන් 1 සිට 7 දක්වා වන නිර්දේශවල දැක්වෙනන ක්‍රමවේද අනුගමනය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තුරුසවිය අරමුදලේ කාර්ය මණ්ඩලය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන වල අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු සඳහා යොමු කර ඇත.
16/2025	1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වන වගන්තිය යටතේ සාදන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වන නියෝග සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම	නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම සඳහා සහ එම තීරණය පරිදි නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලබන කෙටුම්පත් නියෝග අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට යටත්ව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට	අදාළ සංශෝධන සිදු කර නීති කෙටුම්පත් සම්පාදක විසින් යොමු කර ඇති නියෝග සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බැවින් අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කර යොමු කරන

		ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.	ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දන්වා යවා ඇත.
23/2025	1956 අංක 11 දරණ රබර් පාලන පනත සංශෝධනය	රබර් පාලන පනත (සංශෝධන) පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සහ රජයේ ගැසට් පත්‍ර යේ පළ කරනු ලැබූ එකී පනත් කෙටුම්පත ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.
24/2025	තේ පර්යේෂණ ආයතනයේ "ශාන්ත කූම්බ්ස්" සහ "ශාන්ත ජෝකිම්" වතු සහ කර්මාන්තශාලා අතිනවීන තාක්ෂණය සහිත ආදර්ශ වතු සහ කර්මාන්තශාලා ලෙස සංවර්ධනය කිරීම.	මේ සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දීම සහ යෝජිත ව්‍යාපෘතිය තුළ ඇගයීමට හැකි වන පරිදි තනි ව්‍යාපෘති යෝජනාවක් වශයෙන් සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පියවර ගන්නා ලෙස වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වෙත නියම කිරීමට අනුමැතිය ලබා දුනි.	අමාත්‍යාංශයේ ඉල්ලීමට අනුව තේ පර්යේෂණ ආයතනය විසින් යොමු කර ඇති ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
25/2025	තේ වගාව පුනරුත්තාපනය උදෙසා තේ වගා කරුවන්ට පොහොර සහනාධාර ලබා දීම	සංදේශයේ 3.0 ඡේදයේ 3.1 අනුඡේදයෙහි යෝජිත පරිදි කටයුතු කිරීම පිණිස ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇත. තවද මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන ඇමතිතුමා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබ ඇති නිරීක්ෂණ වල අවධාරණය කරනු ලැබ ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කරමින් ඒ අනුව අවශ්‍ය පියවර ගෙන යෝජිත සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස ලේකම්තුමා වෙත නියම කර ඇත.	පොහොර බෙදා හැරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී
33/2025	ඌන උපයෝජිත ඉඩම් හා දේපළ ප්‍රශස්ථඋපයෝජනය සඳහා සුදුසු ආයෝජකයන් වෙත ලබා දීම	සංදේශයේ 3 ඡේදයේ 3.2 අනුඡේදයෙහි යෝජිත පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ඌන උපයෝජිත ඉඩම්/දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයන් වෙත බැහැර කිරීම සඳහා ප්‍රථම කොට නීති උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව, එකී උපදෙස් මත පෞද්ගලික ආයෝජකයන් පදනම්ව කළමනාකරණය සඳහා භාර දී ඇති ප්‍රාදේශීය වැවිලි සමාගම විසින් පාලනය කරනු ලබන ඌන උපයෝජිත ඉඩම් / දේපළ ප්‍රශස්ත උපයෝජනය සඳහා සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා සහ මහා භාණ්ඩාගාරය විමසමින්, සංදේශයේ 3 ඡේදයේ 3.3 අනුඡේදයෙහි යෝජිත පරිදි ප්‍රසම්පාදන කමිටුවක් සහ යෝජනා ඇගයීම් කමිටුවක් පත්	ප්‍රසම්පාදන කමිටුවක් සහ යෝජනා ඇගයීම් කමිටුවක් පත් කර ඇත.ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව විසින් ආයෝජකයින්ගෙන් අභිලාෂය කැඳවීමේ කටයුතු 2025.09.25 දින අවසන් කරන ලදි. EoI 483 ක් ලැබී ඇත. එහි ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.

		කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	
34/2025	කුරුඳු සංවර්ධන දෙපාර්තුමේන්තුව වෙත පවරනු ලැබ ඇති ගාල්ල ,පින්නදූව ජාතික කුරුඳු කර්මාන්ත සහ සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය(Cinnamon Gate) ව්‍යාපෘතිය ඉදිරියේදීත් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම	ගාල්ල, පින්නදූව ජාතික කුරුඳු කර්මාන්ත සහ සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ අදියර -1 හි අතැති බිල් වේ නම්, 2025 වර්ෂය සඳහා වෙන් කරනු ලැබ ඇති අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින්, නිසි ක්‍රමවේදය අනුගමනය කර ඒ සඳහා ගෙවීම් සිදු කිරීම සඳහාත්, ඉතිරි ප්‍රතිපාදන කුරුඳු ක්ෂේත්‍රයේ වගා සංවර්ධනයට යෙදවීම සඳහාත්, සංදේශයේ 3.0 ඡේදයේ 3.1 සහ 3.2 අනුඡේදයන්හි සඳහන් යෝජනා අතරින් රජයට වඩාත් වාසිදායක යෝජනාව හඳුනා ගැනීම පිණිස නිසි අධ්‍යයනයක් සිදු කර ඉදිරි කටයුතු කිරීමට අනුමැතිය ලැබී ඇත.	අවසාන බිල්පත ගෙවීමෙන් පසු ඉතිරි වේ යයි අපේක්ෂිත ප්‍රතිපාදන රු.මි 175 ට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය හා පුද්ගලික හවුල් සංචාරක ව්‍යාපෘතිය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂ ජනරාල් මුදල් අමාත්‍යාංශයේ ආයතනික කටයුතු අංශය වෙත යොමු කර ඇත.
47/2024	පොල් වගාව සඳහා මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර බෙදා හැරීම.	මුදල් හා ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන ඇමතිතුමාගේ සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග ඇමතිතුමාගේ නිරීක්ෂණ අනුව (i) සංදේශයේ නිර්දේශිත පරිදි ලෝක ආහාර වැඩසටහන යටතේ ලැබී ඇති මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර භාවිත කර පොල් පොහොර මිශ්‍රණයක් සකස් කර, එකී පොහොර මිශ්‍රණයේ පිරිවැය අයකර ගැනීමේ පදනම මත පොල් වගාකරුවන් වෙත බෙදා දීම සම්බන්ධයෙන් අදාළ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර තොගය මෙරටට පරිත්‍යාග කරන ලද රටෙහි මෙරට පිහිටි තානාපති කාර්යාලය වෙතින් සහ ලෝක ආහාර වැඩසටහනේ මෙරට නියෝජිත වෙතින් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය හරහා එකඟතාව ලබා ගැනීම.	අමාත්‍ය මණ්ඩල එකඟතාවය ලැබී ඇති අතර ඒ අනුව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අදාල ආයතන වෙත උපදෙස් ලබාදී ඇත.
53/2025	ජාත්‍යන්තර වෙළඳපොල ඉල්ලුම සපුරාලීම සඳහා රබර් ඉඩම් සිතියම්ගත කිරීම/ලියාපදිංචි කිරීමේ ඩිජිටල් පද්ධතිය ඵලදායී ලෙස යොදා ගනිමින් රබර් කර්මාන්ත අංශය නවීකරණය කිරීම	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තුමේන්තුව අතර අත්සන් තැබීම සඳහා සහ 2025 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු මඟින් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන තුළ කළමනාකරණය කරගැනීමට යටත්ව සංදේශයේ 3.0 ඡේදයේ 3.2, 3.3, 3.4 සහ 3.5 අනුඡේදයෙහි යෝජිත පරිදි කටයුතු කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.	ඒ අනුව, රබර් ඉඩම් සිතියම්ගත කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, 2025.08.27 වන දින ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර මැනුම් කටයුතු සිදුකරමින් පවතී.

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයවල 2025.09.30 දිනට ප්‍රගතිය
වැවිලි අංශය

තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලය

දැක්ම

තේ, රබර් සහ පොල් වගාවන් සුරක්ෂිත කිරීම මඟින් සෞභාග්‍යමත් ආර්ථිකයක්

මෙහෙවර

තේ, රබර් සහ පොල් වතු ආරක්ෂා කිරීම මගින් වැවිලි කර්මාන්තයේ ඵලදායීතාවය, ලාභදායීතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීමට සහය ලබාදීම.

2025.01.01 සිට 2025.09.30 දක්වා ප්‍රගතිය

අයදුම්පත් ලැබීම	සංඛ්‍යාව
පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන	11
2025.01.01 දිනට ඉදිරියට ගෙන ආ අයදුම්පත්‍ර	191
2025.01.01 දින සිට 2025.09.30 දක්වා ලැබුණු අයදුම්පත්‍ර	555
2025.09.30 දක්වා ලද මුළු අයදුම්පත් ගණන	746
පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණන	438
පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල මගින් අනුමත කරන ලද අයදුම්පත් ගණන	314
ප්‍රතික්ෂේප කරනලද අයදුම්පත් ගණන	41
ක්ෂේත්‍ර පරීක්ෂණ/ නීති උපදෙස් / වාර්තා ලබා ගැනීමට තීරණය වූ අයදුම්පත් ගණන	36
පනතට අදාල නොවන අයදුම්පත් ගණන	33
අභියාචනා තීරණ මත අනුමැතිය ලබා දුන් අයදුම්පත්	10

දිස්ත්‍රික්ක අනුව ලැබී ඇති අයදුම්පත්

විස්තරය	සංඛ්‍යාව
කුරුණෑගල දිස්ත්‍රික්කය	248
පුත්තලම දිස්ත්‍රික්කය	200
ගම්පහ දිස්ත්‍රික්කය	103
ඉහත දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්ක	195
ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව	746
වාර්තා ලබා ගැනීමට යොමුකර ඇති සහ අසම්පූර්ණ අයදුම්පත්	301
පැවරීම අනවශ්‍ය බව දන්වන ලද අයදුම්පත් ගණන	7

ඉඩම් ඒකක අනුව අයදුම්පත් ලැබීම

ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව	පවරනු ලබන ආකාරය	ඉල්ලුම් කළ ප්‍රමාණය			අනුමැතිය ලබාදුන් ප්‍රමාණය		
		අක්.	රූඩ්.	පර්.	අක්.	රූඩ්.	පර්.
109	තනි ඒකක	1,670	3	35.67	1,109	0	20.20
125	බැංකු උකස්	2,891	2	0.32	2,569	3	22.11
512	අනෙකුත් පැවරීම්	8,169	3.23	14.65	4,528	1	11.85
746	**එකතුව**	**12,732**	**0.23**	**10.64**	**8,207**	**1**	**14.16**

භෝග වර්ගයන්ට අනුව අයදුම්පත් ලැබීම

භෝග වර්ගය	අයදුම්පත් ගණන	භූමි ප්‍රමාණය (ඉල්ලුම් කරන ලද)		
		අක්.	රූඩ්.	පර්.
පොල්	537	8,597	0	9.24
රබර්	36	627	3	4.11
තේ	32	1,776	2	24.25
වෙනත්	141	1,730	2.23	13.04
එකතුව	**746**	**12,732**	**0.23**	**10.64**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ (සිලෝන් ටී) "වඩාත් ප්‍රියතම පානය " බවට පත් කිරීම.

මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මඟින් රටට ලැබෙන විදේශ විනිමය ඉපැයීම් වර්ධනය කිරීම හා එමඟින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2023.09.30 දිනට ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	වෙන් කළ මුදල (රු.මි.)	වැය කළ මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය (සැප්තැම්බර් 30 වන දිනට)
01.	පොහොර සහනාධාර ලබා දීම	3,370.00	563.80	නියමිත පොහොර තොග බෙදා හැර ඇත. අදාළ බිල් පත් පරීක්ෂාවෙන් පසු පොහොර සමාගම් වෙත ඉතිරි මුදල් ගෙවීමට නියමිතය.
02.	සෘජු තේ වගා ව්‍යාපෘතිය	20.00	3.22	පැළ 120,000 ක් සඳහා සහනාධාර ලබා දී ඇත.
03.	තේ කම්හල් නවීකරණ සහනාධාර ක්‍රමය (පැරණි)	4.00	4.10	තේ කම්හල් 8 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇත.
04.	ප්ලාස්ටික් කූඩ/ලණු ගෝනි සඳහා සහනාධාර ව්‍යාපෘතිය	14.00	3.00	ප්ලාස්ටික් කූඩ 700 ක් හා ලණු ගෝනි 1935 ක් සඳහා ගෙවීම් කර ඇත.
05.	සුහුරු දළු නෙලන්නන්ගේ කණ්ඩායම් ඇති කිරීම	20.00	1.61	කණ්ඩායම් 5 ක් පුහුණු කර අවසන් කර ඇත.
06.	තේ පැළ තවාන් ව්‍යාපෘතිය	30.00	6.7	තවාන් 60 ක පළමු හා දෙවන අදියර සම්පූර්ණ කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 30 ක් වෙන් කළ අතර, තවාන් 25 ක් සඳහා පළමු හා දෙවන අදියර අවසන් කර ඇත, තවත් තවාන් 5 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරීමට ඇත.
07.	අතින් සාදන ලද තේ නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා තේ වියලුම් යන්ත්‍ර ලබාදීමේ ව්‍යාපෘතිය	5.00	2.60	තේ වියලුම් යන්ත්‍ර 14 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කර ඇත.
08.	තේ නැවත වගාව අඛණ්ඩව පවත්වා ගෙන යාම.	10.00	6.90	හෙක්ටයාර 14.46 ක වගා කටයුතු සිදු කර ඇත.
09.	තේ කර්මාන්තශාලා සහ ගබඩා සඳහා සූර්ය බලශක්ති ස්ථාපනය සඳහා පොළී සහනාධාරය	15.00	6.29	තේ කර්මාන්තශාලා 35 ක් සහ ගබඩා 2 ක් සඳහා මුදල් ලබා දී ඇත.
10.	තේ අපනයනකරුවන් සඳහා මිලදී ගනු ලබන නවීන යන්ත්‍රෝපකරණ වෙනුවෙන් පොළී සහනාධාර ලබා දීම	20.00	11.80	අපනයනකරුවන් 10 දෙනෙකු සඳහා පොළී සහනාධාර ගෙවා ඇත.

11.	"B Leaf 60" වැඩසටහන සඳහා ජාතික වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	25.00	1.18	දැනුවත් කිරීමේ වැඩසටහන් 9 ක් සහ ව්‍යාප්ති නිලධාරීන් 138 ක් පුහුණු කිරීම සිදු කර ඇත.
12.	වෙළෙඳ ප්‍රදර්ශන සහභාගිත්වය සඳහා වූ 50% සහනාධාරය	100.0	90.98	වෙළඳ ප්‍රදර්ශන 10 ක් සඳහා මිලියන 90.98 ගෙවා ඇත.

2025 වර්ෂයේ තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කළ වෙනත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

- තේ වගාවේ සශ්‍රීකත්වය උදෙසා වගා කරුවන්ට සහන මිලට පොහොර ලබාදීමේ කැබිනට් මණ්ඩල යෝජනාවට අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2025 වර්ෂයේදී, පොහොර සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 2000ක් වෙන් කරන ලද අතර, ලියාපදිංචි පොහොර සමාගම් සමග ඒකාබද්ධව QR කේතයක් මඟින් පොහොර බෙදා දීමේ කටයුතු සිදු කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ සමාරම්භය කුඩා තේ වතු හිමියන්ට QR කේත නිකුත් කරමින් 2025 සැප්තැම්බර් 26 දින ආරම්භ විය.
- අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ තේ අංශය සඳහා වූ පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙන ලදී.
- සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවයට පසුව තේ කම්හල්වල සාදන මුල්ම අස්වැන්නේ කොටසක් ආගමික ශාස්තෘන්වරුන්ට පූජා කිරීම උදෙසා පවත්වන බහු ආගමික උත්සවයක් වන 'නැවුම් තේ මංගල්‍යයේ' ප්‍රධාන රාජ්‍ය උත්සවය ගරු වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මුතියංගණ රාජ මහා විහාරයේ දී පැවැත්විණි.
- ශ්‍රී ලංකා තේ කර්මාන්තය වඩාත් විධිමත් නව තාක්ෂණය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම උදෙසා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය හා මඟ පෙන්වීම යටතේ තේ අංශයට අදාළ පරිගණක හා ජංගම යෙදවුම් (Mobile Apps) නිර්මාණය කිරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මුලිකත්වය ගෙන ක්‍රියා කරන ලදී.

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු . මිලි)	**2025.09.30** දිනට මූල්‍ය ඉලක්කය	අක් මුදල් ලැබීම් (රු . මිලි)	වියදම් (රු . මිලි)	අතැති බිල් (රු . මිලි)
ප්‍රාග්ධන	ස්වයං ඉපැයීම්	1,041.00	516.18	-	318.90	6.34
	ප්‍රචාරණ හා වෙළඳ බදු	4,906.00	2,141.00	-	712.50	-
පුනරාවර්තන	ස්වයං ඉපැයීම්	678.45	466.67	-	375.86	-

2026 වර්ෂයේදී තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරිම වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති

❖ තේ ඉඩම් සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහතිකය ලබා දීම.

- තේ වගාකරුවන්ට යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සඳහා වූ දැනුවත් කිරීම් සිදු කොට ඔවුන් ඒ වෙනුවෙන් යොමු කිරීම හා දිරිගැන්වීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩමුළු 100 ක් සිදු කිරීම.
- ඊට සමගාමීව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් සහ සහතික කරන ඒකකයක් පිහිටු වීම සඳහා අවශ්‍ය මුලික ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත.

❖ සන්නාමය ප්‍රවර්ධන සහනාධාරය සඳහා වූ ව්‍යාපෘතිය (2025/2026)

- සිංහ ලාංඡනය සන්නාමය සහිත තේ ප්‍රවර්ධනය කිරීම සඳහා තේ අපනයනකරුවන්ට 50% ක මුල්‍ය සහනාධාරයක් ලබා දීමට යෝජිත මෙම ව්‍යාපෘතිය 2025/2026 ද්වි වාර්ෂික ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබු අතර, 2026 වසරේ දී අදාළ සන්නාම ප්‍රවර්ධන වියදම් දැරීමට නියමිතය. මේ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුපියල් මිලියන 750 ක් මුදලින් වෙන් කර ඇත.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

දැක්ම

තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතමයා වෙමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම සඳහා අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම ලබාදෙමින් ලොව ප්‍රමුඛතම තේ නිෂ්පාදකයා බවට පත්වීම.

මෙහෙවර

තේ නිෂ්පාදනයේ ඵලදායිතාවය සහ ගුණාත්මය වඩාත් ලාභදායී ලෙස ඉහළ නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය වැඩිදියුණු කිරීම, හඳුන්වාදීම සහ ව්‍යාප්ත කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ විශේෂ ව්‍යාපෘතිවල 2023.09.30 දිනට ප්‍රගතිය

❖ **බෝග වැඩිදියුණු කිරීම**

- පහතරට කලාපය සඳහා TRI 5000 කාණ්ඩයේ ප්‍රභේද 07 ක් හඳුනාගෙන ඇති අතර, එම ප්‍රභේද වගාකරුවන්ට නිර්දේශ කිරීමට අවසන් වාර්තාව තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇත.

- නිර්දේශිත නව ප්‍රභේදවලට නියමිත ප්‍රමිතියෙන් යුත් රෝපණ ද්‍රව්‍ය අඛණ්ඩව තේ වගාකරුවන් වෙත සැපයීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණ (මව් වගාවන් / බීජ උද්‍යාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම) සකස් කරන ලදී. ඒ අනුව, විශේෂිත සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස බීජ උද්‍යාන සහ මව් වගාවන් ස්ථාපිත කිරීමත් පවත්වාගෙන යාමත් තවදුරටත් සිදු කරමින් පවතී.

- නව ප්‍රභේද නිපදවීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පටක රෝපණ, ප්‍රේරිත විකරණ (Induced mutations) හා අනුක විද්‍යාත්මක ක්‍රමවේද භාවිතයට ගැනීම සම්බන්ධ පර්යේෂණ ද මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර, ඒ සඳහා පටක රෝපණ විද්‍යාගාර පර්යේෂණ 02ක්, ප්‍රේරිත විකිරණ (Induced mutations) විද්‍යාගාර පර්යේෂණ 01ක්, ක්ෂේත්‍ර ඇගයුම් පර්යේෂණ 02 ක් මේ වන විට සිදු කෙරෙමින් පවතී.

- විශේෂිත හා ශිල්පීය තේ ප්‍රභේද හඳුන්වාදීමේ අනුවර්තී ක්ෂේත්‍ර ඇගයුම් පර්යේෂණ 04 ක් සහ ප්‍රාදේශීය වැඩමුළු 4 ක් මේ දක්වා පවත්වා ඇත.

- තේ වගාව සිදුකරන ප්‍රධාන වගා කලාප 4 සඳහා නව ප්‍රභේද නිපදවීමට දීර්ඝ කාලීන ක්ෂේත්‍ර ඇගයීම් පර්යේෂණ සිදුකරන ලද අතර ඒ අනුව, ක්ෂේත්‍ර ඇගයීම් පර්යේෂණ 36ක් සහ දෙමුහුම් (crosses) 1000 ක සංඛ්‍යාවක් සිදු කරන ලදී.

❖ **ඉඩම් ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ බෝග කළමනාකරණය**

- ජෛව පොහොර සහ ජෛව ශාක වර්ධක උත්තේජක පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති 07ක් දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර, මේ වසරේ දී අවසන් කිරීමට අපේක්ෂිතය.

- කාබනික පොහොර පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස නව පුනරුත්ථාපන තෘණ වර්ග පිළිබඳ පර්යේෂණ 03ක් සහ ස්ථානීය ඩොලමයිට් නිර්දේශ හඳුන්වාදීම පිළිබඳ පර්යේෂණයක් තවදුරටත් සිදු වෙමින් පවතී.

- නව සෙවන ශාක පිළිබඳ පර්යේෂණ 05ක් සිදු කෙරෙමින් පවතින අතර, එක් නව සෙවන ශාක විශේෂයක් වන ඩෙරිස් සඳහා මාර්ගෝපදේශයක් වගාකරුවන් වෙත නිකුත් කරන ලදී.

- තෝරා දළු නෙලන යන්ත්‍ර පිළිබඳ පර්යේෂණ ක්‍රියාත්මක අතර, මේ යටතේ නව අනුරූ නිර්මාණය, අත්හදා බැලීම සහ වානිජ මට්ටමේ නිෂ්පාදනය පිළිබඳව සමාගමක් සමඟ ගිවිසුම්ගතව කටයුතු සිදු කෙරෙමින් පවතී.

- දැව අළු (factory wood ash) ශාක පෝෂකයක් ලෙස භාවිතය පිළිබඳ පර්යේෂණ ද, කෘෂි රසායන, පොහොර සහ යන්ත්‍ර ඇගයුම් කමිටුව (ACMSC) මඟින්, ඉල්ලීම් මත සිදු කරන ඇගයීම් ද, පාංශු හා ජල සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳ පර්යේෂණයක් ද දැනට සිදු වෙමින් පවතී.

❖ **බෝග ආරක්ෂණය**

- ජෛව පළිබෝධ නාශක (Trichoderma සහ Pseudomonas) තේ වගාවේ රෝග පාලනයට නිර්දේශ කිරීම සම්බන්ධ පර්යේෂණ කටයුතු අවසන් වෙමින් පවතින අතර, මෙම නිෂ්පාදනය වාණිජකරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

- ජෛව පළිබෝධ නාශකයක් ලෙස (Metarhizium) තේ වගාවේ වේයන් පාලනයට නිර්දේශ කිරීමේ පර්යේෂණ කටයුතු අවසන් කර ඇති අතර, වාණිජකරණය සඳහා කටයුතු සිදුකරමින් පවතී.

- තවාන් පස් ධූමකරණය සඳහා Metham sodium soil fumigent සාපල්‍යතාවය පරීක්ෂා කිරීම සම්බන්ධ අධ්‍යයනයන් අවසන් කර ඒ සම්බන්ධ නිර්දේශ නිකුත් කර ඇත.

❖ **පිරිසැකසුම් තාක්ෂණය සහ අගය එකතු කිරීම**

තේ යන්ත්‍රෝපකරණ සහ කර්මාන්තශාලා තත්ත්වයන් වැඩිදියුණු කිරීම

- තේ සැකසුම් තාක්ෂණය සහ කර්මාන්තශාලා මෙහෙයුම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් ක්‍රියාත්මක වන තේ නිෂ්පාදන ක්‍රියාවලියෙහි ගුණාත්මක භාවය හා ඉන්ධන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම අරභයා නිෂ්පාදන පියවර ස්වයංක්‍රීකරණය (Factory automation) අරමුණු කරගත් පර්යේෂණ 02 ක් දැනට සිදු කරමින් පවතී.

- නව ප්‍රභේදවල නිමි තේ ගුණාත්මය ඇගයීම සම්බන්ධ කටයුතු ජෛව රසායන සහ පිරිසැකසුම් තාක්ෂණ අංශය එක්ව සිදු කරමින් පවතින අතර, ඒ අනුව දළු සාම්පල 07 ක සහ නිමි තේ සාම්පල 06 ක (biochemical analysis) විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී.

- නිමි තේ නිෂ්පාදනයේදී බාහිරින් ආගන්තුක ද්‍රව්‍ය එක් කොට ඇත්දැයි (adulteration) නිවැරදිව නිර්ණය කිරීම සඳහා ක්‍රමවේදයන් සංවර්ධනයට අවශ්‍ය අධ්‍යයනයන් ද සිදු කරමින් පවතී.

- විවිධ ශ්‍රී ලාංකික තේ ප්‍රභේද, තේ ශ්‍රේණි සහ විවිධ සැකසුම් ක්‍රම මඟින් නිපදවන ලද තේවල සෞඛ්‍ය ප්‍රතිලාභ හඳුනා ගැනීම පිළිබඳ පර්යේෂණ සිදු කරමින් පවතී.

- තේ සෝස් වානිජකරණ ක්‍රියාවලිය සිදුකිරීමට නියමිත අතර තේ ආශ්‍රිත ක්ෂණික පාන (Ready to drink) හඳුන්වාදීම සම්බන්ධ පර්යේෂණයක් ද, මෙයොනීස් (tea infused mayonnaise) නිපදවීම සහ එහි ගුණාත්මක සහ සංයුතිය ප්‍රශස්තිකරණය කිරීමේ වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක වෙමින් පවතී.

❖ **සමාජ ආර්ථික සම්පත් සැලසුම්කරණය සහ උපදෙස් සහ ව්‍යාප්ති සේවා**

- ඩිජිටල් / නවීන තාක්ෂණික සන්නිවේදන ක්‍රමවේද (ජංගම දුරකථන යෙදවුම්, යූ ටියුබ්, වීඩියෝ, AI තාක්ෂණය භාවිතය) යටතේ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 55 ක්, 1400 ක හෝ සහභාගීත්වයෙන් යුතුව සිදු කරන ලදී.

- වසරේ පළමු භාගය තුළ දී, දත්ත පද්ධතියට වතු 20 ක දත්ත ඇතුළත්කිරීම, උපදේශන සංචාර 245ක් තාක්ෂණික වාර්තා 450 ක් නිකුත් කිරීම සහ වාණිජ තේ තවාන් 74ක් නිරීක්ෂණය කිරීම ද සිදු කරන ලදී.

- තේ පර්යේෂණ ආයතනයේ ජංගම දුරකථන යෙදවුම භාවිතා කරන්නන් ප්‍රමාණය 4295 ද යූ ටියුබ් වීඩියෝ උඩුගත කිරීම් 05ක් ද, වට්ස් ඇප් සමූහ 02 ක් සඳහා අන්තර්ගතයන් 34ක් නිර්මාණය සහ බෙදාහැරීම ද, ෆේස්බුක් පිටුව සඳහා 5000ක් (Likes) සහ 8000 (Followers) සමූහයක් එක් කර ගැනීමට

ද මේ කාලය තුළ දී හැකි වී ඇති අතර දුරකථන මධ්‍යස්ථානය හරහා ලබා දුන් සේවා සංඛ්‍යාව 530 ක් වන අතර කෙටි පණිවිඩ 14ක් නිකුත් කරන ලදී.

- ප්‍රාදේශීය තාක්ෂණික ව්‍යාප්ති රැස්වීම් 7 ක්, ප්‍රදර්ශන/බෝග සායන/ ක්ෂේත්‍ර දින 12ක්, ජංගම විද්‍යාගාර සේවා 10ක් සහ නියැදි පරීක්ෂාව සඳහා සාම්පල 850 ක ප්‍රමාණයක් (පී එච් අගය සහ කාබන් ප්‍රමාණය) විශ්ලේෂණය කිරීම සිදු කර ඇත.

- වගාකරුවන්ට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා යාවත්කාලීන කරන ලද උපදෙස් චක්‍රලේඛ, මාර්ගෝපදේශ, ත්‍රෛභාෂාවෙන් සකස් කරන ලද පොත්, පත්‍රිකා පාර්ශවකරුවන්ට බෙදාහැරීම යටතේ ග්‍රන්ථ 02ක් (තේ වගා අත්පොත - දමිළ පරිවර්තනය සහ වල් පැළෑටි පිළිබඳ මාර්ගෝපදේශය) උපදෙස් පත්‍රිකා - 03ක්, පොත් පිංච 3 ක් සකස් කරමින් පවතී.

- විශේෂිත හා ශිල්පීය තේ නිපදවීමේ ක්‍රියාවලීන් පිළිබඳව කලාපීය මට්ටමින් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමට 120 කට ආසන්න පිරිසකට ප්‍රයෝගික වැඩමුළු 04 ක් පවත්වන ලදී.

- යාන්ත්‍රිකරණය පිළිබඳව තේ වගාකරුවන් දැනුවත් කිරීමේ හා ඒ සඳහා දිරිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින අතර, ඉදිරියේදී උඩරට කලාපය සඳහා වැඩමුළු පැවැත්වීමට සැලසුම් කර ඇත.

❖ **පාර්ශවකරුවන් වෙත දැනුම සහ තාක්ෂණය බෙදා හැරීම**

- පාර්ශවකරුවන් වෙත සපයනු ලබන විශ්ලේෂණ සේවාවන් සහ වෙනත් සේවාවන් තවදුරටත් මේ වසර තුළ දී ද පවත්වාගෙන යනු ලබයි.

- මේ වසරේ මේ දක්වා පී එච් (pH) පරීක්ෂණ, පාංශු පෝෂක විශ්ලේෂණ 15,000ක් (පාංශු, දළු සහ පොහොර සාම්පල 7500 ක්) සිදු කරන ලද අතර, නිමි තේ සාම්පලවල ජෛව රසායනික පරීක්ෂාවන් 55ක්, මූල පිෂ්ඨය පරීක්ෂා කිරීම් 18ක්, නෙමටෝඩාවන් සඳහා පාංශු පරීක්ෂාවන් 75ක්, නිමි තේ සාම්පල සඳහා ක්ෂුද්‍ර ජීවී පරීක්ෂාවන් 12 ක් ද සිදු කරන ලදී.

❖ **පර්යේෂණ ප්‍රදාන සහ ජාත්‍යන්තර අවබෝධතා ගිවිසුම්**

- ජාත්‍යන්තර සහ ජාතික මට්ටමේ පර්යේෂණ ආයතනයන්, විශ්වවිද්‍යාල සමඟ සහයෝගී පර්යේෂණ සඳහා දැනුම සහ තාක්ෂණය හුවමාරුව සඳහා සහයෝගීතා ගිවිසුම්වලට එළැඹීමත්, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ සඳහා මූල්‍යමය ආධාර ලබා ගැනීමට පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ලබාගත් මූල්‍යමය ප්‍රතිපාදන ඔස්සේ ද, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සිය පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මෙහෙයවීම පහත පරිදි සිදුකරනු ලබයි.
- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානියේ කිව් රාජකීය උද්‍යානය සහ බ්‍රිස්ටල් විශ්වවිද්‍යාලයේ සහයෝගීත්වයෙන් නියඟ තත්ත්වයන් යටතේ තේ වගාවට ඔරොත්තු දීමට ඇති හැකියාව මැන බැලීම සම්බන්ධ පරාමිතීන් නිර්මාණය කර ගැනීම සම්බන්ධ අධ්‍යයනයක් සිදු කිරීම.
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාදන වෙන්ව ව්‍යාපෘති 7 ක් ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය 2025/2026 වසරවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

❖ **ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපාය මාර්ගික සැලැස්ම (2025-2029) සැලැස්ම සකස් කරන ලදී.**

❖ **සියවස් සැමරුම සහ ප්‍රචාරක වැඩසටහන්**

- ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සියවස් සැමරුමට සමගාමීව මේ වසර තුළ විවිධ මට්ටමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. (සියවස් සැමරුම් වැඩසටහන් මාලාවේ අවසන් වැඩසටහන ලෙස අන්තර්ජාතික තේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2025 නොවැම්බර් මස 10 සහ 11 දිනයන් හි දී කොළඹ දී පැවැත්වීමට කටයුතු සූදානම් වෙමින් පවතී)

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මිලි)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මිලි)	අක් මුදල් ලැබීම් (රු.මිලි)	වියදම (රු.මිලි)	අතැති බිල් (රු.මිලි)
ප්‍රාග්ධන	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	-	-	-	-	-
	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන	100.000	91.450	25.319	28.676	5.02
පුනරාවර්තන		605.000	465.487	415.952	382.710	8.97
උත්පාදිත ආදායම (රු.මිලි) ප්‍රාග්ධන					1.8	4.1
උත්පාදිත ආදායම (රු.මිලි) පුනරාවර්තන					0	1.65

2026 වර්ෂයේ තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති

1. නව තේ ප්‍රභේදවල ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වගාකරුවන් අතර බෙදා හැරීමට මව් වගාවන්හි වපසරිය වැඩි කිරීම (2022-2027)
2. කෙටි කාලීන නියඟ ආතතියට තේ පැළවල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි ශාක පාදක ද්‍රව්‍ය නිෂ්පාදනය කර සංවර්ධනය කිරීම (2025-2027)
3. ශාක පෝෂ්‍ය මූල ද්‍රව්‍යවල නැනෝ අංශුවලින් පොහොසත් ජෛව අඟුරු සංකීර්ණ පිළිබඳ විමර්ශනය සහ ඒවා මඟින් තේ පැළ වර්ධනයට සහ පසෙහි ගුණාත්මකභාවයට සිදු වන බලපෑම් පිළිබඳ විමර්ශනය කිරීමේ ව්‍යාපෘතිය (2025 – 2029)
4. තේ වතුවල ඵලදායිතාවය ඉහළ නැංවීමට සහ දේශගුණික විපර්යාසවලින් සිදුවන බලපෑම අවම කිරීමට උපාය මාර්ගයක් ලෙස පාංශු සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පාංශු සංශෝධනයක් ලෙස ජීව අඟුරු (Biochar) භාවිතය (2025-2027) සුලභ කිරීම.
5. ඕතඩෝක්ස් රෝටර්වෙන් තේ නිෂ්පාදනය කරන තේ කර්මාන්තශාලාවල වැඩ පරිසරය (Working Environment) වැඩිදියුණු කිරීම සඳහා දූවිලි ඉවත් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම (2026)

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

දැක්ම

ආර්ථික හා සමාජයීය වශයෙන් තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක් බිහිවීම.

මෙහෙවර

විශිෂ්ඨතම උපකාරක සේවා සැපයීම තුලින් කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාව සහ ගුණාත්මය වර්ධනය කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්ම තුළ වූ විශේෂ ව්‍යාපෘති / ක්‍රියාකාරකම්හි ප්‍රගතිය 2025.09.30 දිනට

සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

- **තේ නැවත වගා සහනාධාර ක්‍රමය**

නැවත වගා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා හෙක්ටයාර 01 කට රු.630,000.00 බැගින් අදියර 5 කින් ගෙවීම් කරනු ලැබේ.

ව්‍යාපෘතිය	ක්‍රියාකාරකම	ඒකකය	භෞතික ඉලක්කය	මූල්‍ය ඉලක්කය (රු.මිලි.)	ප්‍රගතිය	
					භෞතික	මූල්‍ය (රු.මිලි.)
නැවත වගාව	බිම් සැකසීම හා පස පුනරුජ්තාපනය I (2025 අවසරපත්‍ර)	හෙක්	1030	236.900	350.1	39.629
	පස පුනරුත්ථාපනය I (පෙර වර්ෂ වල ක්‍රියාකාරකම්)		172	8.600	145.8	7.249
	පස පුනරුත්ථාපනය II(පෙර වර්ෂයන්හි බැදිම් ඇතිකරගත්)		350	70.000	308.0	56.858
	පැළ සිටුවීම(පෙර වර්ෂයන්හි බැදිම් ඇතිකරගත්)		520	72.800	334.1	39.105
	වසරකට පසු නඩත්තුව(පෙර වර්ෂයන්හි බැදිම් ඇතිකරගත්)		619	37.140	619	32.671

- **තේ නව වගාව**

තේ නව වගා ක්‍රියාකාරකම් සඳහා හෙක්ටයාර 01 කට රු.390,000.00 බැගින් අදියර 3 කින් ගෙවීම් කරනු ලැබේ.

ව්‍යාපාතිය	ක්‍රියාකාරකම	ඒකකය	භෞතික ඉලක්කය	මූල්‍ය ඉලක්කය (රු.මිලි.)	ප්‍රගතිය	
					භෞතික	මූල්‍ය (රු.මිලි.)
නව වගාව	බිම් සැකසීම	හෙක්	70	9.800	42.83	4.375
	පැළ සිටුවීම		70	17.500	40.12	5.785
	වසරකට පසු නඩත්තුව(පෙර වර්ෂයන්හි බැදිම් ඇතිකරගත්)		192	9.600	143.29	6.406

- **තේ පාළු පැල සිටුවීම - තේ වගා පුනරුත්ථාපනය**

පාළු පැළ සිටුවීම සඳහා අදියර දෙකක් යටතේ එක් පැළයකට රු.100 ක් බැගින් වූ සහනාධාර මුදලක් 2025 වර්ෂයේ අවසරපත්‍ර සඳහා ගෙවනු ලබයි.

ව්‍යාපෘතිය	ක්‍රියාකාරකම	ඒකකය	භෞතික ඉලක්කය	මූල්‍ය ඉලක්කය (රු.මි.)	ප්‍රගතිය	
					භෞතික	මූල්‍ය (රු.මි.)
පාළු සිටුවීම - භෝග පුනරුත්ථාප නය	පාළු සිටුවීම (2025 අවසරපත්‍ර)	පැළ	2,000,000	200.000	573,708	35.250
	අදියර II (පෙර වර්ෂයන්හි බැදීම් ඇතිකරගත්)		1,028,000	25.700	996,790	22.039

❖ **තේ නැවත වගා සහනාධාර ලබාදීමේ බලපෑම තක්සේරු කිරීම**

- රාජ්‍ය සහනාධාර මත කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සිදුකරන ලද තේ නැවත වගාවේ ඇස්වැන්න කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ නියැදි සමීක්ෂණයක් සිදුකිරීම යටතේ සාම්පල් 607 ක් පරික්ෂා කිරිම සඳහා රු.මි. 0.200 ක් ඇස්තමේන්තු කර ඇත. 2025.09.30 දිනට 50% ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන වෙනත් විශේෂ ක්‍රියාකාරකම්වල 2025.09.30 දිනට ප්‍රගතිය

ව්‍යාප්ති ක්‍රියාකාරකම්

❖ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් ගාල්ල, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල 4000 ක් සී.අයි.සී ආයතනය මඟින් ද කළුතර, කෑගල්ල, මහනුවර දිස්ත්‍රික්කවල ගොවීන් 3000 ක් ඉලක්ක කර 2025.09.30 දිනට එම වැඩසටහන් 7000 ක් අවසන් කර ඇත.

❖ ආදර්ශන වගා ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම යටතේ වගා ආදර්ශන 414 ක් වෙනුවෙන් රු.මි.2.0 ක් වෙන්කර එයින් තවාන් 414 ක වැඩ අවසන් කර රු.මි. 0.086 වැය කර ඇත.

❖ මව් වගා සහ බීජ තවාන් සංවර්ධනය කිරීම යටතේ තවාන් 29 ක් අවසන් කර රු.මි. 3.442 ක් වැය කර ඇත.

❖ PH සාම්පල් පරීක්ෂාව යටතේ සැලසුම් කළ 41,400 න් 6050 ක් නිමකර ඇත.

❖ 2025.09.30 දිනවන විට ආයතනික තේ තවාන් 10 කින් පැළ 900,150 ක් නිපදවා ඇති අතර වාණිජ පැළ තවාන් 1,130 ක් මඟින් පැළ 45,000,000 ක් නිපදවා ඇත.

කුඩා තේ වතු හිමියන්ගේ සමිති ක්‍රියාකාරකම්

❖ වැඩසටහන් 16 ක් සැලසුම් කර එයින් 6 ක් අවසන් කර ඇත. රු.මි. 0.9 ක් වැය කර ඇත.

ආයතනික සේවකයන් සඳහා වෘත්තිය පුහුණු ක්‍රියාකාරකම්

❖ මේ යටතේ වැඩසටහන් 18 ක් සැලසුම්කර, 2025.06.30 දින වන විට 8 ක් නිමකර රු.මි. 0.5 ක් වැයකර ඇත.

කුඩා තේ වතු හිමියන්ගේ සමිති ක්‍රියාකාරකම්

❖ වැඩසටහන් 21 ක් සඳහා රු.මි. 3.676 ක් ඇස්තමේන්තු කර එයින් වැඩසටහන් 21 ක් අවසන් කර ඇත. මූල්‍ය ප්‍රගතිය රු.මි. 1.050 කි.

2025 වර්ෂයේ තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කළ වෙනත් විශේෂ වැඩසටහන්

1. "Silver Tips Tea Cultivation" විශේෂ ව්‍යාපෘතිය යටතේ ගොවියෙකුට පැළ 200ක් බැගින් ගොවින් 450කට පැළ 90,000 ක් බෙදා දීමට සැලසුම් කර ඇත.මේ සඳහා වැයවීමට අපේක්ෂිත මුදල රු.මි.9.85 කි.
2. පොහොර බෙදා දීමේ ව්‍යාපෘතිය - 2025.09.30 දිනට ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	T-200 කි.ග්‍රෑම් 50 මිටි	T-65 කි.ග්‍රෑම් 50 මිටි	T-750 කි.ග්‍රෑම් 50 මිටි	U-709 කි.ග්‍රෑම් 50 මිටි	U-834 කි.ග්‍රෑම් 50 මිටි	එකතුව කි.ග්‍රෑම් 50 මිටි
ගාල්ල	6,038	214	27,921	18,590	5,849	**58,612**
කළුතර	3,401	70	20,053	16,889	3,134	**43,547**
මහනුවර	1,246	293	1,113	13,734	5,295	**21,681**
කෑගල්ල	1,336	75	1,780	8,042	2,094	**13,327**
මාතර	2,753	108	14,249	19,856	3,654	**40,620**
නුවරඑළිය	875	121	1,401	9,712	1,357	**13,466**
රත්නපුර	1,670	388	3,648	23,731	3,156	**32,593**
ඌව	1,372	249	600	14,863	19,380	**36,464**
එකතුව	**18,691**	**1,518**	**70,765**	**125,417**	**43,919**	**260,310**

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මිලි)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මිලි)	අක් මුදල් ලැබීම් (රු.මිලි)	වියදම (රු.මිලි)	අතැති බිල් (රු.මිලි)
ප්‍රාග්ධන	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	2.00	-	2.00	2.00	-
	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන	798.00	519.657	289.01	274.93	105.87
පුනරාවර්තන		588.37	441.28	380.87	382.97	49.79

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

මෙහෙවර

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2023.09.30 දිනට ප්‍රගතිය

	ක්‍රියාකාරකම	2025 ඉලක්කය		2025.09.30
		ඒකකය	ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
01	රබර් නව වගාව	හෙක්ටයාර	390	85.05
02	රබර් නැවත වගාව (කුඩා වතු)	හෙක්ටයාර	230	162.08
03	ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම	පැළ	340,600	203,656
04	පෙර වසරවල ආරම්භ කළ නව වගා හා නැවත වගාවන් සඳහා ඉතිරි සහනාධාර වාරික ගෙවීම	හෙක්ටයාර	6,639	1,843
05	වැසි ආවරණ යෙදීම (කුඩා වතු)	හෙක්ටයාර	600	479.69
06	අතුරුබෝග වගාව	හෙක්ටයාර	150	140.83
07	කාර්ය මණ්ඩල පුහුණුව	නිලධාරීන්	100	68
08	සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා ඉඩම් හඳුනා ගැනීම	වැඩසටහන්	06	-
09	පුහුණු වැඩසටහන් පැවැත්වීම	පුහුණු වැඩසටහන්	412	320 (2025.08.31)
10	කිරි කැපුම් පට්ටය සලකුණු කිරීමේ පට්ටම් (stencils) බෙදා හැරීම	කිරි කැපුම් පට්ට	225	-
11	2023, 2024 වගා සඳහා පොහොර සහනාධාර ලබාදීම	හෙක්ටයාර	1595	80%
12	සියළුම රබර් සංවර්ධන නිලධාරී කොට්ඨාස වල ගොවි කණ්ඩායම් ඇති කිරීම හා ව්‍යාප්ති සැලැස්ම සකස් කිරීම	කණ්ඩායම්	459	230 (50%)
13	RIMS පද්ධතියේ හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකිරීම	ඩෑෂ් බෝඩ් ප්‍රමාණය	24	40%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	-	-	-	-	-
	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන	545	362.44	148.728	232.03	7.178
පුනරාවර්තන වියදම්		423	291.614	214.586	298.23	0.390

2026 වර්ෂයේ ක්ෂේත්‍රයේදී අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- කුඩා රබර් වතු අංශයේ හෙක්.700 ක රබර් නව වගාව
- කුඩා රබර් වතු අංශයේ හෙක්.300 ක රබර් නැවත වගාව
- ගුණාත්මක බද්ධ රබර් පැළ 597,500 ක් නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම.
- කුඩා වතු අංශයේ හෙක්. 1000ක වැසි ආවරණ යෙදීම සඳහා සහනාධාර ලබා දීම.
- 2026 වර්ෂයේ වැවිලි සමාගම් අංශයේ හෙක්. 2200 ක වැසි ආවරණ යෙදීම සඳහා සහනාධාර ලබා දීම.
- 2023/2024 වසරවල රබර් වගා සඳහා පොහොර සහනාධාර ලබා දීම. (හෙක්. 1,595)
- හෙක්.250 ක අතුරු බෝග වගාව සඳහා සහනාධාර ලබාදීම
- පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ව්‍යාප්ති සේවා වැඩසටහන් පැවැත්වීම.
- හෙක්. 275 ක කිරි නොකපන පරිණත රබර් වගාවන් නැවත පුනරුත්තාපනය.
- රබර් වගාවන්හි ආදායම් විවිධාංගීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

රබර් පර්යේෂණ ආයතනය

දැක්ම

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා ගුණාත්මක බවින් පිරිපුන් උසස්ම විද්‍යාත්මක තාක්ෂණය රබර් කර්මාන්තයට ලබාදෙන විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ආර්ථික වශයෙන් ඵලදායක මෙන්ම පාරිසරික වශයෙන් හිතකාමී තිරසාර නවෝත්පාදන වැඩිදියුණු කිරීම මගින් ද, රබර් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් වෙත පුහුණුකිරීම් හා උපදේශන සේවා තුළින් නවතම තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් ද රබර් කර්මාන්තයට පුනර්ජීවයක් ලබා දීම.

ක්‍රියාත්මක සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය (2025.09.30 දිනට)

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි)	අක්මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)
නව පත්‍ර පතන රෝගයට අදාළ වසංගත විද්‍යාත්මක අධ්‍යයන සහ ව්‍යාධිජනකයන්ගේ ජීව විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම සහ කාර්යක්ෂම රෝග කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීම	6.98	3.75	2.41	-	90%
රබර් අස්වනු නෙලීමේ සහායකයින්ගේ රබර් වගා පිළිවෙත්/නිර්දේශ පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම.	0.50	0.31	0.07	0.08	85%
වැසි ආවරණ සවි කිරීම සඳහා රබර් පර්යේෂණායතනයේ සහතික ලත් කාර්මික ශිල්පීන් හඳුන්වා දීම.	4.50				78%
සාම්ප්‍රදායික නොවන රබර්වගා කරන ප්‍රදේශවල උප-ප්‍රශස්ත දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි තිරසාර රබර් ක්ලෝන හඳුනා ගැනීම.	4.50	1.00	0.05	2.30	65%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	2024 වසරේ අතැති බිල් පියවීමට සහ 2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන	100.00	-	42.50	23.10	16.17
පුනරාවර්තන වියදම්		395.00	-	322.79	322.79	4.92

2026 වර්ෂයේ ක්ෂේත්‍රයේදී අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

1. 2026 වර්ෂයේදී වාණිජ වගාවන්හි S/2 d3 ක්‍රමය සඳහා උත්තේජක ප්‍රමාණය අවම කර අස්වැන්න වැඩි කිරීම සඳහා අඩු තීව්‍රතා අස්වනු නෙලීමේ ක්‍රම, උත්තේජන ප්‍රොටෝකෝල සහ එතෆෝන් මිශ්‍රණය ප්‍රශස්ත කිරීමේ පර්යේෂණ කටයුතු සිදු කිරීම.
2. රබර් වළයාකාර පත්‍ර පුල්ලි රෝගය සඳහා වන රසායනික කලමනාකරණ ක්‍රමය ප්‍රශස්ත කර ජාතික මට්ටමේ රෝග කලමනාකරණ ක්‍රම වේදයක් හඳුන්වා දීම.
3. වළයාකාර පත්‍ර පුල්ලි රෝගය සඳහා සමෝදාන රෝග පාලන ක්‍රම හඳුන්වා දීම.
4. රබර් වගාවේ කළමනාකරණ ක්‍රමවල වැඩි දියුණු කිරීම හා ක්ෂීරයේ ගුණාංග වර්ධනය කිරීම සඳහා ජෛව රසායනික සහ භෞතික පර්යේෂණ මඟින් පොහොර හා ආතති විරෝධී සංයෝගවල බලපෑම හඳුනා ගැනීම.
5. ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් සඳහා තිරසාරභාවය සහතික කිරීමේ පද්ධතියක් (SCSNR) සැකසීම.
6. වනාන්තර දැව සඳහා විකල්පයක් ලෙස රබර් දැව භාවිතය ප්‍රවර්ධනය කර දැව කර්මාන්තයට සුදුසු ක්ලෝන තෝරා ගැනීම සඳහා ක්ලෝන 5ක් සහ වයස් කාණ්ඩ 3ක් සඳහා භෞතික, ජෛව රසායනික සහ යාන්ත්‍රික ගුණාංග හඳුනා ගැනීම සඳහා පර්යේෂණ සිදුකිරීම.
7. කර්මාන්තකරුවන් හා ව්‍යවසායකයන් සඳහා ඉවත ලන ද්‍රව්‍ය එක් කළ වියළි රබර් සහ රබර් කිරි මත පදනම්වූ රබර් සංයෝග/නිෂ්පාදන සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
8. විශේෂ යෙදුම් සඳහා නැනෝ ද්‍රව්‍ය පිරවූ ස්වාභාවික රබර් සංයෝග/නිෂ්පාදන සංවර්ධනය සඳහා ස්වාභාවික රබර් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා නව නැනෝ ද්‍රව්‍ය සංස්ලේෂණය, අධි තාක්‍ෂණික ඉංජිනේරු යෙදුම් සඳහා රබර් නිෂ්පාදන 2ක් සංවර්ධනය හා අවසන් නිමි ද්‍රව්‍ය වල ලාභය වැඩි කිරීම සිදු කිරීමට අපේක්ෂිතය.
9. ව්‍යවසායකයින්, කුඩා රබර් වතු හිමියන් 170 ක් සඳහා වැඩමුළු, පුහුණු සහ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම.
10. රබර් කර්මාන්තයේ ඉල්ලීම පරිදි අමු රබර්, රබර් සංයෝග සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම
11. වැඩිදියුණු කළ රෝපණ මාධ්‍ය සහ රෝපණ බඳුන් හඳුන්වා දීම මඟින් නව රෝපණ මාධ්‍යයක් ක්ෂේත්‍රයට හඳුන්වා දීම සිදු කිරීම.
12. රබර් තවාන් සඳහා ස්වයංක්‍රීය ක්ෂුද්‍ර ජල සැපයුම් පද්ධතියක් හඳුන්වා දීම මඟින් සකසා ඇති මූලාකෘතිය වඩාත් කාර්යක්ෂම හා ප්‍රයෝජනවත් පද්ධතියක් ලෙස වර්ධනය කිරීම.
13. විවිධ වර්ගයේ වැසි ආවරණ පරීක්ෂා කිරීම මඟින් කිරි කැපුම් පැනලය වර්ෂාවෙන් ආරක්ෂා කළ හැකි, පිරිවැය ඵලදායී හා දිගුකාලීන වැසි ආවරණයක් හඳුන්වා දීම.
14. ජෛව පළිබෝධනාශක භාවිතය තුලින් සුදු මුල් රෝගය පාලනය කිරීමට යොදා ගනු ලබන දිලීර නාශක භාවිතය අඩු කිරීම.
15. කුඩා රබර් හිමියන්ගේ (මොනරාගල හා කළුතර දිස්ත්‍රික්ක වල) ඵලදායිතාවය ඉහළ දැමීම සඳහා කටයුතු කිරීම.

කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව

දැක්ම

ලංකා කුරුඳු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අපනයන-අභිමුඛ වැවිලි බෝගය ලෙස ස්ථානගත කිරීම

මෙහෙවර

තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම, වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම යන උපායමාර්ගික මුලපිරීම් තුලින් ජාතික ආර්ථිකයට ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ දායකත්වය ශක්තිමත් කිරීම සහ සියලු පාර්ශ්වකරුවන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘතිවල 2023.09.30 දිනට ප්‍රගතිය

ව්‍යාපෘතිය	වෙන්කළ මුදල (රු.මි.)	වියදම (රු.මි.)	භෞතික ප්‍රගතිය
ජාතික කුරුඳු කර්මාන්තය ආශ්‍රිතව සංස්කෘතික ප්‍රවර්ධන මධ්‍යස්ථානය අදියර (Cinnamon Gate-Stage1)	275 (අදියර -I +ඉතිරි කොටස)	117.5	අදියර I 100%
ලංකා කුරුඳු කර්මාන්තය දියුණු කිරීම උදෙසා වගාකරුවන්ට සහයවීමේ ව්‍යාපෘතිය	100	60.44	47%
කෘෂි අපනයන බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමේ වැඩසටහන - ලංකා සත්‍ය කුරුඳු දියුණු කිරීමේ පුළුල් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන (Promotion of Export Agriculture Crops in Sri Lanka - Ceylon Cinnamon Advancement)	150	12.49	21%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

වැඩසටහන	අනුමත ප්‍රතිපාදන (රු. මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන	405.0	131.9	108.9	113.2	2.1
පුනරාවර්තන	142.0	106.5	70.2	88.0	0.00

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

01. කුරුඳු සංවර්ධන පනත සකස්කර කැබිනට් අනුමැතිය සඳහා යොමු කිරීම.

02. කුරුඳු කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කුරුඳු කර්මාන්තය ගමන් කල යුතු දිශානිතිය / සංවර්ධනය සඳහා දස අවුරුදු මාර්ග සිතියම සකස් කිරීම.

03. කුරුඳු කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා පස් අවුරුදු උපාය මාර්ගික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.

04. කුරුඳු කර්මාන්තය සඳහා යුරෝපා සංගමයේ, භූගෝලීය තත්ව දර්ශක සහතිකය (GI) ලබා ගැනීම සහ භූගෝලීය තත්ව දර්ශ සහතිකය සහිත කුරුඳු නිෂ්පාදන යුරෝපය වෙත අපනයනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.

05. චීනයට කුරුඳු අපනයනය කිරීමට අවබෝධතා ගිවිසුම අත්සන් කර අපනයන කටයුතු ආරම්භ කිරීම.

06. කුරුඳු කර්මාන්තය හා බැඳුනු සංස්කෘතික උරුමය අස්පර්ශනීය ලෝක උරුමයක් බවට පත් කිරීම සඳහා වූ යෝජනාව යුනෙස්කෝ සංවිධානය වෙත යොමු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කිරීම.

2026 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ක්‍රියාකාරකම්

1. බදුල්ල, කෑගල්ල, මාතලේ, කුරුණෑගල, ගම්පහ, මොණරාගල, අනුරාධපුර සහ පොළොන්නරුව යන සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල කුරුඳු අක්කර 500 ක් අළුතින් වගාවට යොමු කිරීම.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

දැක්ම

වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව හා උපදේශන සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ට ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුළින් වැවිලි කර්මාන්තයේ සියලුම මානව වත්කම්හි වෘත්තීය නිපුණතාව පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම.

ක්‍රියාත්මක සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය (2025.09.30 දිනට)

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම	3.50	3.52	100%
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	18.40	7.95	46%
නේවාසිකාගාර පහසුකම්	1.50	-	20%
මෘදුකාංග සංවර්ධනය	0.6	0.21	50%
කුඩා වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධනය	6.00	1.41	25%
එකතුව	**30.00**	**13.09**	**48%**

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට ඉලක්කය (රු.මි.)	අක්මුදල් ලැබීම (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
පුනරාවර්තන වියදම්	85.00	64.15	64.15	64.15	-
ප්‍රාග්ධන වියදම්	30.00	22.09	20.00	13.09	-

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- වැවිලි කර්මාන්තයේ අභිවෘද්ධිය වෙනුවෙන් නව උපාධි පාඨමාලා 2ක් විශ්ව විද්‍යාලයක් සමඟ ගිවිසුම්ගතවී හඳුන්වා දීම.
- නේවාසිකාගාරයේ පහසුකම් සංවර්ධනය සහ ජීව වායු සංකල්පය හඳුන්වා දීම.
- අධ්‍යයන පාඨමාලා යාවත්කාලීන කිරීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය සඳහා නව දේශන ශාලා 2 ක් පහසුකම් සංවර්ධනය.
- රසායනාගාර සහ පර්යේෂණ ශාලා පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා නව දේශන ශාලා 2 ක් ස්ථාපිත කිරීම.
- පුස්තකාල පහසුකම් සංවර්ධනය යටතේ නවීන උපාංග සහිතව පුස්තකාල සුහුරුකරණය (Smart Library) කිරීමට අපේක්ෂා කිරීම.
- මෘදුකාංග සංවර්ධනය.
- කුඩා වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධන සඳහා වැඩසටහන් 150 ක් පැවැත්වීම.
- විෂයමාලා 03ක් සංවර්ධනය කිරීම.
- සියලු අධ්‍යයන හා වෘත්තීමය වැඩසටහන් පැවැත්වීම.
- සියලු කාර්ය මණ්ඩලය සඳහා නිපුණතා සංවර්ධන සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

පොල් වගාකිරීමේ මණ්ඩලය

දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම පොල් නිෂ්පාදකයා කරවීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම හා අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයං පෝෂිත තත්ත්වය ලඟා කර ගැනීම පිණිස ඵලදායි උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මගින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම.

ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘති ප්‍රගතිය (2025.09.30)

පොල් පැළ බෙදා දීමේ වැඩසටහන්

වැඩසටහන	ඒකකය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
නව/නැවත/යටි වගා සහනාධාරය	පොල් පැළ	627,000	342,287	290.00	229.81
ගෙවතු වගා වැඩසටහන	පොල් පැළ	100,000	203,501		
පාළු පැළ සිටුවීමේ වැඩසටහන	පොල් පැළ	100,000	77,175		
මුදලට පැළ නිකුත් කිරීම	පොල් පැළ	248,000	413,607		
විශේෂ ගෙවතු වගා වැඩසටහන - 01	පොල් පැළ	400,000	400		
විශේෂ ගෙවතු වගා වැඩසටහන - 02	පොල් පැළ	10,000	2,105		
තැඹිලි වගා වැඩසටහන	තැඹිලි පැළ	15,000	626		

වෙනත් සංවර්ධන වැඩසටහන්

වැඩසටහන	ඒකකය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
පොල් ඉඩම් ලියාපදිංචිය-කුලියාපිටිය	ඉඩම්	18,000	3,212	2.70	0.48
පෙර වසරේ සිටුවන ලද පොල් පැළ අධීක්ෂණය	ඉඩම්	5,335	2,604	1.80	0.32
කප්රුක ආයෝජන ණය යෝජනා වැඩසටහන	අක්කර	3,500	1,639	450 (RF)	
පොලී සහන ඇප ආවරණ	ඉඩම්	800	91	50 (RF)	

ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන්

වැඩසටහන	ඒකකය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
සංවර්ධන වැඩසටහන්වලට සමගාමීව කරන ව්‍යාප්ති වැඩසටහන්	කණ්ඩායම් වැඩසටහන්	310	553	4.65	2.05
	ඒක පුද්ගල හමුවීම්	60,000	56,305	-	-
රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන්	වැඩසටහන්	100	74	3.00	0.42
ගොවි නායකයින් පිහිටුවීම	ඒකක	200	14	6.00	0.05
පොහොර ප්‍රවර්ධන වැඩසටහන	වැඩසටහන්	490	492	9.80	3.94
පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මඟින් මෙහෙයවනු ලබන පුහුණු වැඩසටහන්	වැඩසටහන්	142	122	10.08	11.61
සත්ත්ව පාලනය සඳහා ක්ෂේත්‍ර ආදර්ශන	ඒකක	2	2	0.53	
පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය, Zoom පැකේජ යාවත්කාලීන කිරීම	ඒකක	2	2	0.60	
ජාතික මට්ටමේ ප්‍රදර්ශන	ප්‍රදර්ශන	4	4	0.20	
මුද්‍රණ කටයුතු සිදු කිරීම	පුවරු	15	60	1.46	
	අත්පත්‍රිකා	151,000	137,500		
	දැන්වීම්	3,000	5,000		
	සඟරා	350	වර්ෂය අවසානය වන විට නිකුත් කරයි.		
මාර්ගගත පුහුණුව	මොඩියුල	10	10	0.025	
සමාජ මාධ්‍ය පෝස්ටර් පළ කිරීම හා Boosting	දැන්වීම්	53	31	0.025	
රැස්වීම්,ඉල්ලුම්පත්‍ර සහ ව්‍යාප්ති පත්‍රිකා සකස් කිරීම	රැස්වීම්	8	6	1.8	
	ඉල්ලුම්පත්‍ර	5,000	6,100		
	ව්‍යාප්ති පත්‍රිකා	30,000	35,000		
බහුමාධ්‍ය වැඩසටහන්	කෙටි වාර්තාමය වැඩසටහන්	5	2	14.0	9.25
	දැන්වීම්	10	10		
ඩිජිටල් මාධ්‍ය වැඩසටහන් (වෙබ් අඩවිය, කොකො ඇප්)	ඒකක	2	2	1.0	
මුද්‍රිත මාධ්‍ය නිර්මාණ සකස් කිරීම (පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා)	ඒකක	4	4	1.0	
වෙනත් මාධ්‍ය වැඩසටහන් සහ මිලදී ගැනීම්	දැන්වීම්	4	1	4.00	

රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන

වැඩසටහන	ඒකකය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන	රතු හා කළු කුරුමිණි වයල්	32,155	29,933	17.52	15.94
	මොනක්‍රොටපස් (ලීටර්)	2,600	2,310		
	පොල් දළඹු වයල්	2,100	1,235		
	ප්‍රචාරණය	64	55		
	නිරීක්ෂණය	28	21		
මයිටා පරපෝෂී පැකට් නිෂ්පාදනය හා බෙදාහැරීම	පැකට්	186,000	152,942	11.16	3.08

වෙනත් විශේෂ වැඩසටහන් - 2025

වැඩසටහන	ඒකකය	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	
		ඉලක්කය	ප්‍රගතිය	ඉලක්කය	ප්‍රගතිය
සුදු මැස්සා මර්ධන වැඩසටහන	කොහොඹ තෙල් (අක්කර)	27, 000 (7,800)	කොහොඹ තෙල් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇත.	50.00	
වායු තුවක්කු මිලදී ගැනීමේ සහනාධාරය	ඒකක	500	111	12.50	1.19
පොල් පැල ආරක්ෂණ වැඩසටහන	පොල් පැළ	25,000	1,814	12.5	1.18
කුඩා ප්‍රමාණයේ පොහොර පැකට් සුලභ කිරීම	ගස්	50,000	1,296	-	-
වයස්ගත පැරණි වගාව ඉවත් කිරීම	ගස්	12,330	84	18.50	-
පොල් පැල රක්ෂණ යෝජනා ක්‍රමය	පැළ	2,000	1,150	0.08	0.05
ජල සම්පාදන වැඩසටහන	අක්කර	2,405	110	72.16	-
තෙතමන සංරක්ෂණ වැඩසටහන	අක්කර	4,000	450	38.40	3.56
ජීව අඟුරු ඒකක පිහිටුවීම	ඒකක	200	ඉල්ලුම් පත්‍ර ලැබීම් - 47	5.00	
පොල් දෙසතිය විශේෂ ව්‍යාප්ති වැඩසටහන	වැඩසටහන්	200	6	40.00	2.34

ශ්‍රමික බලකා සාමාජිකයන් බලගැන්වීම	සාමාජිකයින්	400	352	1.00	-

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි)	වියදම (රු.මි)	අතැති බිල් (රු.මි)
ප්‍රාග්ධන	790.00	475.25	330.492	-
පුනරාවර්තන	650.00	453.034	453.034	-

2026 වර්ෂයේ යෝජිත ක්‍රියාකාරකම්

- පොල් පැළ සිටුවීම (ක්‍රමවත් වගාව, ගෙවතු වගාව, පාලු සිටුවීම, විශේෂ ගෙවතු වගා, මුදලට පොල් පැළ ලබා දීම, උතුරු පොල් ත්‍රිකෝණය ව්‍යාපෘතිය, පොල් පැළ ප්‍රවාහනය) - (රු.මි.290)
- පෙර වසරේ සිටවූ පැළ අධීක්ෂණය - (රු.මි. 2.5)
- රෝග හා පළිබෝධ මර්දනය - (රු.මි. 123.24)
- කප්රුක ණය වැඩසටහන - (රු.මි. 50)
- ජාතික ව්‍යාප්ති සේවා වැඩසටහන - (රු.මි. 101.26)
- පොකුරු වැඩසටහන යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය - (රු.මි. 30)
- පුහුණු මධ්‍යස්ථාන මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම - (රු.මි. 20)
- මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම - (රු.මි. 20)
- ව්‍යාප්ති වැඩසටහන් සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය - (රු.මි. 12)
- යටිතල පහසුකම් සංවර්ධනය - (රු.මි. 50)
- මානව සම්පත් සංවර්ධනය - (රු.මි. 5)
- ක්ෂේත්‍ර කටයුතු විධිමත් කිරීම සඳහා පරිගණක යන්ත්‍ර මිලදීගැනීම - (රු.මි. 6)
- රෝග පාලනය සඳහා අධිබල ඉසින යන්ත්‍ර සහ අනෙකුත් මෙවලම් මිලදී ගැනීම - (රු.මි. 15)
- වන සතුන්ගෙන් පොල් වගාව ආරක්ෂා කිරීම
- පොල් අස්වැන්න ආරක්ෂා කිරීමේ සහනාධාරය - (රු.මි. 50)
- පොල් පැළ ආරක්ෂණය - (රු.මි. 75)
- මෙහෙයුම් ක්‍රියාකාරකම්- (රු.මි. 50)

වෙනත් විශේෂ වැඩසටහන්

- උතුරු පොල් ත්‍රිකෝණය ශක්තිමත් කිරීමේ අඛණ්ඩ ව්‍යාපෘතිය - (රු.මි. 600)
- වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග පාලනය කිරීම (රු.මි. 122)

පොල් සංවර්ධන අධිකාරිය

දැක්ම

පොල් කර්මාන්තය දළ දේශීය නිෂ්පාදනය සඳහා වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළම දායකත්වය ලබා දෙන්නා වීම සහ නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී ගෝලීය නායකයා වීම.

මෙහෙවර

ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින්, පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය ඉහළ දායකත්වයක් කරා ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම.

ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘති ප්‍රගතිය 2025.09.30 දිනට

තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

	ක්‍රියාකාරකම	ඒකකය	භෞතික ප්‍රගතිය	%
01	A) පොල් නිෂ්පාදනයන්හී පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම	ආදර්ශ	10,999	96%
02	පරික්ෂණ සේවා සැපයීම මද ආශ්‍රිත නිෂ්පාදන	ආදර්ශ	1,019	102%
03	ISO තත්ව සහතිකය ලබාගැනීමේ කටයුතු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.	වැඩසටහන්	අභ්‍යන්තර විගණනය සම්පූර්ණ කිරිම, රසායනික හා ක්ෂුද්‍රජීවී පරික්ෂණ සඳහා ILC වැඩසටහන්වලට සහභාගී වීම, ISO ප්‍රතීතනය යාවත්කාලීන කිරීම සඳහා සහ විෂය පථය දිර්ඝ කිරිම සඳහා විගණනය සිදුකිරිම සහ පුහුණු වැඩසටහන් 7 ක් පැවැත්වීම.	85%
04	A) දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී පරික්ෂා	පරීක්ෂණ	804	97%
05	සැකසුම් සංවර්ධන අංශයේ ක්‍රියාකාරිත්වයට අදාලව පොල් නිෂ්පාදන විශලේෂණය	ආදර්ශ	661	73%

සැකසුම් සංවර්ධන අංශය

	ක්‍රියාකාරකම	ඒකක	භෞතික ප්‍රගතිය	%
01	නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් භාවිතය සඳහාවූ ණය යෝජනා ක්‍රමය	ප්‍රතිලාභීන් 20	විකල්ප බලශක්ති භාවිතය සඳහා අයදුම්පත් ලැබීම ඉතා අඩු මට්ටමක පැවතීම නිසා මෙම ණය යෝජනා ක්‍රමය, කර්මාන්තශාලාවල තාක්ෂණික වැඩි දියුණු කිරීම්, ධාරිතාවය වැඩි දියුණු කිරීම් වෙනුවෙන් ලබා දීම ලෙස පුළුල් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව අයදුම්පත් ලබා ගැනීම සිදුවේ. (දැනට ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයට අයදුම්පත් 31ක් ලැබී ඇත. එහි ඉදිරි කටයුතු සිදු වේ.)	50%
02	පොල් ආශ්‍රිත අවිධිමත් අංශයේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා අලෙවිය පුළුල් කිරීම, පරිසර හිතකාමී පොල්කටු දහන උඳුන් ස්ථාපනය පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.	ප්‍රතිලාභීන් 45 0 ප්‍රතිලාභීන් 20 ප්‍රතිලාභීන් 30	1. ප්‍රතිලාභීන් 928 දෙනෙක් සඳහා දැනුවත් කිරීමේ/ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා නිෂ්පාදන මිලදී ගැනීමට ගැණුම්කරුවන් සම්බන්ධ කිරීම 2. තෝරාගත් කර්මාන්තකරුවන් 20 දෙන උඳුන් ස්ථාපනය ආරම්භ කර ඇත. 3. අයදුම්පත් කැඳවීම සිදුකර ඇත.	100% 60% 45%
03	ගුණාත්මක පොල්තෙල් නිෂ්පාදනය/ පරිභෝජනය සම්බන්ධව දැනුවත් කිරීම. වෙළඳපොල හා නිෂ්පාදන ලියාපදිංචියේදී පොල්තෙල් පරික්ෂාව කර්මාන්තශාලාවල නිෂ්පාදනය කෙරෙන පොල්තෙල්වල තත්වය පරික්ෂා කිරීම.	ප්‍රතිලාභීන් 3000 නියැදි 400 නියැදි 200	1. ප්‍රතිලාභීන් 3249 ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. 2.වෙළඳපොල නියැදි 226ක්, ලියාපදිංචි කිරීමේදී ලබා ගන්නා නියැදි 152ක් රසායනාගාර පරීක්ෂාවන් සඳහා යොමුකර ඇත. 3.කර්මාන්තශාලාවල නිෂ්පාදනයන්ගේ අහඹු නියැදි 148ක් රසායනාගාර පරීක්ෂාවන් සඳහා යොමුකර ඇත.	100% 94% 74%
04	නිලධාරින්ගේ තාක්ෂණික දැනුම වර්ධනය/ ISO 17020 ප්‍රතිතනය, යහපත් නිෂ්පාදන පැවතුම් (GMP) සහතිකකරණය හා පොල් නිෂ්පාදනය සම්බන්ධ නීති රෙගුලාසි පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම	පුහුණු වැඩසටහන්	පුහුණු වැඩසටහන් 04ක් හා චක්‍රලේඛ සමාලෝචන වැඩසටහන් 04ක් පැවැත්වීම. ISO 17020 ප්‍රතිතනයට අදාළ ගෙවීම් සිදු කිරීම.	30%

05	පොල් තෙල් කර්මාන්ත ආයතන වෙත යහපත් නිෂ්පාදන පැවතුම් (GMP) සහතිකකරණය ලබා ගැනීම වෙනුවෙන් සිදු කරන දැනුවත් කිරීමේ වැඩසටහන	ප්‍රතිලාභීන් 350	ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වැඩසටහන් පැවැත්වීමට දින වෙන්කර ඇත.	40%
06	කොහුබත් උපස්තර කර්මාන්තශාලා වලින් අහඹු ආදර්ශ ලබා ගැනීම.	නියැදි 150	විශේෂ ආදර්ශ පරික්ෂා කිරීම් 10ක්, සමීක්ෂණ 04ක් සිදුකර ඇත. ආදර්ශ 132ක් ලබාගෙන ඇත.	88%

අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය

	ක්‍රියාකාරකම	ඒකක	භෞතික ප්‍රගතිය	%
01	රූපවාහිනී, ගුවන් විදුලි, පුවත්පත්, සමාජ මාධ්‍ය , එළිමහන් ඩිජිටල් දැන්වීම් පුවරු සහ අත් පොත මුද්‍රණය ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.	වැඩසටහන්	• රූපවාහිනී සහ සමාජ මාධ්‍ය සඳහා දැන්වීම් නිෂ්පාදනය සඳහා ආයතනයක් තෝරාගෙන කාර්යය පවරා ඇත. • ගුවන් විදුලි දැන්වීම් වාර 5,900 විකාශනය කර ඇත • පුවත්පත් දැන්වීම් 60 පළ කිරීම. • සමාජ මාධ්‍ය දැන්වීම් 46 ක් පළ කිරීම. • එළිමහන් ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. • අත් පොත මුද්‍රණය සඳහා ආයතනයක් තෝරාගෙන කාර්යය පවරා ඇත	75% 69% 80% 51% 20% 60%
	දේශීය වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශන සහ ප්‍රවර්ධන අවස්ථා සඳහා සහභාගී වීම.	වැඩසටහන්	• දේශීය වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශන 8 ක් සඳහා සහභාගී වීම.	100%
	ජාතික මට්ටමේ පොල් දින සැමරුම් උත්සවය සහ පොල් ක්ෂේත්‍රයේ සම්මාන උළෙල පැවැත්වීම.	වැඩසටහන්	• පොල් දින සැමරුම් වැඩ සටහනට පුතුකුඩුඉරිප්පු හී දී සාර්ථකව පවත්වන ලදී. • පොල් ක්ෂේත්‍රයේ සම්මාන උළෙල සාර්ථකව පවත්වන ලදී.	100% 100%
02	ජාත්‍යන්තර වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම සහ පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.	වැඩසටහන්	• විදේශීය ප්‍රවර්ධන වැඩ සටහන් 2 ක් සඳහා දායකවීම සහ 2025 වසර සඳහා චීනයේ පැවැත්වෙන ප්‍රදර්ශනයක් සහ 2026 වසර සඳහා ප්‍රදර්ශන කිහිපයක් සංවිධානය කරමින් පවතී. • ජාත්‍යන්තර ප්‍රවර්ධන අත්පොත් මුද්‍රණයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. • අඛණ්ඩ යාවත්කාලීන කිරීම් සිදු කරමින් පවතී.	35% 10% 75%

03	වෙළඳපල සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම	සමීක්ෂණ	• ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල නැවුම් පොල් පරිභෝජනය තක්සේරු කිරීම සඳහා වන සමීක්ෂණයේ සහ නැවුම් පොල් සඳහා විකල්පයක් ලෙස අගය එකතු කළ පොල් නිෂ්පාදන සඳහා පාරිභෝගික මනාපයන් සහ වෙළඳපල විභවය හඳුනාගැනීම සඳහා වන සමීක්ෂණයේ දත්ත එක් රැස් කරමින් පවතී.	60%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මිලි.)	අභ්‍යන්තර ඉපයීම් (ඇස්තමේන්තුගත)	2025 වියදම (ඇස්තමේන්තු ගත)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (වියදම) (රු.මි.)	අක් මුදල් ලැබීම් 2025.06.30 (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)
ප්‍රාග්ධන	-		416	300	-	57.9	-
පුනරාවර්තන	190	329	404	303	142	241	-

2025 වසරේ ඇස්තමේන්තුගත මුළු අභ්‍යන්තර ඉපයීම් රු. මිලියන 329 කි. ඉන් රු. මිලියන 214 ක් පුනරාවර්තන වැය සඳහා දැරීමට ආස්තමේන්තු කර ඇත. ඉතිරි මුදල වන රු.මිලියන 115 සහ අභ්‍යන්තර සංචිත (Internal reserve) රු. මිලියන 301 ක් තුලින් ප්‍රාග්ධන වැය දැරීමට අපේක්ෂා කර ඇත.

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව ප්‍රමිති සංශෝධනය කිරිම.
- පොල් නිෂ්පාදන ප්‍රමිතියානුකූලව සිදුකිරිම සඳහා අවශ්‍ය වන දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා සේවාදායකත්වය සැපයීම.
- නිෂ්පාදනාගාරයන්හි ක්ෂුද්‍රජීවි විෂගතවීම හඳුනාගැනිම සඳහා Swab පරික්ෂණ සිදුකර වාර්තා කිරිම.
- වෙළඳපොල පවතින පොල් තෙල් හි ප්‍රමිතියානුකූල භාවය තහවුරු කිරිම වෙනුවෙන් පාරිභෝගික සේවා අධිකාරිය මඟින් සිදුකරනු ලබන වැටලීම් සඳහා රසායනාගාර පරික්ෂණාත්මක සේවා සැපයීම.

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- උපාය මාර්ග සැලැස්මෙහි සඳහන් ඉලක්කය සපුරා ගැනිම සඳහා රසායනාගාර පරික්ෂණ සේවා පුළුල් කිරිම.
- ජාත්‍යන්තර තත්වයේ පරික්ෂණ වාර්තා නිකුත් කිරිම උදෙසා රසායනාගාර ප්‍රමිතියානුකූල ලෙස වැඩි දියුණු කිරිම සහ ISO ප්‍රතිතන තත්වය ලබා ගැනිම පුළුල් කිරිම.
- පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ රසායනාගාර සේවකයින් සඳහා පුහුණු වැඩ සටහන් 04 ක් පැවැත්වීම.
- මද ආශ්‍රිත අගය එකතු කළ පොල් නිෂ්පාදන සඳහා GI සහතිකය සහිත “Ceylon Coconut” සන්නාමය දියත් කිරීම.
- දේශීය සහ ගෝලීය දත්ත භාවිතා කරමින් මිල ගණන්, ඉල්ලුම සහ ප්‍රවණතා පුරෝකථනය කරනු ලබන AI තාක්ෂණය භාවිතයෙන් ක්‍රියාත්මක වන වෙළඳපල පුරෝකතන මෙවලමක් නිර්මාණය ආරම්භ කිරීම.
- පොල් සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පොල් වෙන්දේසිය පැවැත්වීම සඳහා මාර්ගගත ද්වාරයක් නිර්මාණය කිරීම.
- හම්බන්තොට ආශ්‍රිතව පොල් සැකසුම් කලාපයක් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම.
- පොල්තෙල් කර්මාන්තය නියාමනය කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම.

පොල් පර්යේෂණ ආයතනය

දැක්ම

පොල් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම, තාක්ෂණ සංවර්ධනය හා තාක්ෂණ හුවමාරුව සම්බන්ධයෙන් කලාපයේ ඇති විශිෂ්ඨතම ආයතනය වීම.

මෙහෙවර

පර්යේෂණයන්හි විශිෂ්ඨත්වය තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදිතාවය හා ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම හා තාක්ෂණය බිහි කිරීම.

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)
ප්‍රාග්ධන	100.00	70.00	70.00	28.25	-
පුනරාවර්තන	350.00	262.5	265.05	262.12	-

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන් සහ ප්‍රගතිය

- පොල් වගාවේ නව කෘමි උවදුරක් වශයෙන් ව්‍යාප්ත වෙන බ්‍රොන්ටිස්පා කුරුමිණියා මර්දනය සඳහා පරපෝෂිතයකු නිර්දේශ කර ලද අතර එම පරපෝෂිතයා විද්‍යාගාරය තුළ බෝකිරීමේ ක්‍රමවේදය හඳුනාගන්නා ලදී. එම පරපෝෂිතයා බෝ කරන වගාකරුවන්ට ලබාදීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ එක්ව ගාල්ල ලබුදූවේ විද්‍යාගාරයක් ස්ථාපනය කරන ලදී. එසේම පරපෝෂිතයන් නිදහස් කිරීමෙන් සහ කෘමිනාශක භාවිතය මගින් බ්‍රොන්ටිස්පා කුරුමිණියාගේ ආසාදනය දකුණු පළාතට සීමා කරන ලදී.
- පොල් වගාවේ පාංශු තෙතමන සංරක්ෂණය සඳහා පොල් ලෙලි වෙනුවට භාවිතා කල හැකි අතුරුණුවක් සම්බන්ධව නව නිර්දේශයක් නිකුත් කරන ලදී. තවත් අතුරුණුවක් සම්බන්ධව පර්යේෂණ ක්‍රියාත්මක වේ.
- රෝග සඳහා පොල් ගස්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිකරන රසායනික ද්‍රව්‍යයන් පිළිබඳව නිර්දේශයක් නිකුත් කරන ලදී.
- පොල් පිටි යොදා ගනිමින් අඩු ග්ලයිසිමික් අගයක් සහිත ආහාර නිෂ්පාදනය පිළිබඳ ක්‍රමවේදය හඳුන්වා දෙන ලදී.
- වියළි කාලගුණයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේද පිළිබඳ පරීක්ෂණ පවත්වන ලදී.
- පටක රෝපිත පොල් පැළ පිළිබඳ පර්යේෂණයක් පෞද්ගලික අංශය සමඟ ක්‍රියාත්මක වේ.
- වියළි කලාපය සඳහා ෆොස්පරස් ප්‍රභවයක් වශයෙන් එප්පාවල රොක් ෆොස්ෆේට් භාවිතය පිළිබඳ පර්යේෂණයක් ක්‍රියාත්මක වේ.
- පොල් වගාව සඳහා නිරවද්‍ය කෘෂි විද්‍යාත්මක ක්‍රම (Precision Agriculture) යෙදවුම් සඳහා මූලික පර්යේෂණ ආරම්භ කිරීම.

- පොල් පර්යේෂණ ආයතනය විසින් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ පසු විපරම සඳහා සහ නව පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා දීප ව්‍යාප්ත සමීක්ෂණයක් ආරම්භ කරන ලදී .

සේවාවන්

- පොල් ක්ෂේත්‍රයේ කර්මාන්ත සඳහා අවශ්‍ය පොල් මද, පොල් කැබලි හා පොල් කිරි ආනයනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී.
- උසස් තත්ත්වයේ බීජ පොල් නිෂ්පාදනය සිදු කරන ලදී.
- පෞද්ගලික අංශය සමඟ එක්ව තත්ත්වයෙන් උසස් බීජ නිෂ්පාදනය සඳහා බීජ පොල් උයන් සහ මව් ශාක වගාවන් පවත්වාගෙන යාම සිදු කරන ලදී.
- පොල් පර්යේෂණ ආයතනයේ ලියාපදිංචි පොල් පැළ තවාන් අධීක්ෂණය සහ පොල් පැළ සහතික කිරීම සිදු කරන ලදී.
- තැඹිලි පැළ වගාකරුවන් හට ලබා දීමේ අරමුණින් තැඹිලි මව් ශාක වගාවක් පවත්වාගෙන යාම සිදු කරන ලදී.
- කළල රෝපිත දිකිරි පොල් පැළ නිෂ්පාදනය සහ එම පැළ වගාකරුවන්ට නිකුත් කිරීම සිදු කරන ලදී.
- මොනොක්‍රොටොපොස් කෘමිනාශකය ආනයනය සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.
- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පාලනය සඳහා, ‘‘ආරක්ෂිත කලාපය’’ පරීක්ෂා කර රෝගී ගස් සලකුණු කර ඉවත් කිරීම සිදු කරන ලදී.
- පොල් වගාවේ ඵලදායිතාවය වැඩි කළ හැකි ආදර්ශන පවත්වාගෙන යාම සිදු කරන ලදී.
- පොල් වගාවේ ඵලදායිතාවය වර්ධනය කළ හැකි ක්‍රම පිළිබඳව අදාළ පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදී.
- වගාකරුවන්ගේ හා අනෙකුත් බාහිර පාර්ශ්වයන්ගේ ඉල්ලීම පරිදි ඔවුන් විසින් ලබා දෙන පස්, පොල් කොළ සහ පොහොර සාම්පල විශ්ලේෂණය කර වාර්තා ලබා දීම සිදු කරන ලදී.
- තැඹිලි අපනයනය, පොල් ආශ්‍රිත නිෂ්පාදන, රෝග සහ පලිබෝධ මර්දනය, තවාන් පාලනය, පොල් වගාවට සුදුසු ඉඩම් හඳුනාගැනීම ආදිය පිළිබඳව අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීම සිදු කරන ලදී.
- පොල් දළඹුවා මර්දනය සඳහා පරපෝෂිතයන් 525,000 නිදහස් කිරීම මගින් එම පලිබෝධකයා මර්දනය සඳහා කෘමිනාශක යෙදීම අවම කරන ලදී.
- රතු කුරුමිණියා මර්දනය සඳහා ෆෙරමෝන නල 494 ක් සහ ෆෙරමෝන ජෙලි පැකට් 272 ක් නිකුත් කරන ලදී.
- නියඟයට ඔරොත්තු දෙන පොල් ප්‍රභේදවල මව් ශාක සංඛ්‍යාව වැඩි කරගැනීම සඳහා පෞද්ගලික අංශය සමඟ එක්ව බීජ පොල් උයනක් ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කරන ලදී.

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- පොල් වගාවට කාලගුණික විපර්යාස මගින් සිදුවන හානිය අවම කිරීම, ශාක පෝෂණය වැඩි දියුණු කිරීම, පලිබෝධ සහ රෝග මර්දනය, නිවැරදි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම, නව පොල් ප්‍රභේද, පොල් සහ තැඹිලි පටක රෝපණය, පොල් වල අගය එකතු කළ නිෂ්පාදන, පොල් භාවිත කර සෞඛ්‍යමත් ආහාර නිෂ්පාදනය, කෘෂි ආර්ථික සහ සමාජ විද්‍යාත්මක යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ 70ක් පමණ ක්‍රියාත්මක කිරීම.

- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය දැනට පවතින දකුණු පළාතෙන් ඔබ්බට පැතිරීම තවදුරටත් වළක්වා ගැනීම සඳහා “ආරක්ෂිත කලාපය” පවත්වාගෙන යාම සහ හඳුනාගත් රෝගී ගස් සියල්ල සලකුණු කර ඉවත් කිරීම.
- වැලිගම පොල් කොළ මැලවීමේ රෝගයට ප්‍රතිරෝධී පොල් ප්‍රභේද නිෂ්පාදනය සඳහා කොළ කුන්දිරා ගස් 300ක් අත් පරාගනය සිදුකර වසරකට දෙමුහුම් බීජ 12,000ක් පමණ නිෂ්පාදනය
- උසස් තත්ත්වයේ පොල් පැළ මිලියනයක් පමණ සහතික කර වගාකරුවන්ට ලබා දීම.
- පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ බීජ පොල් උයන් 4ක් අධීක්ෂණය කිරීම.
- පෞද්ගලික අංශය සමඟ එක්ව බීජ පොල් උයන් 2ක් ආරම්භ කිරීම.
- පොල් කොළ නාශක දළඹුවා මර්දනය සඳහා පරපෝෂිතයන් මිලියන 1ක් පමණ අවශ්‍යතාවය අනුව මුදා හැරීම.
- තැඹිලි බීජ 20,000ක් පමණ එකතු කර එමගින් නිෂ්පාදිත තැඹිලි පැළ 13,000ක් පමණ වගාකරුවන්ට නිකුත් කිරීම.
- පුහුණු වැඩසටහන් 30ක් පැවැත්වීම.
- උසස් බීජ පොල් නිෂ්පාදනය සඳහා මව් ශාක සංචිතය වැඩි කිරීම සඳහා කටයුතු කිරීම.
- ජාතික අවශ්‍යතාවයන්ට අනුකූලව අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දත්ත හා යෝජනා ලබා දීම.
- පොල් වගා ක්ෂේත්‍රයේ හා කර්මාන්තයේ පවතින ගැටළු හඳුනාගැනීම හා ඒ සඳහා විසඳුම් යෝජනා අදාළ අංශ වෙත යොමු කිරීම.

තල් සංවර්ධන මණ්ඩලය

දැක්ම

ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා ජවයෙන් යුතු ක්ෂේත්‍රයක් වශයෙන් තල් අංශය සංවර්ධනය කිරීම.

මෙහෙවර

දේශයේ දළ දේශීය නිෂ්පාදිතය වෙත සුවිශේෂී දායකයකු වනු පිණිස තිරසාර තල් කර්මාන්තය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ජනප්‍රිය කරවීම හා නියාමනය කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
තල් මව්ශාක තෝරා ගැනීම.	0.30	0.07	මව්ශාක පරීක්ෂා කිරීම ආරම්භ කර ඇත.
තල් බීජ රෝපණය	1.00	0.71	බීජ එකතු කිරීමේ කාර්ය ආරම්භ කර ඇත.
පවතින ආදර්ශ ගොවිපල නඩත්තු කිරීම.	0.20	0.20	තල් වැට අළුත්වැඩියා කිරීමේ කටයුතු අවසන් කර ඇත.
ග්‍රාමීය ප්‍රදේශවල කාන්තා කණ්ඩායම් සඳහා මාස 06ක හස්ත කර්මාන්ත පුහුණු වැඩසටහන් පැවැත්වීම	2.50	0.71	එක් පුහුණු වැඩසටහන් අවසන් කර ඇති අතර, අනෙකුත් අත්කම් පුහුණු වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක වෙමින් පවතී
TOT පුහුණුවීම් පැවැත්වීම	0.30	-	පුහුණු ප්‍රදේශ හඳුනා ගෙන ඇති අතර 2025 නොවැම්බර් මාසයේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.
තරුණ තල් මදින්නන් සඳහා පුහුණුවීම් පැවැත්වීම	0.30	-	
පල්ප් සංරක්ෂණය සහ පල්ප් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව	0.30	0.01	ප්‍රතිලාභීන් හඳුනා ගැනීම සිදු කර ඇත.
තල් සංවර්ධන මණ්ඩලය යටතේ පවතින නිෂ්පාදන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.	4.10	0.80	සිංගනගර් නිෂ්පාදන මධ්‍යස්ථානයේ කටයුතු දැනට සිදුකරන අතර, 2025 ඔක්තෝබර් මාසයේ අවසන් කිරීමට නියමිතය. කරෙයිනගර් හා, කයිතඩි නිෂ්පාදන මධ්‍යස්ථානවලට අදාළ කටයුතු 2025 ඔක්තෝබර් මාසයේ අවසන් කිරීමට නියමිතය අතර, වරතනගර් නිෂ්පාදන මධ්‍යස්ථානයේ කටයුතු අවසන් කර ඇත.
පවතින නිෂ්පාදන උපකරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම.	0.50	0.29	උපකරණ 4ක් අළුත්වැඩියා කර ඇති අතර, එක් උපකරණයක් අළුත්වැඩියා කටයුතු කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
නව කට්පහම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම (උප්පුවේලි, ත්‍රිකුණාමලය)	2.00	1.68	ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.
සුපිරි වෙළඳසැල්වල ෆැන්චයිස් අලෙවි ඒකකයන් විවෘත කිරීම.	0.50	0.05	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතී.
අපනයන ප්‍රවර්ධන ක්‍රියාකාරකම්	0.50	0.36	අපනයන ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වලට අදාළ අපනයනකරුවන්ගේ රැස්වීම් පවත්වා ඇත.
ඩිජිටල් අලෙවිකරණය සහ තල් නිෂ්පාදන ප්‍රචලිත කිරීම.	0.50	0.25	අත්පොත් සහ පත්‍රිකා සැකසීම අවසන් කර ඇත.
කට්පහම් අලෙවි මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.	0.50	0.14	නල්ලූර් සහ කොළඹ යන ප්‍රදේශවල යටිතල පහසුකම් වෙනස් කිරීම්, සවි කිරීම්, නාම පුවරු සහ ආලෝක පුවරු සඳහා ප්‍රසම්පාදන කටයුතු දැනට සිදුකරමින් පවතී.

තල් කර්මාන්තය නංවාලීම සඳහා පර්යේෂණ පැවැත්වීම	0.30	0.13	ප්‍රසම්පාදන කටයුතු අවසන්. පර්යේෂණ කටයුතු දැනට සිදු කරමින් පවතී.
පර්යේෂණ සොයාගැනීම් ප්‍රචාරණය සහ වාණිජකරණය කිරීම.	0.10	0.07	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතී.
ජංගම තත්ව පාලන ඒකකයක් ස්ථාපිත කිරීම	0.60	-	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතී.
ISO විෂය පථය පුළුල් කිරීම සහ නඩත්තු කිරීම	2.00	1.47	ඇණවුම ලබා දී ඇති අතර, 2025 දෙසැම්බර් මාසයේ අවසන් කිරීමට නියමිතය.
ආයතනික පහසුකම් වැඩිදියුණු කිරීම	1.00	0.44	ලැප්ටොප් මිල දී ගැනීම සිදු කර ඇති අතර වායුසමීකරණ අළුත්වැඩියාව සිදු කරමින් පවතින අතර එක් වායුසමීකරණයක් ලබාගැනීමට අදාළව ඇනවුම ලබා දී ඇත.
උපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපාංග නඩත්තු කිරීම.	0.20	0.07	උපකරණ අළුත්වැඩියාව සිදු කරමින් පවතින අතර ඔක්තෝබර් මාසයේ නිම කිරීමට නියමිතය.
ආයතනික වත්කම් සංවර්ධනය	1.10	0.52	අල්මාරිය හා ඇඟිලි සලකුණු යන්ත්‍රය මිල දී ගෙන ඇත.
ප්‍රධාන කාර්යාලයේ සම්මන්ත්‍රණශාලා වල ඩිජිටල්කරණ පහසුකම් ඇති කිරීම	0.50	-	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතී.
කයිතඩි තල් පුහුණු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ වැඩ නිම කිරීම	3.00	0.83	ප්‍රතිපාදනවලින් කොටසක් ගෙවීම් කර ඇත.
පවතින වාහනයේ තත්ත්වය වැඩිදියුණු කිරීම	1.00	0.68	වාහන 2හි නඩත්තු කටයුතු සිදු කර ඇත.
ප්‍රධාන කාර්යාල පරිශ්‍රයන්හි වාහන නැවැත්වීමේ පහසුකම් නිසි ලෙස ස්ථාපිත කිරීම.	1.00	1.00	ටෙන්ඩරය ප්‍රදානය කර ඇත.
පරිපාලන වියදම්	0.70	-	

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
පුනරාවර්තන වියදම්	160	100.6	100.6	-	-
ප්‍රාග්ධන වියදම්	25.0	22.3	18.15	10.48	-

2026 වර්ෂයේ දී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යෝජිත විශේෂ ක්‍රියාකාරකම්

- තල් ගස් වැවීමේ ක්‍රියාවලින් සංවර්ධනය කිරීම.
- තාක්ෂණික පුහුණුවීම් ලබා දීමෙන් බල ගැන්වීම සහ සංවර්ධනය කිරීම.
- තල් ආශ්‍රිත නිෂ්පාදන වල නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- අලෙවිකරණ ජාලය පුළුල් කිරීමෙන් තල් සංවර්ධන මණ්ඩලයේ විකුණුම් වැඩි කිරීම.
- පර්යේෂණ සහ සංවර්ධනය.
- පාර්ශ්වකරුවන්ට සහ මහජනතාවට ඵලදායී සේවාවක් සැපයීම සඳහා ආයතනය ශක්තිමත් කිරීම.

කිතුල් සංවර්ධන මණ්ඩලය

දැක්ම

ලංකාවේ කිතුල් කර්මාන්තයේ තිරසාර සංවර්ධනයට උත්ප්‍රේරකයක් වීම.

මෙහෙවර

තම ප්‍රජාව විසින්ම ලබාගෙන නිෂ්පාදනය කරනු ලබන ශ්‍රී ලාංකේය කිතුල් නිෂ්පාදන පරිභෝජනයට දේශීය ජනතාව උනන්දු කරවන අතරම ගෝලීය වෙළෙඳපොළ ජයගැනීම සඳහා සවිබල ගැන්වූ කිතුල් ව්‍යවසායකයින් හරහා රටට තිරසාර ආර්ථික වර්ධනයක් ගෙන දෙමින් ශ්‍රී ලාංකේය කිතුල් නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඉහළ නංවාලීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
කිතුල් ක්ෂේත්‍රයට අදාළ මූලික දත්ත එකතු කිරීම	1.00	-	*ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීම *විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් යොදා ගනිමින් නියමු ව්‍යාපෘතියක් වශයෙන් කොලොන්න ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ආශ්‍රිතව දත්ත ලබා ගැනීමට සැලසුම් කිරීම. ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලදී. * කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය සමග සාකඡා කර සමීක්ෂණයක් සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීම
කිතුල් ආශ්‍රිත ව්‍යවසායකත්ව සංවර්ධනය	6.80	1.97	*ආහාර ආරක්ෂිතව නිෂ්පාදනය සහ GMP තත්ත්ව සහතිකය ලබා ගැනීම පිළිබද කිතුල් ආශ්‍රිත නිෂ්පාදකයින් 30දෙනෙකු පුහුණු කිරීම *මාතලේ හා දෙනියාය ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල ව්‍යවසායකයින්ට මූල්‍ය සහ කළමනාකරණ දැනුම ලබා දීම. *අපජල කළමනාකරණය සඳහා දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් බැංකු විදු පියසෙහි පැවැත්විය. *කිතුල් පිටි නිෂ්පාදනය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය හුවමාරු වැඩසටහනක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවැත්විය * කිතුල් මල්මැදිමේ පුහුණුකරුවන් 47දෙනෙකු පුහුණු කිරීම. * NVQ සුදුසුකම ලබා දීම සඳහා අයදුම්පත් ලබා ගැනීමට අවශ්‍ය මල් මැදීමේ පුහුණුව කිතුල් මල් මදින්නන් 331දෙනෙකු ලබා දී ඇත. *GMP ලබා දීම සඳහා අයදුම්පත් කැදවීමට පුවත්පත් දැන්වීම් පළ කිරීම හා කර්මාන්ත 18ක් තෝරා ගෙන එම කර්මාන්ත වලට GMP තත්ත්වය ලබා ගත හැකි වන පරිදි උපදේශනය ලබා දීම *තිනියාවල හා පාලින්දනුවර කිතුල්

			නිෂ්පාදනාගාර වල තත්වය අධීක්ෂණයෙන් මෙම වසර තුල GMP ලබා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම
අලෙවි ප්‍රවර්ධනය හරහා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම.	2.75	1.29	*"සහසක් නිමැවුම්" ජාතික ප්‍රදර්ශණය සඳහා සහභාගී වීම හා අත් පත්‍රිකා මුද්‍රණය කිරීම. *කිතුල් ආශ්‍රිත වෙළඳ ප්‍රදර්ශණයක් පැවැත්වීම සඳහා මාධ්‍ය ප්‍රචාරණයටද ලබා ගැනීමේ අරමුණු ඇතිව කිතුල් කර්මාන්තය ලෝක උරුමයක් කිරිම සඳහා UNESCO සංවිධානයට ඉදිරිපත් කිරීමට වීඩියෝ පටයක් නිර්මාණය කිරීම *ලෝක පොල් දිනය වෙනුවෙන් මුලතිව් හි පවත්වන ලද ප්‍රදර්ශනයේ කිතුල් සංවර්ධන මණ්ඩලයේ වෙළඳකුටිය නියෝජනය කිරීම සඳහා සහභාගී වීම *HOTEL SHOW COLOMBO-2025 සඳහා වෙළඳකුටි වෙන් කිරිම, එක් ප්‍රදර්ශන කුටියක් බාවිතයෙන් කිතුල් පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම සහ කුටි 5ක් හරහා ව්‍යවසායකයින් 5දෙනෙකුට අලෙවි අවස්ථාව ලබා දීම. *කිතුල් භාවිතයෙන් කල හැකි ආහාර නිෂ්පාදන පිළිබදව ප්‍රදර්ශනයක් පැවැත්වීම සම්බන්ධයෙන් සූපවේදීන් දැනුවත්කිරීම හා සංචාරක සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ සාකච්ඡාව * සංචාරක කලාප ආශ්‍රිතව ජාතික ශිල්ප සභාව මගින් ඉදි කරන කුටියක් ලබා ගැනීමට කටයුතු සිදු කිරීම
උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම	0.58	0.01	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සකස් කරන ලද උපාය මාර්ගික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල අතර මණ්ඩලයේ ඉදිරි දැක්මට අනුකූලවන පරිදි සංශෝධනය කිරීමට යෝජනා විය
පර්යේෂණය හා සංවර්ධනය ශක්තිමත් කිරීම	4.00	-	පර්යේෂණ පත්‍රිකා කැඳවා ඇත.පර්යේෂණ 5ක් සඳහා යෝජනා ලැබී ඇත. ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතියි.
නීති රීති පද්ධතිය සංවර්ධනය හාපවත්වාගෙන යාම	1.33	0.05	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික සේවා අධිකාරිය හා එක්ව සිදුකරන ලද සාකච්ජා අනුව තාක්ෂණ වාර්ථාවට අවශ්‍ය වෙළඳපලහි පවතින කිතුල් සාම්පල පරීක්ෂා කිරීම සඳහා කිතුල් සාම්පල විවිධ වෙළඳනාමයගෙන් මිලදී ගැනීම හා විශ්ලේෂන වාර්ථා සඳහා පර්යේෂණ ආයතන වලින් මිල කැදවුම් කැඳවීම සිදු කර ඇත. ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.
ආදර්ශ වගාව සඳහා සුදුසු ඉඩමක් හඳුනාගෙන එය සංවර්ධනය කිරීම	3.50	0.08	* කළුබෝවිටියාන, කුරුණෑගල වැවිලි, ජනතා වතු සංවර්ධන, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, සීමාසහිත හලාවත වැවිලි සමාගම, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම යන රාජ්‍ය ආයතන වලට සුදුසු භූමියක් ලබා දෙන මෙන් ඉල්ලීම් යොමු කර ඇත. *බදුල්ල උළුගල කිතුල් වගාව තුළ මල්මැදීම

			ආරම්භ කිරීම හා කිතුල් ගස් ඇති ස්ථාන සිතියම් ගත කිරීම. *කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පනිල් කන්ද නම් ප්‍ර දේශයේ වගාව සඳහා මූලික කටයුතු සිදු කිරීම
පරිපාලන වියදම්	0.04	0.02	නකල්ස් ව්‍යාපෘතියේ මූලික අධියර සහභාගි වීම.
එකතුව	20.00	**3.42**	

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)
පුනරාවර්තන වියදම්	33	-	11.78	11.00	0.00
ප්‍රාග්ධන වියදම්	20	6.98	11.45	2.43	0.99

2026 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත ව්‍යාපෘති

- කිතුල් කර්මාන්තයට කැමති ආයෝජකයන් හඳුනා ගැනීම සහ කර්මාන්තය කෙරෙහි සාමාජීය ආකල්පමය වෙනසක් ඇති කිරීම - (රු.මි. 1.00)
- නව තාක්ෂණික ක්‍රමවේදයන් ක්ෂේත්‍රයට හඳුන්වා දීම තුළින් දැනට මල් මැදීමට නොහැකි ගස් භාවිතයට ගැනීම. - (රු.මි. 2.30)
- කිතුල් ආශ්‍රිත අපනයන ව්‍යවසායකයන් සවිබල ගැන්වීම - (රු.මි. 2.50)
- අන්තර්ජාතික අලෙවිය සඳහා උපාය මාර්ග සැකසීම - (රු.මි. 2.00)
- කිතුල් ආශ්‍රිතව කල හැකි අනෙකුත් නිෂ්පාදන සඳහා යෝජ්‍ය තාක්ෂණය හඳුන්වා දීම තුළින් ක්ෂේත්‍රයට නව ව්‍යාසායකයන් එක් කර ගැනීම සහ වර්තමාන ව්‍යවසායකයන් සවිබල ගැනීවීම - (රු.මි. 2.50)
- කිතුල් වාණිජ වගාවක්ලෙස වගා කිරීම සහ සාමාන්‍ය වගාවක්ලෙස ප්‍රචලිත කිරීම තුළින් අනාගතයේ අමුද්‍රව්‍ය සැපයුම අඛණ්ඩව ලබා ගැනීම - (රු.මි. 3.00)
- කිතුල් පිටි සහ කිතුල් පිටි ආශ්‍රිත නිෂ්පාදන දිරි ගැන්වීම සහ නිෂ්පාදන කර්මාන්තවලට අවශ්‍ය උපකරණ සහ යන්ත්‍ර වැඩිදියුණු කිරීම - (රු.මි. 3.00)
- කිතුල් මල් මදින කාර්මිකයන්ගේ සහ ව්‍යවසායකයන්ගේ යාවත්කාලීන කල හැකි දත්ත පද්ධතියක් සකස් කිරීම - (රු.මි.1.20)

විශේෂ ව්‍යාපෘති සඳහා

- හඳුනාගත් ව්‍යවසායකයන්ට මල් මදින කාර්මිකයන් සම්බන්ධ කිරීම හරහා දැනට පවතින ගස් ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනීම ප්‍රවර්ධනයට කිරීම - (රු.මි.2.50)
- කිතුල් කර්මාන්තය ආශ්‍රිත ව්‍යවසායකයන් සවිබල ගැන්වීම තුළින් මල්මදින කාර්මිකයන්ගේ ආදායම වැඩි කිරීම - (රු.මි.10.00)

ශ්‍රී ලංකා කජු සංස්ථාව

දැක්ම

ඉතාමත් උසස් තත්ත්වයේ කජු නිෂ්පාදනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ලෝකයේ කජු අපනයනය කරන ප්‍රමුඛතම රටක් බවට පත් කිරීම.

මෙහෙවර

කජු වගාව, නිෂ්පාදනය, පිරිසැකසුම් තාක්ෂණය, අගය එකතු කිරීම, පර්යේෂණ හා අලෙවි ප්‍රවර්ධන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ගොවීන් සහ අදාල පාර්ශ්වයන් වෙත වෘත්තීයමය මඟ පෙන්වීම ලබා දීම තුළින් දිගු කාලීන වූ වාණිජමය ශක්‍යතාවයක් ළඟා කර ගැනීමට හැකි වන පරිදි කජු කර්මාන්තය නඟා සිටුවීම.

ක්‍රියාත්මක සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
මඩකලපුව දිස්ත්‍රික්කයේ මාන්කර්ණි අදියර II වතුයායේ අක්කර 23 ක් නඩත්තු කිරීම	0.7	0.32	කජු අක්කර 23 හිම වල් මර්දන කටයුතු සිදුකර පළිබෝධනාශක යොදා ඇත.
මන්නාරම දිස්ත්‍රික්කයේ කොණ්ඩච්චි වතුයායේ අක්කර 850 ක් නඩත්තු කිරීම	8.0	1.05	මෙම වතුයායේ කජු අක්කර 600 ක් නඩත්තු කර ඇත.
මඩකලපුව දිස්ත්‍රික්කයේ හාඩි වතුයායේ පොල් අක්කර 25 ක් නඩත්තු කිරීම	0.70	0.1	අක්කර 25 හි වල් මර්දන සහ ජලසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.
එළුවන්කුලම වතුයායේ අලි අගල මීටර් 2450 ක් ස්ථාපනය කිරීම	5.6	-	මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී.
කජු සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්19 ක බද්ධ කජු අක්කර 1470 ක් ගොවීන් 1000 ක් මඟින් වගාකිරීම.	1.5	1.5	මෙම ව්‍යාපෘතිය සඳහා ගොවීන් 2,543 ක් තෝරාගෙන ඇති අතර බද්ධ කජු ඉඩම් අක්කර 1,158.97 ක් තෝරාගෙන ඇත. ගොවි පුහුණු පන්ති 177 ක් පවත්වා ගොවීන් 1,095 ක් පුහුණුකර ඇත.
බහු වාර්ෂික දිගු කාලීන පර්යේෂණ වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කිරීම.	2.0	1.38	පර්යේෂණ වැඩසටහන් 06හි වගාව නඩත්තුව 75%ක් සම්පූර්ණ කර ඇත. පර්යේෂණ වැඩසටහන් 06හි වාර්ෂික දත්ත එකතු කිරීම 70%ක් සම්පූර්ණ කර අවසන්ය.
වාර්ෂික කෙටිකාලීන පර්යේෂණ වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීම	1.0	0.67	පර්යේෂණ වැඩසටහන් 06හි වගාව නඩත්තුව 70 % ක් සම්පූර්ණ කර ඇත. පර්යේෂණ වැඩසටහන් 06හි වාර්ෂික දත්ත එකතු කිරීම 70%ක් සම්පූර්ණ කර අවසන්ය.
කජු අතුරු නිෂ්පාදන භාවිතයෙන් සිදු කරන ව්‍යාපෘතිය යටතේ කජු පුහුළන් මධ්‍යසාර නිෂ්පාදනය සංවර්ධනය සහ කජු ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය.	0.5	0.36	මෙම ව්‍යාපෘතියේ සංකල්ප පත්‍රිකාව වයඹ විශ්ව විද්‍යාලය සහ රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. සම්පත් දායකයා ලෙස කර්මාන්ත තාක්ෂණ ආයතනය (ITI) තෝරාගෙන ඇත. ITI ආයතනය මගින් කජු පුහුළන් භාවිතයෙන්

			වයින් නිපදවීමට සංස්ථාවේ නිලධාරීන් 04 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී. එමෙන්ම කජු පුහුලන් භාවිතයෙන් වයින් නිෂ්පාදනය කිරීම පර්යේෂණ මට්ටමින් සිදු කර අවසන්ව ඇති අතර, ඒ සඳහා ITI වාර්තාවද ලැබී ඇත.
ස්ථාවර වත්කම් කළමනාකරණය අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම.	4.3	0.2	කාර්යාලීය උපකරණ කොටසක් ඇණවුම් කර ඇත. කොටසකට නැවත මිල ගණන් කැඳවීමට කටයුතු කරමින් පවතී.
කාර්යාල ගෘහභාණ්ඩ මිලදී ගැනීම.			අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම අවසන් කර ඇත.
මෙවලම් හා උපකරණ මිලදී ගැනීම.	2.2	0.36	මෙම භාණ්ඩ මිලදීගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.
රථවාහන නඩත්තු කිරීම	1.0	-	සංස්ථාවේ ප්‍රතිපාදන සීමා වීම හේතුකොටගෙන, භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් පමණක් අළුත්වැඩියා කටයුතු සිදු කළ නොහැකි බැවින්, මෙම වාහනයේ අළුත්වැඩියා කටයුතු සිදු කරනු නොලැබේ.
ගොඩනැගිලි නඩත්තු කිරීම	1.0	-	මේ වන විට පැරණි ගොඩනැගිල්ලේ (Partition) ගළවා රත්මලානේ පිහිටි නව ගොඩනැගිල්ල සකස් කොට ආයතනය එහි ස්ථාපිත කර ඇත.
මානව සම්පත් සංවර්ධනය යටතේ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු මගින් නිලධාරීන් පුහුණු කිරීම.	1.5	0.25	*ප්‍රසම්පාදනය පිළිබඳ දෙදින පුහුණු, වැඩසටහන් 15 ක්, නිලධාරීන් 23 දෙනෙකු සඳහා කාර්යාලීය කටයුතු වලට අදාළ පුහුණුවීම් ලබාදීම. කාර්යාල කාර්ය සහායකයින් සහ රියදුරන් 07 දෙනෙකු සඳහා එක්දින වැඩමුළුවක් පැවැත්වීම.
			නිලධාරීන් 02 සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේදී (ITI) කජු අගය එකතුකල නිෂ්පාදන පිළිබඳ පුහුණුවක්, නිලධාරීන් 02දෙනෙකු සඳහා මූලික විමර්ෂණ පිළිබඳ එක් දින පුහුණුවක්, නිලධාරියෙකු සඳහා වතුයායන්හි ස්ථිරසාර අන්දමින් සකස් කිරීමකට ළඟා වීම සම්බන්ධ පුහුණුවක් ලබා දී ඇත.
එකතුව	**30.00**	**6.19**	

ක්‍රියාත්මක සැලැස්මට අනුව ව්‍යාපෘතීන්හි ප්‍රගතිය (2025.09.30 දිනට)

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
සංස්ථා අලෙවිසැල්වල විකිණීම, සංස්ථාව මගින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති සහ සංස්ථා වතුයායන්වල සිටුවීම සඳහා සංස්ථාවේ මධ්‍යම පැළ තවාන් 08 ක අව්‍යාජ බද්ධ කජු පැළ 50,000 ක් නිෂ්පාදනය කිරීමට පොලි බෑග් 62,500 ක් මිලදී ගැනීම.	1.39	0.58	බද්ධ කජු පැළ 50,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා පොලි බෑග් 62,500 ක් මිලදීගෙන ඇත.
බද්ධ කජු පැළ 62,500 ක් බද්ධ කිරීම ආරම්භ කිරීම	6.65	1.14	කමන්දළුව පැළ තවානේ කජු පැළ 6000 ක් පමණ බද්ධකර ඇත.
2024 වර්ෂයේ වගා කළ පැළ	8.85	3.67	පෙර වර්ෂයේ (2024) ඉතිරි පැළ 124694ක්

නඩත්තු කිරීම			නඩත්තු කිරීම සිදු කර ඇත (29685ක් නිකුත් කර ඇත)
එළුවන්කුළම වතුයායේ නොමේරූ කජු අක්කර 115ක් නඩත්තු කිරීම.	1.94	0.71	කජු අක්කර 50ක වල් මර්දන කටයුතු සිදු කර ඇති අතර, අක්කර 65ක පැළ සිටුවීම සඳහා භූමිය සූදානම් කර ඇත.

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
මාන්කර්නි අදියර II හි නොමේරූ කජු අක්කර 23ක් නඩත්තු කිරීම.	0.43	-	මේ සඳහා මෙම මුදල් වැයකර නොමැත.
පුත්තලම වතුයායේ නොමේරූ කජු අක්කර 100ක් නඩත්තු කිරීම.	0.60	0.51	කජු අක්කර 60ක් නඩත්තු කර අවසන්ය.
කොණ්ඩච්චි වතුයායේ නොමේරූ කජු අක්කර 850ක් නඩත්තු කිරීම.	4.26	1.22	මේ සඳහා මෙම මුදල් වැයකර නොමැත.
කමන්දළුව වතුයායේ නොමේරූ පොල් අක්කර 25ක් නඩත්තු කිරීම.	0.80	0.54	පොල් අක්කර 25ක් නඩත්තු කර අවසන්ය.
හාඩි වතුයායේ නොමේරූ පොල් අක්කර 25ක් නඩත්තු කිරීම.	0.70	-	අක්කර 25හිම වල් මර්දනය සහ ජලසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.
සංස්ථා වතුයායන් නඩත්තු කිරීම මගින් ලෙලි කජු මෙ.ටො. 183ක ගබඩා බර අස්වැන්නක් ලබා ගැනීම.	81.49	38.67	ලෙලි කජු මෙ. ටො. 71.02ක (ක්ෂේත්‍ර බර) අස්වැන්නක් ලබාගෙන ඇත.
සංස්ථා වතුයායන් නඩත්තු කිරීම මගින් පොල් ගෙඩි 70,000ක අස්වැන්නක් ලබා ගැනීම.			පොල් ගෙඩි 30,161ක අස්වැන්නක් ලබාගෙන ඇත.
පුනරීන් වතුයායේ අක්කර 30ක් පුනරුත්ථාපනය කිරීම.	2.49	-	ප්‍රතිපාදන සීමා වීම හේතුකොටගෙන මෙම ක්‍රියාකාරකම සිදු කරනු නොලැබේ.
වෙල්ලන්කුළම වතුයායේ අක්කර 30ක් පුනරුත්ථාපනය කිරීම.	2.49	-	ප්‍රතිපාදන සීමා වීම හේතුකොටගෙන මෙම ක්‍රියාකාරකම සිදු කරනු නොලැබේ.
කමන්දළුව වතුයායේ අක්කර 15ක් පුනරුත්ථාපනය කිරීම.	0.97	-	ප්‍රතිපාදන සීමා වීම හේතුකොටගෙන මෙම ක්‍රියාකාරකම සිදු කරනු නොලැබේ.
මාන්කර්ණි,පුනරීන්,වෙල්ලන්කුලම හා කමන්දළුව වතුයායන් සඳහා කජු පොහොර මිලදී ගැනීම	4.21	-	පොහොර මිලදී ගැනීම 04 වන කාර්තුවේදී සිදුකිරීමට නියමිතයි.
හාඩි හා කමන්දළුව වතුයායන් සඳහා පොල් පොහොර මිලදී ගැනීම.	2.80	-	පොහොර මිලදී ගැනීම 04 වන කාර්තුවේදී සිදුකිරීමට නියමිතයි.

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	භෞතික ප්‍රගතිය
පුත්තලම වතුයායේ Polytunnel එකක් ස්ථාපිත කිරීම	2.50	-	මෙය 04 වන කාර්තුවේදී ස්ථාපිත කිරීමට නියමිතය.
කජු සහනාධාර යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික් 19 ක බද්ධ කජු අක්කර 1470 ක් ගොවීන් 1000 ක් මඟින් වගාකිරීම.	6.70	2.58	•මෙම ව්‍යාපෘතිය සඳහා ගොවීන් 2,543 ක් තෝරාගෙන ඇති අතර බද්ධ කජු ඉඩම් අක්කර 1158.97 ක් තෝරාගෙන ඇත . • ගොවි පුහුණු පන්ති 177 ක් පවත්වා ගොවීන් 1,095 ක් පුහුණුකර ඇත.
බහු වාර්ෂික දිගු කාලීන පර්යේෂණ වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කිරීම.	0.39	-	පර්යේෂණ වැඩසටහන් 06හි වගාව නඩත්තුව 70%ක් සම්පූර්ණ කර ඇත.
ලෙලි කජු මෙ. ටො. 300ක් පිරිසැකසුම් කොට කජු මද මෙ.	105.44	35.19	ලෙලි කජු මෙ. ටො. 108.78ක් පිරිසැකසුම් කොට කජු මද මෙ. ටො. 20.40 ක්

ටො. 60ක් ලබා ගැනීම.			ලබාගෙන ඇත.
සංස්ථාවේ අලෙවිසල්, වරලත් අලෙවි සල් සහ ප්‍රදර්ශන හරහා සංස්ථාවේ කජු මද මෙ. ටො. 50ක් අලෙවිකරණය සහ බෙදා හැරීම.	11.40	3.87	කජු මද මෙ. ටො. 19.55 අලෙවිකරණය සහ බෙදා හැරීම සිදු කර ඇත.
රථවාහන නඩත්තු කිරීම	1.5	-	සංස්ථාවේ ප්‍රතිපාදන සීමා වීම හේතුකොටගෙන, භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් පමණක් අළුත්වැඩියා කටයුතු සිදු කළ නොහැකි බැවින්, මෙම වාහනයේ අළුත්වැඩියා කටයුතු සිදු කරනු නොලැබේ
එකතුව	**248.00**	**88.68**	

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු.මිලි)	අතැති බිල්පත්
පුනරාවර්තන වියදම්	100.00	79.80	79.80	-
ප්‍රාග්ධන වියදම්	30.00	12.50	6.20	-

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- උතුරු සහ නැගෙනහිර පළාත්වල ගොවි පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් කජු පොකුරු ගම්මාන ව්‍යාපෘතිය ඇතිකිරීම. (රු.මි.7.84)
- ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් ඉඩම්වල මිනුම් කටයුතු සිදුකිරීම (රු.මි.8.755)

2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

- නව වගා වැඩසටහන(New Planting) - (රු.මි.12.00)
- ජාතික කජු නිෂ්පාදනය 10% කින් වැඩි කිරීම සඳහා ඉඩම් අක්කර 1600 ක බද්ධ කජු වගා කිරීම සහ සංස්ථාවේ ඉඩම් අක්කර 20 ක බද්ධ කජු වගා කිරීමට සැලසුම් කර ඇත.
- කජු වගාවේ පවතින ඉඩම් ඵලදායිතාවය ඉහළ නැංවීම(Cashew Land Productivity Improvement)
- ජාතික මට්ටමෙන් සහ සංසථාවේ පවතින ඉඩම්වල ඵලදායීතාවය 25% ඉහළ නැංවීම සඳහා
- ඵලදායී නොවන සංස්ථාවේ කජු ඉඩම් අක්කර 1065ක් පුනරුත්ථාපනය කිරීම හා ඵලදායී නොවන ගොවි කජු ඉඩම් අක්කර 800 ක් පුනරුත්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.
- කජු ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අවශ්‍ය විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමට (Research and Development) සැලසුම් කර ඇත.
- ක්ෂේත්‍රයේ පවතින ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පර්යේෂණ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- කජු නිෂ්පාදන සහ කර්මාන්ත සංවර්ධනය (Cashew Product & industry Development)
- කජු ආශ්‍රිතව සිදු කල හැකි නිෂ්පාදන හා අතුරු නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.

  උදා කජු පුහුලම් ආශ්‍රිතව වයින් නිෂ්පාදනය හා කජු ලෙලි ආශ්‍රිත නිෂ්පාදන
- කජු වගාව සහ නිෂ්පාදන ක්‍රියාවලිය සහතිකකරණය හඳුන්වා දීමට සැලසුම් කර ඇත.
- වගාව සඳහා යහපත් වගා පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි.
- වතුකළමනාකරණය සහ සුහුරුතාක්ෂනය යොදා ගැනිම පිළිබඳව කුසලතා සංවර්ධනය, පිළිබඳ පුහුණුවක් ලබා දීම, වාහන නඩත්තුව සහ කජු සැකසීමේ ව්‍යුහ හා උපාංග ගුණාත්මක සංවර්ධනය සහ ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සිදු කිරීමට අපේක්ෂිතය.

කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය

දැක්ම

ශ්‍රී ලාංකීය කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණයේත්, නිෂ්පාදනයේත්, ප්‍රවර්ධනයේත්, ප්‍රමුඛයා බවට පත් වීම

මෙහෙවර

ජාත්‍යන්තර සහ දේශීය කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය තුල ඒවායේ අගය, ගුණාත්මකභාවය ඉහල නැංවීමට කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වල සහතිකකරණය, ප්‍රමිතිකරණය සහ සම්බන්ධීකරණය පිළිබද වගකිව යුතු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය ලෙස පෙනී සිටිම.

අයවැය ඇස්තමේන්තු මඟින් සෘජුවම ප්‍රතිපාදන ලැබෙන ව්‍යාපෘතිවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු. මි.)	2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)	2025.09.30 දිනට භෞතික ප්‍රගතිය (රු.මි.)
1.	I.ශක්තිමත් අලෙවිකරණ ජාලයක් සකස් කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගයක් ලබාගැනීම.	0.188	0.188	100%
	II. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදකයින් ආයතනයේ ලියාපදිංචි කිරීම.	0.108	0.108	100%
2.	ලියාපදිංචිය සඳහා ව්‍යවසායකයින් දැනුවත් කිරීම(ප්‍රචාරණ වැඩසටහන්)	0.1	0.1	100%
3	ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් හට තත්ත්ව සහතක නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම.	3.2	1.795	70%
4.	කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව වෙළඳපොළ හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය	4.2	-	-
5.	ක්ෂේත්‍රයේ නව නිෂ්පාදන ව්‍යවසායකයින් වෙත හඳුන්වාදීම(innovation products)	1.17	0.945	95%
6.	I. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධන වැඩසටහන්	0.25	0.118	60%
	II.ක්ෂේත්‍රයේ නිෂ්පාදකයන්ගේ ධාරිතාව සංවර්ධනය කිරීමේ වැඩසටහන්	0.8	-	10%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

වැඩසටහන	අනුමත ප්‍රතිපාදන (රු. මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය (රු. මි.)	අතැති බිල්පත් (රු. මි.)
ප්‍රාග්ධන	10	4.196	4.25	3.28	0.004
පුනරාවර්ථන	48	36.50	36.10	33.01	-

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- ක්ෂේත්‍රයේ කුඩා පරිමාණ ව්‍යවසායකයින් යහපත් නිෂ්පාදන පිළිවෙත් සහතික ලබා ගැනීමේ තත්වයට ලඟා කර ගැනීම සඳහා සහය ලබා දීම.

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- කුළුබඩු නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන 25 ක් සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) සහතික පත් ලබා දීම.
- ISO ප්‍රමිති සහතික 10 ක් ලබා දීම.
- කුළුබඩු නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන 10 ක් ISO ප්‍රමිති මට්ටමට ළඟා කර වීමට කටයුතු කිරීම.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

දැක්ම

ප්‍රාදේශීය මට්ටමින් හොඳම මැදරට පාරම්පරික තේ නිෂ්පාදකයා වීම මගින් ඉහළම ශුද්ධ අලෙවි මිලක් ලබා ගැනීමෙන් ලාභ ලබන හා ශක්තිමත් රාජ්‍ය ආයතන අතරින් එකක් බවට පත්වීම ය.

මෙහෙවර

උපරිම කැපවීමකින්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් පුද්ගල නිපුනතාවයන් සංවර්ධනයට වැඩි සැලකිල්ලක් දක්වමින් කණ්ඩායම් ක්‍රියාකාරිත්වය හරහා අරමුණු කරා ලඟා වීම තුළින් කර්මාන්ත අභිවෘද්ධියේ ප්‍රතිලාභ සමස්ථ රටටම හිමි කර දීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

විස්තරය	වාර්ෂික ඉලක්කය	2025.09.30 දිනට ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය
කර්මාන්තශාලාව අනුව තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මි.)			
හෝප්	393,750	303,504	124,708
ලෙවලන්	270,000	212,787	174,181
ලූල්කඳුර	215,000	165,400	151,385
හෝග නිෂ්පාදනය (කි. ග්‍රෑම්.)			
තේ	7,655,000	5,877,516	4,436,258
රබර්	383,182	306,491	286,945
වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.)			
තේ	24	18	05
රබර්	20	10	0

2025 ක්‍රියාත්මක සැලැස්ම තුළ වූ විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

විස්තරය	වාර්ෂික ඉලක්ක		2025.09.30 දිනට ප්‍රගතිය	
	මූල්‍යය (රු.මි.)	භෞතික (කි. ග්‍රෑම්.)	මූල්‍යය (රු.මි.)	භෞතික (කි.ග්‍රෑම්.)
හෝගය : නිමි තේ රබර්		1,667,005 383,182		972,516 286,945
වියදම : තේ රබර්	1786.56 215.56		953.66 150.17	
ආදායම : තේ රබර්	1824.78 239.51		831.21 191.13	
ලාභ/අලාභ : තේ රබර්	38.22 23.95		(122.45) 40.96	
වෙනත් ආදායම්	214.00		41.14	
වතුයායන්හි සම්පූර්ණ ලාභය/අලාභය	276.17		(40.35)	
ජන තේ ලාභය/අලාභය	72.51		13.04	
ප්‍රධාන කාර්යාලය	(61.48)		(55.68)	
සම්පූර්ණ ලාභය/ අලාභය	287.10		(82.99)	

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	වාර්ෂික ඉලක්කය(රු.මි.)	2025.09.30 දිනට ඉලක්කය(රු.මි.)	ප්‍රගතිය (රු.මි.)
ප්‍රාග්ධන	716.66	514.89	22.12
පුනරාවර්තන	2677.82	2034.46	1317.91

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට යොජිත විශේෂ ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යෝජනා

- නිමි තේ අපනයනය මගින් හා Hand made tea නිෂ්පාදන මගින් අදායම වැඩි කිරීමට අදහස් කොට ඇත.
- දිවයින පුරා තේ අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කොට දේශීය තේ අලෙවියේ වර්ධනයක් ඇති කිරීම.
- සංචාරක කර්මාන්තයට දියුණු කිරීමේ උපායමාර්ගයක් ලෙස දූලකදුර වතුයායේ සහ කොළපතන වතුයායේ වතු බංගලා වැඩිදියුණු කොට Eco Tourism සංකල්පය මගින් ආයතනයේ ආදායම ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.
- තේ වගාව සඳහා හෙක්ටයාර 40 ක් ද, රබර් වගාව සඳහා හෙක්ටාර 15 ක්ද වගා කිරීම අපේක්ෂා කෙරේ.
- වතු ජනතාවගේ සුභ සාධන කටයුතු වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ලෙස නිවාස ලබාදීම,ජලය,විදුලි බලය,වැසිකිලි පහසුකම්, පාසැල් හා ක්‍රීඩා පිට්ටනි අළුත්වැඩියාව හා වෙනත් සුභ සාධන කටයුතු කිරීම.

සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

දැක්ම

හොඳම ශ්‍රී ලාංකීය සීටීසී හා සාම්ප්‍රදායික තේ නිෂ්පාදනය සහ අලෙවිකරණයේ වඩාත්ම පිළිගත් ආදර්ශමත් ආයතනයක් වීම.

මෙහෙවර

අභ්‍යන්තර හා බාහිර වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් උසස් තත්ත්වයේ, රසවත් සහ පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකික තේ නිෂ්පාදනය කිරීම.

2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කල වැඩසටහන්හි ප්‍රගතිය

1. දැරංගල කර්මාන්ත ශාලාව සඳහා නව වර්ණ විභේදන යන්ත්‍රයක් සවි කිරීම

නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ඉහළම ප්‍රමිතියෙන් යුතු නව වර්ණ විභේදන යන්ත්‍රයක් දැරංගල කර්මාන්තශාලාවේ ස්ථාපනය කරන ලදී. ඉහළම ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක තේ නිෂ්පාදනය මඟින් අලෙවි ප්‍රවර්ධනය හා නව රැකියා අවස්ථා ඇති කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් ඉටු වේ.

2. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ සූර්ය බලශක්ති ව්‍යාපෘතිය

රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් බලශක්තිය ඉතිරි කර ගැනීමේ ව්‍යාපෘතියේ එක් පියවරක් ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සඳහා රුපියල් මිලියන 45 ක ආසන්න පිරිවැයක් දරමින් කිලෝ වොට් 350 ක ධාරිතාවයක් සහිත සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කරන ලදි. ජාතික බලශක්ති පරිභෝජනය අඩු කරමින් පාරිසරික සහ ආර්ථික වාසියක් අත් කර ගැනීමේ, බලශක්ති ඵලදායීකරණය කර ගැනීමට මෙම ව්‍යාපෘතිය මඟින් සිදු වේ.

- **කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහන**

කුඩා තේවතු හිමියන්ගේ සමිතිවල නියෝජිතයින්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ අනෙකුත් ප්‍රජා කොටස්කරුවන්ගේ සහභාගිත්වයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නියෝජිතයින්ගේ ප්‍රධානත්වයෙන් මැණික්දිවෙල කර්මාන්ත ශාලාවේදී පවත්වන ලදී.

- **"කළුබෝවිටියාන තේ" නාමය පිළිබඳ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම**

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ නිෂ්පාදිත තේ පිළිබඳ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම මඟින් තේ සහන මිලට ලබාදීම හරහා ඔවුන්ගේ විශ්වාසය දිනා ගනිමින් සමාගමේ ආදායමද පුළුල් කර ගැනීමේ අපේක්ෂාවෙන් අලෙවි නියෝජිතයන් බඳවා ගැනීම සිදුකරන ලද අතර, අන්තර්ජාලය හරහා ඇණවුම් කර නිවසටම ගෙන්වාගැනීමේ පහසුකම ද මේ වන විට සලසා ඇත.

- **දල්ලෙහි වෙනසක් තේ අස්වනු සංග්‍රාමය**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ CIC කෘෂි ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් දැරංගල තේ කර්මාන්තශාලා පරිශ්‍රයේ පවත්වන ලද දල්ලෙහි වෙනසක් වැඩසටහන මඟින් නිවැරදි වගා පුරුදු හා ක්‍රමෝපායන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් සමඟින් සියලුම පස් සාම්පල රසායනාගාර මට්ටමින් පරීක්ෂා කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

- **තේ දළු මංගල්‍යය**

ගැටබරුව රජමහා විහාරස්ථානයේ සහ ගැටබේ ශ්‍රී රාජෝපවනාරාම විහාරස්ථානයේ දී පැවැත්වූ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පවත්වන ලද "නැවුම් තේ මංගල්‍යය" සඳහා කළුබෝවිටියාන, තේ කර්මාන්තශාලා සමාගමේද සහය ලබා දුණි.

කර්මාන්තශාලා තොරතුරු

කර්මාන්තශාලාව	නිෂ්පාදනය (මෙ.ටො.)		
	වාර්ෂික ඉලක්කය	2025.09.30 දිනට ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය
කළුබෝවිටියාන	1018	509	497
දැරංගල	352	176	85
හිනිදුම හිල්ස්	318	159	127
මැණික්දිවෙල	243	121	78

ආදායම් පිළිබඳ තොරතුරු

කර්මානතශාලාව	ආදායම (රු.මි.) 2025.09.30 දිනට		වියදම (රු.මි.) 2025.09.30		ලාභ/අලභා (රු.මිල.)
	අපේක්ෂිත ආදායම	සත්‍ය ආදායම	අපේක්ෂිත වියදම	සත්‍ය වියදම	
කළුබෝවිටියාන	753.14	755.13	700.26	578.37	130.69
දැරංගල	250.18	79.03	239.25	114.88	(1.84)
හිනිදුම හිල්ස්	235.73	164.52	226.25	165.96	(20.87)
මැණික්දිවෙල	138.97	78.99	132.23	86.79	(10.79)

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදනය (රු.මි.)	වියදම (රු.මි.)
ප්‍රාග්ධන	203.12	48.47
පුනරාවර්තන	1342.01	985.08

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති

1. සී/ස කළුබෝවිටියාන කර්මාන්තශාලා සමාගමට අයත් කළුබෝවිටියාන කර්මාන්තශාලාව ප්‍රදේශයේ "පරිසර සංචාරක ව්‍යාපාරයක්" (Eco - Tourism) ආරම්භ කිරීම සඳහා සැලසුම් මේ වන විටත් සකස් කෙරෙමින් පවතී. 2026 වර්ෂයේදී කළුබෝවිටියාන කර්මාන්තශාලාව සහ ඒ අවට ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

2. සී/ස කළුබෝවිටියාන කර්මාන්තශාලා සමාගමට අයත් දැරංගල තේ කර්මාන්තශාලාව හා ඒ අවට භූමි ප්‍රදේශය සංචාරක ආකර්ෂණය දිනා ගත හැකි ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එම ප්‍රදේශ ආවරණය වන පරිදි "පරිසර සංචාරක ව්‍යාපාරයක්" (Eco - Tourism) ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම

මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගීත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වය ලබා දීම.

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාළ ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

විස්තරය	වාර්ෂික ඉලක්කය	2025.09.30 දිනට ඉලක්කය	2025.09.30 දිනට ප්‍රගතිය
කර්මාන්තශාලාව අනුව නිමි තේ නිෂ්පාදනය (කි.ග්‍රෑම්)			
ගෝමර	197,440	142,564	105,160
කැලෑබොක්ක	332,930	249,700	179,971
මිඩ්ලන්ඩ්	99,900	73,477	52,292
භෝග නිෂ්පාදනය (කි.ග්‍රෑම්.)			
තේ	1,648,414	1,219,039	846,094
රබර්	10,000	7,450	6,823

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට ඉලක්කය (රු.මි.)	ප්‍රගතිය (රු.මි.)
ප්‍රාග්ධන	1,266.79	633.40	35.35
පුනරාවර්තන	1,773.73	913.63	671.29

2025 ක්‍රියාත්මක සැලැස්මට අදාල ව්‍යාපෘතිවල 2025.09.30 දිනට ප්‍රගතිය

වැඩසටහන	2025.09.30 භෞතික ඉලක්කය	2025.09.30 භෞතික ප්‍රගතිය	2025.09.30 මූල්‍ය ඉලක්කය	2025.09.30 මූල්‍ය ප්‍රගතිය
තේ නැවත වගාව	200.90	97.21	141.02	139.02
තේ නව වගාව	5.56	6.53	11.78	3.08
තේ පාළු පැල සිටුවීම	පැල 75000	පැල 29956	3.05	0.13
සුළු අපනයන බෝග	3.94	3.25	3.02	2.59
වානිජ දැව / වන වගාව / ඉන්ධන දැව වගාව	42.75	8.00	23.03	1.24
පොල් නව වගාව	7.50	10.00	3.44	2.15
තවාන් පිහිටුවීම				
නව තේ තාවන් පිහිටුවීම සඳහා වියදම - වසර 2025	පැල 75,000	පැල 29,956	2.03	0.13

- 2022 වර්ෂයේ ආරම්භ කල තේ නැවත වගා වැඩසටහනේ නඩත්තු කටයුතු 2025 වර්ෂයේද ක්‍රියාත්මක වේ.
- වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ඇති ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ 25ක මුදලක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෙක්ටයාර 01ක ආදර්ශ තේ වගාවක් සඳහා ලබා දීමට කටයුතු කර ඇති අතර, මේ වනවිට ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුවෙමින් පවතී අතර, මේ වනවිට තේ දළු නෙලීමේ යන්ත්‍ර මිලදී ගෙන ඇත. ඊට අදාල අනෙකුත් යන්ත්‍ර වන මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවා මේ වනවිට තාක්ෂණ ඇගයීම් කමිටුවට ඉදිරිපත් කර ඇත.
- 2025 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන යටතේ පහත දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මේ වනවිටත් මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවා ප්‍රසම්පාදන අංශයේ තාක්ෂණ කමිටුවේ කටයුතු වෙමින් පවතී .

- රංගල තේ කර්මාන්ත ශාලාවට නවීන තේ කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ සමඟ නව තාක්ෂණයන් හඳුන්වා දීමෙන් තේ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම,
- තේවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම කැලැබොක්ක තේ කර්මාන්ත ශාලාවට නවීන තේ කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ සමඟ නව තාක්ෂණයන් හඳුන්වා දීම සහ
- වැවිලි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වසරේ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මේ වන විට ඒවායේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

2026 වර්ෂයේදී වැවිලි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට යෝජිත විශේෂ ව්‍යාපෘති /ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යෝජනා

- රංගල තේ කර්මාන්ත ශාලාවට අවශ්‍ය ඉතිරි යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම
- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉතිරි වතුයායන් 12 සඳහා වැවිලි ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරීම.
- සංස්ථා තේ වල ගුණාත්මක බව වැඩිකිරීම සඳහා අගය එකතු කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.

සී/ස ඇල්කඩුව වැවිලි සමාගම

දැක්ම

සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කරමින් වතු කර්මාන්තයේ වඩාත්ම අභියෝගාත්මක තරඟකරුවා වීම

මෙහෙවර

ජාතික අවශ්‍යතා ආරක්ෂාකාරීව මෙහෙයවන අතරතුර සේවකයින්ගේ ජීවන තත්ත්වය නංවාලීම තුලින් සම්පත් ප්‍රශස්ත මට්ටමින් භාවිතා කර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම

කර්මාන්තශාලා තොරතුරු

කර්මාන්තශාලාව	නිෂ්පාදනය (කි.ග්‍රෑම්)		
	වාර්ෂික ඉලක්කය	2025.08.31 දිනට ඉලක්කය	2025.08.31 දිනට ප්‍රගතිය
බණ්ඩාරපොළ කර්මාන්තශාලාව	337,772	208,045	139,335

වගා තොරතුරු

භෝගය	වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.)		
	වාර්ෂික ඉලක්කය	2025.08.31 දිනට ඉලක්කය	2025.08.31 දිනට ප්‍රගතිය
තේ	1,039.57	1,039.57	1,039.57
රබර්	274.41	274.41	274.41
පොල්	283.05	283.05	283.05

භෝග නිෂ්පාදන තොරතුරු

භෝගය	භෝග නිෂ්පාදනය (කි.ග්‍රෑම්.)		
	වාර්ෂික ඉලක්කය	2025.08.31 දිනට ඉලක්කය	2025.08.31 දිනට ප්‍රගතිය
තේ	3,037,872	1,904,512	1,333,107
රබර්	120,500	83,600	70,230
පොල්	993,000	699,400	440,894
කොකෝවා	5,600	3,142	1,778

2023.08.31 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.08.31 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	වියදම (රු.මි.)
ප්‍රාග්ධන	152	82	3
පුනරාවර්තන	1,222	600	291

ආදායම් පිළිබඳ විස්තර **(2025.08.31 දිනට)**

I. භෝග අනුව

භෝගය	නිෂ්පාදන ඉලක්ක		ආදායම (රු.මි.)	ලාභය /අලාභය (රු.මි.)
	මූල්‍ය (රු.)	භෞතික		
තේ	507,671,788	1,904,512	267	18
රබර්	58,520,000	83,600	50	1.7
පොල්	62,900,218	699,400	53	19
කොකෝවා	5,183,750	3,142	0.7	0.6
අනෙකුත්			11	10

II. වතුයාය අනුව

වතු යාය	භූමි ප්‍රමාණය (හෙක්.)	වගා කොට ඇති භෝගය	ආදායම (රු.මි.)		වියදම (රු.මි.)		ලාභය/අලාභය (රු.මි.)
			ඉලක්කය	සත්‍ය	ඉලක්කය	සත්‍ය	
බණ්ඩාරපොළ	83.15	තේ	248.3	161.3	243.8	156.9	4.3
ඇල්කඩුව	143.55	තේ	52.6	44	75.1	44	(0.70)
හපුගස්පිටිය	156.19	රබර්	24.7	21.2	32.3	22.5	(1.3)
හුණුගල	78.25	තේ	26.3	22	33.1	22.4	(0.73)
මිල්ලවාන	254.11	පොල්	61	52.2	51.2	32	20.5
නාලන්ද	122.80	රබර්	27.3	21.5	29.1	24	(2.1)
පිටකන්ද	159.89	තේ	84	63.2	90.4	63	0.60
රත්වත්ත	159.31	තේ	56.5	52	72	50.5	1.21
සැලගම	64.69	තේ	31	30	38	26	4.1

III. වෙනත් ආදායම

ව්‍යාපෘතිය	නිෂ්පාදන ඉලක්ක		ආදායම (රු.මි.)	ලාභය /අලාභය (රු.මි.)
	මූල්‍ය	භෞතික		
සෙම්බුවත්ත සංචාරක කලාපය	37,611,467	257,795	31.5	23
හුලංගල	3,166,666		5.8	3.5
වන් ට්‍රී හිල්	1,666,666		2.1	1.4

සී/ස කුරුණෑගල වැවිලි සමාගම

දැක්ම

ගිනිකොණ දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂි ව්‍යාපාර කළමණාකාරීත්ව සමාගම බවට පත්වීම.

මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහාගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත්, ලාභදායී ලෙසත්, තිරසාර ලෙසත්, කළමණාකරණය කරමින් සියළු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

2025 ක්‍රියාත්මක සැලැස්ම අනු ව ව්‍යාපෘතිවල 2025.08.31 දිනට ප්‍රගතිය

විස්තරය	නිෂ්පාදනය				මූල්‍ය ප්‍රගතිය
	ඒකකය	වාර්ෂික ඉලක්කය (2025)	2025.08.31 ඉලක්කය	2025.08.31 ප්‍රගතිය	
කොහු නිෂ්පාදනය	කිලෝ ග්‍රෑම්	152,000	101,328	27,686	65%
සුදු පොල් තෙල් නිෂ්පාදනය (බාහිර පාර්ශව සමග ඒකාබද්ධව)	කිලෝ ග්‍රෑම්	8,500	5,600	7,835	73%
කජු පිරිසැකසුම් කිරීම	කිලෝ ග්‍රෑම්	2,500	1,650	1,449	59%
කොස් විජලනය	කිලෝ ග්‍රෑම්	1,760	1,150	464	19%
දූරියන් යෝගට්	මිලි ලීටර් 80 කප්	17,000	11,000	5,361	39%
පොල් යෝගට්	මිලි ලීටර් 80 කප්	14,400	9,600	2,916	25%
කුළු බඩු නිෂ්පාදනය (ගම්මිරිස්,කුරුඳු,කෝපි සහ කහ)	කිලෝ ග්‍රෑම්	3,368	2,245	1,102	43%
පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදනය					
• සොෆ්ට් අයිස්ක්‍රීම්	ලීටර්	36,000	24,000	8,896	30%
• හාඩ් අයිස්ක්‍රීම්	ලීටර්	45,120	30,080	13,305	38%

වගා කළ භූමි ප්‍රමාණය

භෝගය	වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.)		
		2025.08.31	
	2025 ඉලක්කය	ඉලක්කය (%)	ප්‍රගතිය (%)
පොල් යටි වගා	31.91	70	70
තේ	4.00	70	70
ටොම්.ඊ.ජේ.සී. අඹ	20.24	70	70
කුරුඳු	58.95	60	60
කෝපි	2.83	90	90
කජු	4.04	91	91
කරාබු	5.40	80	80
වැල් දොඩම්	1.62	80	80

භෝග නිෂ්පාදන තොරතුරු

භෝගය	ඒකකය	2025 ඉලක්කය	2025.08.31 දිනට		ප්‍රගතිය (%)
			ඉලක්කය	ප්‍රගතිය	
පොල්	ගෙඩි	15,150,000	11,033,820	6,668,476	44%
රබර්	කිලෝ ග්‍රෑම්	134,550	91,700	72,832	54%
කජු	කිලෝ ග්‍රෑම්	42,987	42,987	26,457	62%
රඹුටන්	ගෙඩි	4,162,450	3,439,950	1,421,986	34%
ගම්මිරිස්	කිලෝ ග්‍රෑම්	15,771	9,400	3,627	23%
ටොම් ඊ.ජේ.සී. අඹ	කිලෝ ග්‍රෑම්	51,650	27,650	35,040	68%
කුරුඳු	කිලෝ ග්‍රෑම්	10,936	7,073	4,294	39%
කොකෝවා	කිලෝ ග්‍රෑම්	4,000	2,000	1,248	31%
ඩ්‍රැගන් ෆෘට්	කිලෝ ග්‍රෑම්	7,168	4,450	5,102	71%
තැඹිලි	ගෙඩි	6,250	3,900	2,127	34%
දූරියන්	කිලෝ ග්‍රෑම්	18,940	18,690	12,646	67%
පේර	කිලෝ ග්‍රෑම්	2,363	1,193	1,146	48%
මැංගුස්	ගෙඩි	10,000	10,000	7,212	72%
පුවක්	ගෙඩි	237,200	164,000	80,630	34%
කෙසෙල්	කිලෝ ග්‍රෑම්	700	450	760	109%
වැල් දොඩම්	කිලෝ ග්‍රෑම්	950	100	1,714	180%
වී	කිලෝ ග්‍රෑම්	1,750	750	924	53%
වරකා	ගෙඩි	2,580	2,125	1,718	67%
අන්නාසි	කිලෝ ග්‍රෑම්	650	-	33	5%
කටු අනෝදා	කිලෝ ග්‍රෑම්	500	250	513	103%

මූල්‍ය ප්‍රගතිය (2025.08.31 දිනට)

වැඩසටහන	වෙන්කළ මුදල (රු.මි.)	ඉලක්කය (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (රු.මි.)
ප්‍රාග්ධන	619.08	510.25	167.15
පුනරාවර්ථන	1,435.92	957.28	738.28

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා නාරම්මල පළාත් වතුයායේ ඔලියදෙනිය බෙදුමේ ආරම්භ කල ජාතික පොල් තාක්ෂණික උද්‍යානයේ පොල් වගාව යටතේ අතුරු බෝග වගා කිරිම, පොල් ගස් අතර අතුර බැද පොල් මී රා නිෂ්පාදනය කිරීම හා එමගින් පොල් පැණි නිෂ්පාදනය, බෝග පැල අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ පොල් තාක්ෂණික උද්‍යානය ආශ්‍රිතව විවිධ ක්‍රියාකාරකම් සහ නැරඹුම් අවස්ථාවන් ඇති කර ලදි.

- සුදු මැස්සා පාලනය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීම.

- මේ වන විට නියමු ව්‍යාපෘතියක් ලෙස දෙල්ගොල්ල බෙදුමේ ගන්නෝරුව උද්‍යාන බෝග හා පර්යේෂණ ආයතනය හා ඒකාබද්ධව සුදු මැස්සාගේ හානිය වැලැක්වීම සඳහා විලෝපිකයෙකු නිදහස් කිරීම ආරම්භ කර ඇත.

- වතුයායන්වල මී මැසි ජනපද ආරම්භ කිරීමට කටයුතු කිරීම

- පොල් අක්කරයකට පැවතිය යුතු ප්‍රශස්ථ පැල ගණන පවත්වා ගැනීම සඳහා පුරප්පාඩු සිටුවීම.

- පොල් පැල තවාන් ස්ථාපිත කිරීම.

- තැඹිලි පොල් වලින් සිදින ලද තැඹිලි පොල් තෙල්,හීන්බෝවිටියා තේ, විජලනය කරන ලද කොස් හා කොස් ආශ්‍රිත නිෂ්පාදන වෙලදපොලට හඳුන්වා දීම.

- ක්ෂුද්‍ර පරිසර තත්ත්වයන් දියුණු කිරීම සඳහා පොල් වගාව යටතේ අතුරු බෝග වගාවන් ව්‍යාප්ත කිරීම.

- ජල සංරක්ෂණ උපායමාර්ග වශයෙන් පොල් ලෙලි වලවල් ස්ථාපිත කිරීම හා පොල් ගස් වටා වසුන් යෙදීම.

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

සමාගමේ සංයුක්ත සැලැස්ම අනුව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමට නියමිතය.

- වැව්ලි සමාගම් වලට අයත් වතුයායන්හි හෙක්ටයාර් 33.71 ක වපසරියක් ආවරණය වන පරිදි පොල් යටි වගාවන් ස්ථාපිත කිරීම
- වැව්ලි සමාගමට අයත් වතුයායන්හි පුරප්පාඩු පොල් පැල 5,400 ක් සිටුවීම
- වැව්ලි සමාගමට අයත් වතුයායන්හි පොල් පැල 34,000 ක පැල තවාන් ස්ථාපිත කිරීම
- තෝරා ගත් වතුවල දැව පැල 2,850 ක් සිටුවීම
- කුරුඳු පැල 16,400 ක් සිටුවීම
- වතුයායන්වල සේවය කරන කාර්ය මණ්ඩල සේවකයන්ට හා මුරකරුවන් සඳහා නිවාස පහසුකම් සැපයීම.

සී/ස හලාවත වැවිලි සමාගම

දැක්ම

පොල් කර්මාන්තයේ තිරසර සංවර්ධනය මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට උපරිම දායකත්වයක් ලබා දීම.

මෙහෙවර

පොල් ඇතුළු වැවිලි කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා තමන් සතු සීමිත සම්පත් ඵලදායි ලෙස හා කාර්යක්ෂම ලෙස භාවිතා කරමින්, විදේශ වෙළඳපොළ සඳහා අගය එකතුකළ නිෂ්පාදන යොමු කරමින් පිළිගත් ප්‍රතිපත්ති මඟින් සේවකයන්ගේ සහ මහජනතාවගේ ජීවන තත්වය නංවාලීම.

2025 ක්‍රියාත්මක සැලැස්ම අනුව අදාළ ව්‍යාපෘතිවල 2025.08.31 දිනට ප්‍රගතිය

විස්තරය	නිෂ්පාදනය			විශේෂ කරුණු
	වාර්ෂික ඉලක්කය (2025)	2025.08.31 ඉලක්කය	2025.08.31 ප්‍රගතිය	
පොල්තෙල් (ලීටර)	32,831.75	21,900.50	7,514.98	වර්ෂය අවසාන වන විට වැඩි නිෂ්පාදිතයක් හා අලෙවියක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
සැකසූ කජු (කි.ග්‍රෑම්)	5,300.00	3,580	1,750.42	

වගා කළ භූමි ප්‍රමාණය

භෝගය	2025 ඉලක්කය (හෙක්.)	වගා කළ භූමි ප්‍රමාණය (හෙක්.) 2025.08.31 දිනට	
		ඉලක්කය (%)	ප්‍රගතිය (%)
පොල්	33.85	68%	මේ වන විට කැලෑ කැපීම,ලයිනින් කිරීම ආදී වැඩකටයුතු ආරම්භ කර ඇති අතර, ඔක්තෝම්බර් මාසය වන විට පොල්පැළ සිටුවීමේ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

භෝගය	2025 ඉලක්කය (හෙක්.) (පවතින වගාව සමඟ)	2025.08.31 දිනට		වෙනත් කරුණු
		ඉලක්කය (රු.000')	ප්‍රගතිය (රු.000')	
කජු	856.12	25,675	57,853	කජු ගස් බාහිර පාර්ශවයන්ට බදු දීම තුළින් රු.මි.33.5 ක ආදායමක් උපයාගෙන ඇත.
කුරුඳු	19.08	555	1,852	
ගම්මිරිස්	16.06	-	474	
අඹ	13.30	4,250	3,089	
රඹුටන්	20.00	1,000	3,100	

හෝග නිෂ්පාදන තොරතුරු

විශේෂ ව්‍යාපෘති ප්‍රගතිය (2025.08.31 දිනට)

ව්‍යාපෘතිය	වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.000')	2025.08.31 දිනට වියදම (රු.000')	2025.08.31 දිනට භෞතික ප්‍රගතිය
පොල් පැණි නිෂ්පාදන ව්‍යාපෘතිය	7,999	5,685	150%
පශු සම්පත් ව්‍යාපෘතිය	31,424	13,034	50%
පොල පැළ /කජු පැළ සහ තවාන් ව්‍යාපෘතිය	15,503	14,832	75%
පොල්තෙල් ව්‍යාපෘතිය	27,384	7,205	34%
කජු පිරිසැකසුම් ව්‍යාපෘතිය	22,970	10,543	49%
පළතුරු සහ එළවළු වගාව	5,301	2,208	13%

මූල්‍ය ප්‍රගතිය (2025.05.31 දිනට)

වැඩසටහන	වර්ෂය සඳහා වෙන්කළ මුදල (රු.මි.)	2025.05.31 දිනට ඉලක්කය (රු.මි.)	2025.05.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.)
ප්‍රාග්ධන	185	97	65
පුනරාවර්ථන (මූල්‍ය වියදම සමඟ)	1,190	730	727

ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වෙනත් විශේෂ වැඩසටහන්

මේ වන විට පහත සඳහන් නව ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යමින් පවතී.

	ව්‍යාපෘතිය	ඇස්තමේන්තු ගත ප්‍රමාණය	සත්‍ය වශයෙන් වගා කර ඇති ප්‍රමාණය
01.	පුවක් පැළ	5,500	5,300
02.	මත්ස්‍ය වගාව (මාළු පැටවුන්/ඇඟිල්ලන්)	72,000	72,000
03.	කිරි අල	1,200	1,200
04.	කව්පි	කි.ග්‍රෑම් 08	කි.ග්‍රෑම් 08
05.	මඤ්ඤොක්කා	දඬු 600	දඬු 600
06.	තිබ්බටු	700	571
07.	දෙළුම්	300	200
08.	අනෝදා	2570	800
09.	කෙසෙල්	5,395	3,670
10.	T & JC	5,252	3,752
11.	බිලිං	100	100
12.	තැඹිලි	120	-
13.	ඉඟුරු	කි.ග්‍රෑම් 520	කි.ග්‍රෑම් 520
14.	කහ	කි.ග්‍රෑම් 300	කි.ග්‍රෑම් 300
15.	තේක්ක	850	650
16.	කජු	1,500	1,100
17.	මිරිස්	අක්කර 5	අක්කර 1
18.	මුරුංගා	1,230	1,130
19.	මුං	අක්කර 5	අක්කර 5

- හලාවත පළාත් වතු කොට්ඨාශයේ සීනුගල වතු යායේ බීජ වී සඳහා කුඹුරු අක්කර 5 ක් වගා කිරීම ආරම්භ කර ඇත.
- හලාවත වැවිලි සමාගමේ සභාපතිවරයාගේ නිළ නිවස මැතකදී 'COCO NEST' නමින් විවෘත කරන ලද අතර, ඒ තුළින් සමාගමට අමතර අදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.
- ක්ෂේත්‍ර මට්ටමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා, වතු කාර්ය මණ්ඩලයට "ට්‍රැක්ටර් 10 ක්" සහ "යතුරුපැදි 10 ක්" ලබා දීම සිදු කරන ලදී.

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- පවත්නා පොල් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා, පසෙහි තෙතමනය අවශ්‍ය මට්ටම දක්වා පවත්වා ගැනීම, පසේ සාරවත් බව වැඩි දියුණු කිරීම සහ පෝෂක ඌනතාවයන් සපුරාලීම, ඵලදායී ගස් ගහනය වැඩි කිරීම සහ භෝග සහ වත්කම් ආරක්ෂණය මඟින් ක්‍රමවත් කෘෂිකාර්මික හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් තුලින් භූමියේ ඵලදායිතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම කරන අතර, මෙමඟින් 2026 වර්ෂය වන විට හෙක්ටයාර 260 ක් පමණ වන පවත්නා යටි වගාව නඩත්තු කිරීමටත්, හෙක්ටයාර 30 ක පමණ නව වගාවන් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.
- අතුරු භෝග නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කුරුඳු අක්කර 100 කට ආසන්න ප්‍රමාණයක් වගා කිරීම.
- දැවමය වටිනාකමකින් යුක්ත ගස් ගහනය වැඩි කිරීම සහ පොල් වගාවට උචිත භූමි අවකාශය සකස් කර ගැනීම සඳහා හෙක්ටයාර 22 ක පමණ ප්‍රදේශයක තේක්ක වගාව ආරම්භ කිරීම.
- පොල් සහ අනෙකුත් නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ අලෙවිකරණය වැඩි දියුණු කිරීම අරමුණු කර පොල් නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම යටතේ නො.01 කොප්පරා කි.ග්‍රෑම් 50,000.00 ක්, පොල්තෙල් ලීටර 33,000 ක් සහ පොල් පැණි බෝතල් 24,000 ක් හා පොල් අයිස්ක්‍රීම් ඒකක 20,000 ක් පමණ නිෂ්පාදනය කිරීම. ඊට අමතරව අනෙකුත් භෝග යටතේ ලෙලි කජු කි.ග්‍රෑම් 30,000 ක් නිෂ්පාදනය කිරීම සහ නව වෙළඳපොළ පද්ධති ක්‍රියාත්මක කිරීම හා විකුණුම් පරිමාව වැඩි කර ගැනීමට කටයුතු කිරීම.
- පොල් කර්මාන්තයේ වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා නව තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සහ පවතින තාක්ෂණයන් වැඩිදියුණු කිරීම යටතේ අක්කර 100 ක පමණ බිංදු ජල සම්පාදනය සහ නළ ජල සම්පාදනය තුළින් වාරිමාර්ග පද්ධති හඳුන්වා දීම.
- සේවක පුහුණු වැඩසටහන්, ශ්‍රමාභිමානී ඇතුළු කාර්ය මණ්ඩල සහ සුභසාධන කටයුතු, මානව ධාරිතා ගොඩනැගීමේ සහ අභිප්‍රේරණ ව්‍යාපෘතීන් (ප්‍රගති සමාලෝචනය/ වැඩමුළු), දිරි දීමනා යෝජනා ක්‍රම ආදිය හරහා පුහුණුව, සංවර්ධනය සහ සුභසාධනය තුළින් සේවක අභිප්‍රේරණය වැඩි කර ගැනීමට සැලසුම් කර ඇත.
- විදුලිය, ජල සැපයුම, රථ වාහන, ගෘහ භාණ්ඩ, උපකරණ, ඉදිකිරීම් ආදී යටිතල පහසුකම් 2025 වර්ෂයට සාපේක්ෂව වැඩි කිරීම මඟින් මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.

ප්‍රගති වාර්තාව 2025

ප්‍රජා යටිතල පහසුකම් අංශය

අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03

දුරකථනය : 011-2541369

ෆැක්ස් : 011-2328117/ 011-2322526

සැලසුම් අංශය

දුරකථනය : 011-2327993 (අධ්‍යක්ෂ ජනරාල්)

ෆැක්ස් : 011-2322718

විද්‍යුත් තැපැල් ලිපිනය : plan.smehci@gmail.com

ප්‍රජා යටිතල පහසුකම් අංශය

ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවගේ ව්‍යාප්තිය මීට ශතවර්ෂ දෙකක පමණ කාලයක සිට එනම් බ්‍රිතාන්‍යයන් විසින් 1840දී කඳුකරයේ, කෝපි වගාව ආරම්භ කිරීමත් සමග දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ ජන කොට්ඨාශයක් ලෙස ආරම්භ විය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 4.1%ක් පමණ එනම් මිලියන 1ට ආසන්න වන මෙම වැවිලි ප්‍රජාව කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුර හා කෑගල්ල වැනි දිස්ත්‍රික්ක වල වතු ආශ්‍රිතව ව්‍යාප්තව ඇති අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විවිධ අමාත්‍යාංශයන් ඔස්සේ එම වැවිලි ප්‍රජාවගේ වාසස්ථාන, යටිතල පහසුකම්, ජීවනෝපාය හා සමාජ සංවර්ධනය යන අංශයන් මුදුන් පැමිණවීම උදෙසා විශාල කාර්යභාරයක් ඉටු කරමින් පවතී. එහි විශේෂ දායකත්වයක් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ප්‍රජා යටිතල පහසුකම් අංශය විසින් ඉටුකරන අතර, එම කාර්යභාරය සඳහා සහයෝගය තුනකි.

- සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම
- වැවිලි මානව සංවර්ධන භාරය
- වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන අධිකාරිය

එම ආයතනවල කාර්යයන් හා ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම මෙම ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් අතර වේ. ඉහත ආයතන මෙන්ම ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ වන ප්‍රධාන අංශයන්හි ඒකාබද්ධ කාර්යයන් ඔස්සේ සමස්ත වැවිලි ප්‍රජාව මුහුණ දෙන සමාජ විෂමතාවන් ක්‍රමයෙන් අඩු කරමින් පහසුකම් භුක්ති විඳින සෞභාග්‍යමත් වැවිලි ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව වතු පවුල් 261,429 ක් මගින් නියෝජනය වනු ලබන 993,021ක් වූ ජනගහනයකගේ ජීවන තත්ත්වය නගාසිටුවමින් වාසස්ථාන පිළිබඳ ගැටලු, මූලික යටිතල පහසුකම් පිළිබද ගැටලු, අඩු අදායම් තත්ත්ව සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීම සඳහා සක්‍රීය ලෙස දායක වෙමින් ඔවුන්ගේ අධ්‍යාපන, සමාජ, ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීම සිදුකරනු ලබයි. මෙම ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන අංශය යටතේ මූලිකව කටයුතු කරන දිස්ත්‍රික්ක ලෙස කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, බදුල්ල, මොණරාගල, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක හැඳින්විය හැකි වන අතර, එම දිස්ත්‍රික්ක වැවිලි මානව සංවර්ධන භාරය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශිකයන් 7ක් ලෙස ක්‍රියාත්මක වේ.

ප්‍රජා යටිතල පහසුකම් අංශය - ප්‍රධාන කාර්යයන්

2024.11.25 දින අංක 2412/08 යටතේ පසුව නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් අතර පහත සඳහන් කාර්යයන් ප්‍රජා යටිතල පහසුකම් අංශයට සුවිශේෂී වේ.

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් විෂයයන්ට සහ අනෙකුත් අමාත්‍යාංශයට අදාල දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, උපායමාර්ග , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

2. අමාත්‍යාංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.

3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
4. වැවිලි ක්ෂේත්‍රය/ මලයාලම් සඳහා නිවාස, ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය සහාය සහ යටිතල පහසුකම් සැපයීම.
5. වැවිලි ප්‍රජාවට ස්ථිර නිවාස ඉදි කිරීම සඳහා ඉඩම් ලබාදීම.
6. වතු ආශ්‍රිත ප්‍රදේශයන්හි දැරිය හැකි ආකාරයේ නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.
7. වතු අංශයේ ප්‍රජාව ආර්ථික, සමාජයීය හා සංස්කෘතිමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මූලික පහසුකම්, ජීවනෝපාය උත්පාදන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට අවශ්‍ය පියවර ගැනීම.
8. ග්‍රාමීය වතු අංශයන්හි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
9. වතු ප්‍රජාව ආශ්‍රිතව ප්‍රජා නායකත්වය හා ප්‍රජා සහභාගීත්වය ප්‍රමුඛ වන “ජන මූල මණ්ඩල හා ජන මූල මධ්‍යස්ථාන” පිහිටුවීම.
10. වතු ප්‍රජාවගේ දරුවන් සඳහා ප්‍රාථමික අධ්‍යාපන හා සෞඛ්‍යය පහසුකම් තහවුරු කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන විශේෂ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

පාලන අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ පරිපාලන අංශය මගින් එම අංශය යටතේ පවත්නා සියලුම ආයතනයන්හි මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියා කිරීම.
- මානව සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් අනුමත සේවක සංඛ්‍යාව තුළ සියලුම අංශයන්හි රාජකාරී වගකීම් සැළකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය බෙදාහැරීම.
- නිලධාරින්ගෙන් සඵලදායි සහ කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම සඳහා සියලු නිලධාරින්ගේ දැනුම. ආකල්ප, කුලපතා වර්ධනය සහ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම සඳහා හඳුනාගත් විද්වතුන් මගින් විද්වත් හමුව නමින් දේශන මාලාවක් පැවැත්වීම.
- රාජ්‍ය වියදම් අවම කරගැනීම සඳහා මෙම අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 8 වන මහල වෙත කිතුල් සංවර්ධන මණ්ඩලය ස්ථානාගත කිරීමෙන් රජයට වැය බරක් වූ රු. 227,500.00 ක මුදල ඉතිරි කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රජයට වැය බරක් වන ආර්ථික වශයෙන් ඵලදායි නොවන සුඛෝපභෝගී වාහන 07ක් අපහරණය කිරීම සඳහා ක්‍රියාත්මක වීම.
- මෙම අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය වෙනත් ගොඩනැගිල්ලක් වෙත ගෙන යාමේ අවශ්‍යතාවය මත දැනට රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ල හඳුනාගෙන ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

සංවර්ධන අංශය

- වැවිලි අංශයේ ජනතාවගේ සුභ සාධනය, ඔවුන්ගේ වාසස්ථාන, ජීවන තත්ත්වය හා සමාජ ආර්ථික පහසුකම් වැඩි කිරීම උදෙසා ප්‍රජා යටිතල පහසුකම් අංශය යටතේ පවතින ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, හා පළාත් පාලන ආයතන ඔස්සේ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම.
- මෙම ව්‍යාපෘති සම්බන්ධීකරණය පිළිබඳ සියළු වගකීම් දරමින් රජයේ ඒකාබද්ධ අරමුදලින් හා ඉන්දියානු රජයේ සහය යටතේ ලබා දෙන අරමුදල්ද යොදවමින් ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේ කාර්යභාරය සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි.

- පහත සඳහන් ක්‍රියාකාරකම් ඇතුළුව, ඉහත කර්තව්‍යයන් නිසිලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු අංශය මෙන්ම සැළසුම් අංශයද සංවර්ධන අංශයට සහය දක්වනු ලබයි.

යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- පේලි නිවාසයන්හි අබලන් වූ වහලයන් නැවත සෙවිලි කිරීම.
- සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සැපයුම් ක්‍රම ඇතිකිරීම සහ වැඩිදියුණු කිරීම.
- සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති.

වතු නිවාස වැඩසටහන යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- නව ජීවන නිවාස වැඩසටහන යටතේ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන සමායෝජනය සහ අධීක්ෂණය කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන සහ ඉන්දියානු රජයේ ආධාර යටතේ ඉදිකරනු ලබන නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ජලය, මාර්ග සහ විදුලි සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- නව ජීවන නිවාස වැඩසටහන් වලට අදාළ ණය වාරික අයකර ගැනීම.
- තොණ්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ඇති, හැටන් හි පිහිටි තොණ්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රම්බොඩ පිහිටි තොණ්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය, නෝර්වුඩ් හි පිහිටි තොණ්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය සහ ප්‍රජා ශක්ති (E–kios) සංවර්ධන මධ්‍යස්ථාන යනාදියෙහි සමස්ථ අධීක්ෂණය.
- සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීම, නියාමනය කිරීම හා ප්‍රගතිය අනුව ගෙවීම නිර්දේශ කිරීම.
- ඉදිකිරීම් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති වලට අදාළ ප්‍රගති වාර්තා හා ප්‍රසම්පාදන වාර්තා ඉදිරිපත් කිරීම.
- නුවරඑලිය, මහනුවර, බදුල්ල දිස්ත්‍රික්කවල පිහිටි තෝරාගත් වතු ආශ්‍රිත පාසල් වල සුහුරු පන්ති කාමර 60ක් ඉදිකිරීමට අදාලව 2025.01.16 දින ඉන්දියානු රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

සැලසුම් අංශය

- වැවිලි ප්‍රජාවේ උන්නතිය සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනාගැනීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.
- සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරයෙන් වෙන් කරවා ගැනීම.
- සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී සහාය ලබාදීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම සැකසීම.
- ප්‍රගති වාර්තා පිළියෙළ කිරීම හා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන ඇස්තමේන්තු සැකසීම.
- නව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ව්‍යාපෘති යෝජනා සැකසීම, ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම.
- යෝජිත ව්‍යාපෘති ගෙන්වා ගැනීම, ඒ අතුරින් සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම, ශක්‍යතා ඇගයීම, ව්‍යාපෘති මෙහෙයවීම හා ඇගයීම, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය ඇතුලත් ප්‍රගති වාර්තා සැකසීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම.

- ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය සහ මූලික පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අදාළ ආයතන සම්බන්ධීකරණය හා පහසුකම් සැළසීම.
- වතු ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳ තොරතුරු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම.
- වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සළසන නිලධාරීන් හා ප්‍රජා ශක්ති නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ සංවර්ධන වැඩසටහන් සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම.
- වාර්ෂික සංවර්ධන සැළැස්ම සකස්කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක පදනම් කරගත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- ජාතික මට්ටමේ සංවර්ධන වැඩසටහන් සඳහා වතු නිවාස අංශය වෙනුවෙන් නියෝජනය කිරීම.
- පූනාගල ආපදා වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සිදු කෙරෙන ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.

ගිණුම් අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබාදීම, වැටුප් හා දීමනා ගෙවීම, සංවර්ධන ක්‍රියාවලියන්ට අදාළ ගෙවීම් කිරීම, නඩත්තු කටයුතු ආදී රාජ්‍ය අරමුදල් මගින් සිදු කරනු ගෙවීම් සම්බන්ධ සියළු කටයුතුවල වගකීම ගිණුම් අංශය මගින් දරනු ලබයි.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ විෂය පථයට අයත් අංශ හා ආයතනවල මූල්‍ය කළමනාකරණය.
- ප්‍රසම්පාදන සැළැස්ම සකස් කිරීම හා කළමනාකරණය හා වත්කම් කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම සහ මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ පුහුණු හා සංවර්ධන කටයුතු සිදු කිරීම.
- විගණනයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

අභ්‍යන්තර විගණන අංශය

- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ මූල්‍ය කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳව ඇගයීම් සිදු කරමින් අඩුපාඩු වැලැක්වීම සහ අනාවරණය කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන අභ්‍යන්තර පරීක්ෂාවන්හි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ ඇගයීමකට ලක් කිරීම.
- වාර්ෂික ප්‍රතිපාදන මත ඉටු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රගතිය නිශ්චය කිරීමට සහායවීමත්, ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී අදාළ කරුණු අනාවරණය කිරීමත්, වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීමත්, විගණන විමසුම් මඟින් පෙන්වා දුන් කරුණු නිවැරදි කර ගැනීමත්, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම් කිරීම හා ප්‍රජා යටිතල පහසුකම් අංශය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ප්‍රජා යටිතල පහසුකම් අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් පිළිබඳ විගණන නිරීක්ෂණ මහාභාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමත් අභ්‍යන්තර විගණන අංශය විසින් මූලික වශයෙන් ඉටු කරනු ලබයි.
- විශේෂ විමර්ශනයක් සිදු කිරීම

ඉංජිනේරු අංශය

- ගෘහ නිර්මාණ සහ සැලසුම් (Architectural හා Design Drawings) සඳහා අනුමැතිය ලබා දීම.
- පිරිවිතරයන් හා ඇස්තමේන්තු වලට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විවිධ අරමුදල් ප්‍රභවයන් හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම හා උපදේශන සේවාවන් සැපයීම.
- ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු හා තාක්ෂණික විගණනයන් වලට සහභාගී වීම.
- ඉදි කිරීම් ව්‍යාපෘති වලට නව ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ස්ථාන පරීක්ෂාව, අධීක්ෂණය සහ ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම.
- විදේශ ආධාර යටතේ ක්‍රියාත්මකවන ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීම හා ඇස්තමේන්තු සැකසීම.

2025 වර්ෂයේ ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

2025.09.30 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	2025 වර්ෂය සඳහා වෙන් කළ මුදල (රු.මි.)	2025.09.30 දක්වා වියදම් කළ මුදල (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
01.	ප්‍රාග්ධන වියදම්	7,334,000.00	2,014,893.00	27%
02.	පුනරාවර්තන වියදම්	589,000.00	383,553.00	65%
	එකතුව	7,923,000.00	2,398,446.00	-

2025.09.30 දිනට ආයතනයේ සංවර්ධන වැඩසටහන් වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය	වෙන් කළ මුදල (රු.මි.)	වැය කළ මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය
ඉන්දියානු ආධාර යටතේ සිදු කරනු ලබන නිවාස වැඩසටහන (නිවාස 4000)	3500.00	110.25	• නිවාස 14 ක වැඩ කටයුතු සිදු වෙමින් පවතී. • නිවාස 6 ක් සඳහා ජල සැපයුම සහ නිවාස 70 ක් සඳහා විදුලි පහසුකම් ලබා දී ඇත.
ඉන්දියානු ආධාර යටතේ සිදු කරනු ලබන නිවාස වැඩසටහන (නිවාස 10,000)		1722.2	• 100% සම්පූර්ණ නිවාස -ඒකක 110 • අත්තිවාරම් මට්ටම සම්පූර්ණ ඒකක- 119 • බිත්ති මට්ටම - ඒකක 229 • වහල මට්ටම - ඒකක 58 • වහලය සම්පූර්ණයි -ඒකක 134 • නිම කිරීමේ මට්ටම- ඒකක 373
වතු නිවාස වැඩසටහන (නව ජීවන නිවාස ව්‍යාපෘතිය 2020/2021)	767.00	204.56	• නිවාස ඉදිකිරීම් 397ක් සහ නිවාස ව්‍යාපෘති 09ක් සඳහා ජල සැපයුම ලබාදීමට අනුමැතිය ලබා දී ඇත. නිවාස ඒකක 61 ක් සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත.
යටිතල පහසුකම් සංවර්ධනය	500.00	111.73	• TVTC හි (තොණ්ඩමාන්

			වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය) සිසුන් 214 දෙනෙකු ලියාපදිංචි වී ඇත. • ජල සැපයුම් රැගෙන යාමේ ව්‍යාපෘති 13 ක් අවසන් කර ඇත. • විදුලි සැපයුම් රැගෙන යාමේ • ව්‍යාපෘතියක් අවසන් කර ඇත. • නැවත වහල ඉදිකිරීමේ ව්‍යාපෘති දෙකක් අවසන් කර ඇත. • මූලික ජංගම අයදුම්පත සූදානම්.
සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය	600.00	18.19	• ශ්‍රී ලංකා රජය සහ ඉන්දීය ජනරජය අතර අවබෝධතා ගිවිසුම 2025.01.16 දින ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේදී අත්සන් කරන ලදී. • ඌව පළාතේ පාසල් 7ක් සහ මධ්‍යම පළාතේ පාසල් 50ක් ඇතුළුව පාසල් 57ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. • ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.
ස්වභාවික ආපදා වලින් විපතට පත් වතු ප්‍රජාව සඳහා නිවාස ලබාදීම.	1300.00	57.19	• බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකක 50 ක් සඳහා අත්තිවාරම් මට්ටම (මුල් කණු)/බිත්ති මට්ටම /ස්ලැබ් සම්පූර්ණ කර ඇත. • ඉතිරි නිවාස ඒකක 227 ක වැඩ කටයුතු ආරම්භ කර නොමැත. • මාතර දිස්ත්‍රික්කයේ ආපදා නිවාස ඒකක 25 ක් සඳහා භූමි පිරිසිදු කිරීම, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දෙවන අනුමැතිය ලබා ගෙන ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදා නිවාස ඒකක 5 ක් සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබාගෙන ඇත.

2026 වර්ෂයේ ක්ෂේත්‍රය අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- **වතු නිවාස වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය වාර්ෂිකව අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘතියක් වේ. වාසස්ථාන සම්බන්ධයෙන් වැවිලි ප්‍රජාව මුහුණ දෙන දුෂ්කරතා මගහරවා අභිමානයකින් යුතුව ජීවත්වීමේ අයිතිය වැවිලි ප්‍රජාව වෙතද හිමි කරදීමේ අදිටනින්, වතු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි. 2026 වර්ෂයේදී 2025 සිදු කල ව්‍යාපෘති සම්බන්ධයෙන් ගෙවීම් කටයුතු අවසන් කිරීමට බලපොරොත්තු වේ.

- **වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

  මෙම ව්‍යාපෘතිය වාර්ෂිකව අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන ව්‍යාපෘතියක් වන අතර වැවිලි මානව සංවර්ධන භාරය / දිස්ත්‍රික් ලේකම් කාර්යාල / සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම (STMF) ඇතුළු වෙනත් බාහිර පාර්ශව හරහා අප වෙත ඉදිරිපත් කරන වතු ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය හා වෙනත් විශේෂ හඳුනාගන්නා ලද ව්‍යාපෘති යෝජනා, ලැබී ඇති ප්‍රතිපාදනද සැළකිල්ලට ගෙන 2026 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

- **සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා උපකරණ සැපයීම**

  මෙම ව්‍යාපෘතියට සමගාමීව සුහුරු පන්ති කාමර ස්ථාපිත කිරීමට නුවරඑළිය, මහනුවර හා බදුල්ල දිස්ත්‍රික්ක වල තෝරාගත් පාසල් වල ප්‍රතිසංස්කරණ කටයුතු ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන තුළින් සිදු කරන අතර, සුහුරු පන්ති කාමර පිහිටුවීම සඳහා උපකරණ සැපයීම ඉන්දියානු ප්‍රදානය හරහා සිදු කෙරේ. 2026 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කර මෙම ව්‍යාපෘතියට සමගාමීව ලබාදෙන සුහුරු පුවරු, ලැප්ටොප් පරිගණක, පුටු සහ මේස ලබාදීමට සැලසුම් කර ඇත.

- **ස්වභාවික විපත් වලින් අවතැන් වූ වතු ප්‍රජාව සඳහා නිවාස පහසුකම් ලබාදීම.**

  වතු ප්‍රජාව අතුරින් දීර්ඝ කාලයක් ආපදාවන්ගෙන් පීඩාවට පත් වූ අඩු ආදායම්ලාභී වතු ප්‍රජාව සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස්කිරීමේ අරමුණින් නිවාස ලබාදීමට 2026 වර්ෂයේ සැලසුම් කර ඇත. ඒ අනුව 2026 සහ 2027 වර්ෂයන්හිදී වතු පවුල් 1000ක් ආරක්ෂිතව නිවාස වල නැවත පදිංචි කරවීමට බලාපොරොත්තු වේ.

- **ඉන්දියානු 10,000 නිවාස වැඩසටහන (ඉන්දියානු ප්‍රදාන සහ දේශීය අරමුදල) යටතේ නිවාස ඉදි කිරීම**

  මෙම ව්‍යාපෘතිය යටතේ 2026 වර්ෂයේ නිවාස 2000ක් ජල සහ විදුලි පහසුකම් සහිතව සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.

- **ඉන්දියානු 4,000 නිවාස වැඩසටහන (ඉන්දියානු ප්‍රදාන සහ දේශීය අරමුදල) යටතේ නිවාස ඉදි කිරීම**

  මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකර අවසන් කිරීමට ඉතිරිව ඇති නිවාස 14ක් 2026 වර්ෂයේ ජල සහ විදුලි පහසුකම් සහිතව සම්පූර්ණ කිරීමට සැලසුම්කර ඇත.

- **ඔප්පු සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම**

  නව ගම්මාන සංවර්ධන අධිකාරිය විසින් වැවිලි අංශයේ කුටුම්භ සඳහා නීත්‍යානුකූල ඉඩම් අයිතිය ලබා දීම.

- **ජලජීවී වගා සංවර්ධනය තුළින් වතු ප්‍රජාවන්ගේ පෝෂණ වැඩිදියුණු කිරීම සහ ආදායම් උත්පාදනය**
- **"එක්ව හෙට ගොඩනැගීම" යටතේ ශ්‍රී ලංකාවේ සමජාතීය ප්‍රජාවන්හි ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම**
- **ආංශික විෂමතා පියවීම සඳහා ජීවනෝපාය සංවර්ධනය**
- **වතු පාසල්වල සහ තරුණයින් සඳහා තෘතියික අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සැලසීම**
- **වැවිලි අංශයේ සංචාරක සංවර්ධනය තුළින් ආදායම් උත්පාදනය**

වැවිලි මානව සංවර්ධන භාරය (PHDT)

දැක්ම

වතුකරයේ ජීවන තත්ත්වය අඛණ්ඩව ඉහළ නැංවීම සඳහා තිරසාර සංවර්ධන වැඩසටහන් සම්පාදනය කරමින් විශිෂ්ටත්වය සඳහා විශ්වාස කරන ප්‍රමුඛ මානව සංවර්ධන සංවිධානය වීම

මෙහෙවර

- වතුකරයට සහ ඒ අවට ප්‍රදේශවලට ප්‍රයෝජනවත් වන ඒකාබද්ධ සේවා සැපයීම
- සමාජ ආර්ථික හා අධ්‍යාත්මික යහපැවැත්ම දියුණු කිරීම
- දැනුම සහ ආත්ම විශ්වාසය දියුණු කිරීම
- වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂිත මානයන් දියුණු කිරීම
- ප්‍රතිලාභීන්ගේ කුසලතා සහ හැකියාවන් දියුණු කිරීම
- අංශයේ ඵලදායිතාව දියුණු කිරීම

ක්‍රියාත්මක සැලැස්මට අනුව සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය (2025.09.30 දිනට)

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)
යටිතල පහසුකම්	71.35	25.54	25.54	-	5%
ඉන්දියානු නිවාස 10000 වැඩසටහන	237.89	22.23	22.23	-	5%
වතු නිවාස වැඩසටහන	750.38	204.32	204.32	-	10%

මූල්‍ය ප්‍රගතිය (2025.09.30 දිනට)

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	88.16	72.99	72.99	83%	-
ප්‍රාග්ධන වියදම් (2025)	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන	971.46	179.10	179.10	18%	-
පුනරාවර්තන වියදම් (2025)	මෙම ආයතනය විසින් සිදු කරන ලද ව්‍යාපෘති සඳහා ගෙවනු ලබන කළමනාකරණ වියදම 5%කි. (මෙම වියදම් ප්‍රාග්ධන වියදම් තුළ අන්තර්ගත කර ඇත.)	48.57	8.96	8.96	-	-

2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉන්දියානු නිවාස 10,000 වැඩසටහන යටතේ 2026 වර්ෂයේ ඉදිකිරිමට අපේක්ෂිත නිවාස යටිතල පහසුකම් සහිතව ලබාදීම ඇතුළු අවශ්‍යතාවය පදනම් කරගෙන වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට නියමිතය. මේ යටතේ ජලජීවී වගා සංවර්ධනය තුළින් වතු ප්‍රජාවන්ගේ පෝෂණ වැඩිදියුණු කිරීම සහ ආදායම් උත්පාදනයට කටයුතු කිරීම සහ "එක්ව හෙට ගොඩනැගීම" යටතේ ශ්‍රී ලංකාවේ වතු ප්‍රජාවන්හි ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වේ.

සෞම්‍යමූර්ති තොණ්ඩමාන් අනුස්මරණ පදනම (STMF)

දැක්ම

ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞන්දර්යාත්මක වෘත්තීය සහ භෞතික සංවර්ධනය නඟා සිටුවීම සහ ප්‍රවර්ධනය කිරීම, විශේෂයෙන්ම සේවය නොලබන, සහ වරප්‍රසාද ලත් ග්‍රාමීය ප්‍රජාවට ස්වයං රැකියා අවස්ථා ලබා දීම.

මෙහෙවර

සියලුම ශ්‍රී ලාංකීය ප්‍රජාවන් අතර සාමය, සුහදතාවය, අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ මෙම ක්‍රියාවලියේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයන් පුළුල් ලෙස යෙදීමෙන් සහ භාවිතා කිරීමෙන් ග්‍රාමීය ප්‍රජාවගේ විස්තීර්ණ, සම්පූර්ණ සහ සමස්ත සමාජ ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම.

ආයතනයේ අරමුණු

- ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාව අතර සාමය, හොඳහිත, අවබෝධය සහ සහයෝගීතාවය ප්‍රවර්ධන කිරීම.
- ජාතීන් අතර එකමුතුකම සහ සමාජ සංකලනය ප්‍රවර්ධනය කිරීම හා ධෛර්යමත් කිරීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික, අධ්‍යාපනික, වෘත්තීය, සමාජ, දේශපාලන,ආර්ථික,සෞන්දර්යාත්මක හා භෞතික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික,දේශපාලන,අධ්‍යාපනික,සංස්කෘතික,සාමාජයීය හා සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල දැනීම හා අවබෝධය නංවාලීම.
- ආර්ථික වශයෙන් හා සාමජයීය වශයෙන් අවාසියට ලක් වූ යම් තැනැත්තකුගේ වාසස්ථාන වැඩිදියුණු කි උචිත බැංකුවල හා මූල්‍ය ආයතනවල ආයෝජනය කිරීමට ශ්‍රී ලාංකිකයන් ධෛර්යමත් කිරීම සහ යටිතල පහසුකම් සැපයීම ද ඇතුළුව ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.
- පදනමේ පරමාර්ථ කිසිවකට සමාන යම් කටයුත්තක නිරතව සිටින යම් තැනැත්තෙකුට මූල්‍ය හෝ වෙනත් ආධාර සැපයීම.
- ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික සහ සාමාජයීය ක්ෂේත්‍ර පිළිබඳව, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලාංකිකයන්ගේ ක්‍රීඩා හා විනෝදාංශ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම.

2025.09.30 දින ක්‍රියාත්මක ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	අක්මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)
වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය	31.68	15.31	-	-	75%

2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මි.)	2025.09.30 දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	0.53	0.53	0.53	-	-
ප්‍රාග්ධන වියදම් (2025)	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන 135-01-16-01-2201	31.15	14.78	14.78	75%	-
පුනරාවර්තන වියදම් (2025)	සේවක වැටුප් හා අතිකාල දීමනා	155.80	104.16	104.16	67%	0.02
	අනෙකුත්	15	14.98	14.98	100%	0.99

2025 වර්ෂයේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

ඉදිරි වසර තුළ, STMF ආයතනය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සමස්ත ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට නියමිතය. පිරිමි සහ ගැහැණු ළමුන් සඳහා නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය කිරීම, ශ්‍රවණාගාරය වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීම මෙයට ඇතුළත් වේ.

ඊට අමතරව, ජල ප්‍රවාහය වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා ජලාපවහන පද්ධතියක් ඉදිකරනු ලැබේ. ප්‍රජාශක්ති මධ්‍යස්ථාන කිහිපයක අවශ්‍යතාවයන් පදනම් කරගෙන ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය.

විනෝදාත්මක යටිතල පහසුකම් සම්බන්ධයෙන් ගත් කල, ෆුට්සල් ඒකකයක් (Futsal) සහ ගෘහස්ථ ක්‍රීඩා ඒකකයක් ස්ථාපිත කෙරේ. රැඳවුම් බිත්තිය ප්‍රතිසංස්කරණය කිරීම, වාහන නැවැත්වීමේ ස්ථාන වැඩිදියුණු කිරීම අනෙකුත් වැදගත් ක්‍රියාකාරකම් අතර වේ. තවද, නඩත්තු කටයුතු සඳහා ජල කාන්දුවීම් අලුත්වැඩියා කිරීම, ටැංකි ප්‍රතිසංස්කරණය කිරීම සහ අවශ්‍ය කාර්යාල සහ යන්ත්‍රෝපකරණ ද්‍රව්‍ය ලබා ගැනීම ඇතුළත් වේ. සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට හිතකර ඉගෙනුම් පරිසරයක් ඇති කිරීම අරමුණු කර ගෙන මෙම ව්‍යාපෘති 2026 දී ආරම්භ කිරීමට නියමිතය.

වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය

දැක්ම

වැව්ලි ප්‍රජාව බලගැන්වීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් වැව්ලි ප්‍රජාවගේ සමාජ හා ආර්ථිකය ගොඩනැංවීම සඳහා සියලු පාර්ශවකරුවන් එක් කරන වේදිකාවක් වෙමින් අවශ්‍ය ප්‍රතිපත්ති හා සැළසුම් සකස්කොට ක්‍රියාත්මක කිරීම.

අරමුණු

- වැව්ලි ප්‍රජාවගේ සමාජ පිළිගැනීම සහතික කිරීම.
- ආර්ථික වශයෙන් තිරසාර වැව්ලි ප්‍රජාවක් නිර්මාණය කිරීම
- ප්‍රජාවට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා NEVIDA අධිකාරියෙහි හි ධාරිතාව සහ කාර්යයන් ශක්තිමත් කිරීම

ක්‍රියාත්මක සැලැස්මටඅනුව සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය (2025.09.30 දිනට)

ව්‍යාපෘතිය	අනුමත ප්‍රතිපාදන (රු.මි.)	සංශෝධිත ප්‍රතිපාදන	අක් මුදල් ලැබීම් (රු.මි.)	වියදම (රු.මි.)	අතැති බිල් (රු.මි.)	භෞතික ප්‍රගතිය (%)	වෙනත්
වතු ප්‍රජාව සඳහා ඔප්පු සහතික ප්‍රදානය කිරීමේ වැඩසටහන	25 (Ministry funding)	15	ඉල්ලීම් කර ඇත. (ප්‍රතිපාදන ලැබීම් 7.47)	-	-	15%	ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමෙන් පසු මිලියන 10 ක් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී.
වතුකරයේ තනි නිවාස සහ ප්‍රජාවන්ගේ නෛතික අයිතිය සඳහා ඩිජිටල්කරණය කළ දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම	09 (Ministry funding)	06	ඉල්ලීම් කර ඇත. (ප්‍රතිපාදන ලැබීම් 0.104)	0.104	-	45%	මිලියන 3ක් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී.
වතුකර ප්‍රදේශවලට පොදු පහසුකම් ළඟා කර ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම	09 (Ministry funding)	09	ඉල්ලීම් කර ඇත. (ප්‍රතිපාදන ලැබීම 9)	5.5	-	8%	-
වතුකරයට ඉඩම් සහ නිවාස ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම	3.5 (Ministry funding)	0.5	-	-	-	10%	මිලියන 3ක් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී
වතුකරයේ ජීවනෝපාය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම	09 (Ministry funding)	7.5	-	-	2.1	15%	මිලියන 1.5ක් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී

වතුකරයේ ආදර්ශ ගම්මානයක් සංවර්ධනය කිරීම	9.5 (Ministry funding)	9.5	-	-	-	10%	-
වතු ප්‍රජාවගේ මූලික සේවා (ජංගම සේවා) තහවුරු කිරීම	05 (Ministry funding)	2.5	-	-	2.5	45%	මිලියන 2.5ක් අමාත්‍යාංශයට ආපසු ලබා දෙන ලදී
	සටහන : - සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ අමාත්‍යාංශ වැය ශීර්ෂය මඟිනි.						

මූල්‍ය ප්‍රගතිය (**2025.09.30** දිනට)

විස්තරය		අනුමත ප්‍රතිපාදන (රු.මි.)	**2025.09.30** දිනට මූල්‍ය ඉලක්කය (රු.මි.)	අක් මුදල් ලැබීම් (රු.මි.)	ප්‍රගතිය	අතැති බිල්පත් (රු.මි.)
ප්‍රාග්ධන වියදම්	2024 වසරේ අතැති බිල් පියවීමට වෙන් කළ ප්‍රතිපාදන	-	-	-	-	-
ප්‍රාග්ධන වියදම් (2025)	2025 වසරේ ක්‍රියාත්මක සැලැස්මේ ව්‍යාපෘති සඳහා වෙන් කළ ප්‍රතිපාදන 135-01-16-01-2201	05	-	-	N/A	-
පුනරාවර්තන වියදම් (2025)	135-01-16-01-1503 (වැටුප්)	13	9.75	8.70	89%	-
	135-01-16-01-1509 (වෙනත් පුනරාවර්තන වියදම්)	12	9.0	4.45	49.44%	-

2026 වර්ෂයේදී ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- වතු අංශයේ නිවාස සඳහා නීත්‍යානුකූල ඉඩම් අයිතිය ලබා දීමට ඔප්පු 2000 ක් ලබාදීම.
- වතු අංශයේ නිවාස සහ ඉඩම් පරිහරණ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- වැවිලි ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය මගින් අංශ විෂමතා මඟ හැරීමට තවදුරටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- වතුකරයේ පාසල් තුළ සහ තරුණයින් සඳහා තෘතියික අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සැලසීම මඟින් රැකියා ගත කිරීම.
- වැවිලි අංශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය තුළින් වතු ප්‍රජාවගේ නව ආදායම් උත්පාදන අවස්ථා ඉහළ නැංවීම.
- වතු ප්‍රදේශයන්හි ජල මූලාශ්‍ර පරිසරය සුරක්ෂිත කිරීම සහ තිරසාර සම්පත් කළමනාකරණයට පියවර ගැනීම.

ඉන්දියානු ආධාර යටතේ ඉදිවන නිවාස ව්‍යාපෘතිය

මෙය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර, පළමු අදියර (Stage 01) හා දෙවන අදියර (Stage 02) යටතේ නිවාස ඒකක 4,000 ක් තෙවන අදියර යටතේ නිවාස ඒකක 10,000 ක් ලබාදීම.

ව්‍යාපෘතියේ නම	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘතිය (නිවාස සහ යටිතල පහසුකම්)	භෞතික ප්‍රගතිය		මූල්‍ය ප්‍රගතිය (2025.01.01 සිට 2025.09.30 දක්වා)
			සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව (2025.01.01 සිට 2025.09.30 දක්වා)	ක්‍රියාත්මක වෙමින් පවතින නිවාස සංඛ්‍යාව	
ඉන්දියානු ආධාර මත ඉදිවන නිවාස 4000 වැඩසටහන	4,000	නිවාස	06	14	රු.මිලි 33.58
		යටිතල පහසුකම්	06	ජලය-105	*
ඉන්දියානු ආධාර මත ඉදිවන නිවාස 10,000 වැඩසටහන	1,300	නිවාස	52	1,248	රු.මිලි 1688.62
		යටිතල පහසුකම්	විදුලිය-353 ජලය-24	විදුලිය-947 ජලය-1276	*
වෙනත්	-	-	-	-	-

*සටහන: 2025 වර්ෂයේදී ඉන්දියානු නිවාස 4,000 හා 10,000 යන ව්‍යාපෘති වැඩසටහන් දෙකෙහිම යටිතල පහසුකම් සඳහා ගෙවීම් කරනු ලබන්නේ එකම වැය ශීර්ෂයක් යටතේ වන අතර 2025.01.01 සිට 2025.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 110.24 වේ.

- ඉන්දියානු නිවාස ව්‍යාපෘති වලට අදාලව 2025 වර්ෂයේ කාල පරිච්ඡේදය තුළ ඉන්දියානු නිවාස ව්‍යාපෘති යටතේ ඇල්කඩුව හා සෙලගම නිවාස ව්‍යාපෘති ප්‍රතිලාභීන් වෙත ලබාදීම් සඳහා අවශ්‍ය කටයුතු සැළසුම් කෙරුණි.
- නිවාස 4,700ක නිවාස හිමිකම ලබා දීමේ සහතිකපත් ප්‍රධානෝත්සවය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරුණි.

Ministry of Plantation and Community Infrastructure
11th Floor, Sethsiripaya Stage II,
Baththaramulla.